# යොහන් සුබ අස්න

සුබ අස්න සෙසු ලියවිලි තුනට වඩා වෙනස් මුහුණුවරකින් ලියැවී ඇති මෙම සුබ අස්න යේසුස්වහන්සේගේ ළබැඳි ගෝලයකු වූ යොහන් විසින් ලියන ලද්දකි. ක්‍රි.ව. 90-95 දී පමණ මෙය ලියන ලදැයි සැලකේ.

යේසුස්වහන්සේ සැබෑ දෙවියන්වහන්සේ සේම සැබෑ මනුෂ්‍යයාද වග තහවුරු කැරෙමින්, එතුමාණන් ලොව ගැලැවුම්කරුවාණන් බවට සැවොම අදහා ගත යුතු බැව් මින් අවධාරණය කැරේ. දේව පුත්‍රයාණන් කෙරේ ඇදහීම ජීවනය බැව් යොහන් කියයි..

## පරිච්ඡේද බෙදීම්


| | |
|---|---|
| 1. හැඳින්වීම | (1:1 - 1:51) |
| 2. අනුහස් ලකුණු හතක් | (2:1 - 12:50) |
| 3. ඉහළ මාලයේදී | (13:1 - 17:26) |
| 4. අත්අඩංගුව හා කුරුසපත් වීම | (18:1 - 19:37) |
| 5. භූමදානය හා මරණින් නැගිටීම | (19:38 - 20:21) |
| 6. කරුණු පහදා දීම | (21:1 - 21:25) |

# 1 ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම

1 කිසිවක් හෝ කිසිවකු හෝ පවතින්නට පෙර දේව වචනය වූ ක්‍රිස්තුස්වහන්සේ, දෙවියන්වහන්සේ
සමඟ විසූ සේක. ක්‍රිස්තුස්වහන්සේ හා දෙවියන්වහන්සේ ඒකත්වයකි.
2 මුලාරම්භයේදී එතුමාණෝ දෙවියන්වහන්සේ සමඟ සිට,
3 එලොව මෙලොව ඇති සියල්ල මැවූ සේක. එතුමන් අතින් නො මැවුණු කිසිවක් ඇත්තේම නැත.
4 ජීවනයේ උල්පත එතුමාණෝය. ඒ ජීවනය සකල මිනිස් වර්ගයටම අලෝකයයි.
5 අන්ධකාරයෙහි බැබැළෙන ඒ ජීවනාලෝකය යටපත් කිරීමට අන්ධකාරය අපොහොසත්ය.
6 දෙවියන්වහන්සේ වෙතින් පැමිණි යොහාන් නම් පණිවුඩකරුවෙක් විය.
7 සියලු දෙනා ක්‍රිස්තු ආලෝකය කෙරෙහි ඇදහීමට යොමු කරවනු පිණිස සාක්ෂි දෙන්නට පැමිණි
8 යොහන් ඒ ආලෝකය නො ව, ආලෝකයේ සාක්ෂිකරුය.
9 සකල ජනතාවගේ ජීවිත ආලෝක කරන සත්‍යාලෝකය වූ ක්‍රිස්තුස්වහන්සේ ලොවට බිහි වූ සේක.
10 ලොව මැවුම්කරුවාණන් වුවද එතුමාණන් මෙලොවට ආ කල, ලෝකයා එතුමාණන් හැඳින ගත්තේ
නැත.
11 එතුමාණන් ස්වකීය දේශයට පැමිණි නමුත් දේශවාසීන් වූ යුදෙව්වෝ පවා එතුමාණන් නො
පිළිගත්හ.
12 එසේ වුවත් එතුමාණන් පිළිගත් සියල්ලනට, එතුමාණන්ගේ නාමය අදහාගත් අයට එතුමාණෝ
දේව දරුකමේ වරම දුන් සේක.
13 එසේ අදහා ගන්නා අය ලේ උරුමයෙන්, කායික සබඳතාවකින් හෝ මිනිස් ක්‍රියාවලියකින් හෝ නො
ව, දෙවියන්වහන්සේගෙන් වූ ආත්මික පුනරුත්පාදයක් ලබති.
14 දේව වචනය වූ ක්‍රිස්තුස්වහන්සේ මිනිසත් බව ගෙන දේව දයාවෙන් හා සත්‍යයෙන් පරිපූර්ණව
යේසුස් යන නමින් අප අතර විසූ සේක. ස්වර්ගික පියාණන් නියෝජන කරමින් පැමිණි එකම දෙව්
පුතණුවන්ගේ තේජෝමහිමය එතුමාණන් වෙතින් අපි දුටුමු.
15 යොහන් එතුමන් ගැන සාක්ෂි දරමින්, “මට ඉහතින් සිටි බැවින් මට වඩා ගරු කටයුතු කෙනකු
මට පසුව එති’යි මා කීවේ මෙතුමාණන් ගැනයැ”යි ප්‍රසිද්ධ කළේය.
16 එතුමාණන්ගේ දේව දයාවේ පිරිපුන්කම හේතුකොට අපි එකපිට එක ආශිර්වාද ලැබීමු.
17 මෝසස් මඟින් ලැබුණේ දහම් නීති සංග්‍රයක් පමණි. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දේව දයාවත්,
සත්‍යයත් ගෙන ආ සේක.
18 කිසිවෙක්, කිසිකලෙක, දෙවියන්වහන්සේ දැක නැත. එහෙත් පියාණන්වහන්සේගේ හද බැඳි එකම
දේව පුත්‍රයාණෝම පියාණන්වහන්සේ හඳුන්වා දුන් සේක.

## යොහන්ගේ සාක්ෂිය

19 "ඔබ කවරෙක්දැ"යි යොහන්ගෙන් ප්‍රශ්න කරනු පිණිස යෙරුසලම්හි යුදා නායකයෝ ලෙවීවරුන් හා පූජකයින් කිහිප දෙනකු ඔහු වෙත යැවූ කල ඔහු සාක්ෂි දරමින්,

20 "මම ක්‍රිස්තුස්වහන්සේ නො වෙමි"යි නො පැකිළ සෘජුව ප්‍රකාශ කළේය.

21 "එසේනම් ඔබ කවුරුද? එළියාදැ"යි ඔවුහු ඇසූහ. "නැතැ"යි යොහන් පිළිතුරු දුන් කල, "ඔබ දිවැස්වරයාදැ"යි ඔවුහු ඇසූහ. ඔහු ඊටද, "නැතැ"යි කීවේය.

22 ඔවුහු යළිත් ප්‍රශ්ණ කරමින්, "එසේම නම් ඔබ කවුරුද? අප එවූ අයට අප උත්තරයක් ගෙන යා යුතුයි. ඉතින් ඔබ කියන්නේ ඔබ කවුරුන්ය කියාදැ"යි ඇසූහ.

23 යොහන් කරුණු පහදමින් "යෙසායා දිවැසිවරයා පෙර කී අනාවැකිය ලෙස, සකල සත්වයාගේ ස්වාමියාණන් වන ක්‍රිස්තුස්වහන්ගේ පෙරමග සකසන්නට පාළුකරයෙන් ආ හොරණෑ හඬ මමයැ"යි කිවේය.

24 එවිට පරිසිවරුන් විසින් එවනු ලැබූ අය,

25 ඔහු අමතමින්, "හොඳයි ක්‍රිස්තුස්වහන්සේවත්, එලියාවත්, දිවැසිවරයාවත් නො වේ නම්, බව්තීස්ම කරන්නට ඔබට ඇති අයිතිය කුමක්දැ"යි ඇසූහ. යොහන් පිළිතුරු දෙමින්,

26 "මා බව්තීස්ම කරන්නේ වතුරිනි, එහෙත් උත්තම බව්තීස්මකරු සිටින්නේ ඔබ අතරෙයි. ඔබ එතුමන් හඳුනන්නේ නැත.

27 මට පසුව එන තැනැත්තා එතුමයි. එතුමාණන් කොතරම් උතුම් කෙනෙක්ද කියතොත් එතුමාණන්ගේ පා දූලි සිප ගන්නට තරම්වත් මා වටින්නේ නැතැ"යි පැවැසිය.

28 මේ සියල්ල සිදුවූයේ යොහන් බව්තීස්ම කරමින් සිටි තැන, එනම් යොර්දාන් නදියෙන් එතෙර පිහිටි බෙතානියේදීය.

## දෙවියන්වහන්සේගේ ශාන්ති කර්මය

29 පසුදා යේසුස්වහන්සේ තමන් දෙසට එනු දුටු යොහන්, "මෙන්න ලෝ දනන් සසර දුකින් හෙවත් පවින් මුදවන දෙවියන්වහන්සේගේ ශාන්ති කර්මය වූ බැටළු පැටවාණෝ,

30 මට ඉහතින් සිටි බැවින් මට වඩා ගරු කටයුතු කෙනෙක් මට පසුව එතැයි මා කීවේ මෙතුමාණන් ගැනයි.

31 මා මෙතුමාණන් හැඳින සිටියේ නැහැ. එහෙත් මා මෙසේ වතුරින් බව්තීස්ම කරමින් ආවේ, ඉශ්‍රායෙල් ජනතාවට මෙතුමාණන් හඳුන්වා දීමටයැ"යි පැවැසිය.

32 යොහන් සිය සාක්ෂිය දක්වමින්, "ශුද්ධාත්මයාණන්වහන්සේ ස්වර්ගයේ සිට පරෙවි වෙසින් බැස මෙතුමන් මත වැඩ වසනවා මම දිටිමි.

33 කලින් මා මෙතුමන් දැන නොසිටි නමුත්, වතුරින් බව්තීස්ම සිදුකරන්නට මා එවූ දෙවියන්වහන්සේම මට කථා කොට, ශුද්ධාත්මයාණන් යමකු වෙත බැස එනවාද, හෙතෙම ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම කරන තැනැත්තා වන්නේයැ'යි මට උපදෙස් දුන් සේක.

34 ඒ දේ දැන් මා දුටු නිසා මෙතුමාණන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවට සාක්ෂි දරමි"යි පැවැසීය.

## මෙසියස්වහන්සේ

35 පසු දින සිය ගෝලයින් දෙදෙනකු සමඟ සිටි යොහන්,
36 යේසුස්වහන්සේ මඟ යනු දැක, "අන්න! දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ"යි කීවෙන්,
37 ගෝලයෝ දෙදෙනා ඒ අසා යේසුස්වහන්සේ පසු පස ගියහ.
38 ඔවුන් තමන් පසු පස එනු දුටු යේසුස්වහන්සේ, "ඔබට මොනවද ඕනෑ"යි ඇසූ සේක. ඔවුහුද, "රබ්බි ඔබතුමා සිටින්නේ කොහේද"යි ඇසූහ. (රබ්බි යන්නෙහි අර්ථය ආචාර්යතුමනි යනුයි.)
39 "ඇවිත් බලන්නැ"යි අවසර ලැබුණෙත් සවස හතරට පමණ යේසුස්වහන්සේ වෙසෙන තැනට පැමිණි ඔවුහු, එදින එතුමන් හා ගත කළහ.
40 ඒ දෙදෙනාගෙන් කෙනෙක් නම් සීමොන් පේතෘස්ගේ සෝයුරු අන්දෘය.
41 අන්දෘ වහා සිය සෝයුරු සීමොන් සොයා ගොස්, "අපට මෙසියස්වහන්සේ හමුවුනා"යි පවසා,
42 යේසුස්වහන්සේ වෙත සීමොන් කැඳවා ගෙන ආවේය. යේසුස්වහන්සේ ඔහු දෙස බලා, "ඔබ යොහන්ගේ පුත්‍ර සීමොන්ය. මෙතැන් පටන් ඔබේ නම පේතෘස් වන්නේ යැ"යි පැවැසූ සේක. (පේතෘස් යන්නෙහි අර්ථය පර්වතය යනුයි)
43 පසුදා යේසුස්වහන්සේ ගලීලයට යෑමට ඉටා ගත් සේක. එතුමා පිලිප් හමුවී, "මා සමඟ එන්නැ"යි කැඳවූ සේක.
44 පිලිප් පේතෘස් හා අන්දෘගේ ගම වන බෙත්සයිදා වැසියෙකි.
45 පිලිප් උදක්ම නතානියෙල් සොයා ගොස්, "මතකද? අර මෝසස්ගේ නීති සංග්‍රහයේ සඳහන් වුණු, අර දිවැසිවරුන්ගේ අනාවැකිවලින් කියැවුනු තැනැන්වහන්සේ, එතුමාණන් අපට හමු වුනා, එතුමා නාසරෙත්හි යෝසප්ගේ පුත්‍ර යේසුස්වහන්සේයැ"යි දැනුම් දුන්නේය.
46 "නාසරෙත් !"යි ප්‍රතිරාවය කළ නතානියෙල්, "කිසි වැදගැම්මකට ඇති කෙනෙක් එහෙන් ඒ දැ"යි ගත් කටටම ඇසීය. "කෙසේ වෙතත් ගොසින් බලන්නැ"යි පිලිප් පැවැසීය.
47 නතානියෙල් තමන් වෙත එනු දුටු යේසුස්වහන්සේ, "මෙන්න හොර බොරු නැති නියම ඉශ්‍රායෙල් පුත්‍රයෙක්"යැයි පැවසූ සේක.
48 "ඔබතුමා මා ගැන දන්නේ කෙසේදැ"යි ඔහු ප්‍රශ්න කළෙන්, යේසුස්වහන්සේ ඔහුට පිළිතුරු දෙමින්, "ඔබට පිලිප් මුණ ගැසෙන්නට කලින් ඔබ අත්තික්කා ගස යට සිටිනවා මා දුටුවායැ"යි කී සේක.
49 "ගුරු දේවයිනි, ඔබතුමා මහෝත්තම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය: ඉශ්‍රායෙල්හි මහ රජ්ජුරුවෝයැ"යි එවිට නතානියෙල් පැවැසීය.
50 යේසුස්වහන්සේ ඔහු අමතමින්, "ඔබ අත්තික්කා ගස යටදී දුටුවායැයි කීමෙන් මා කෙරෙහි විශ්වාසය තැබුවාද? මීට වඩා අපූරු දේවල් ඔබට දකින්නට ලැබේවි.
51 සත්තකින්ම මා ඔබට කියන්නේ දෙව්ලොව දොරටු ඇරී, දේව දූතයින් මනුෂ්‍ය-පුත්‍රයාණන් වෙත නඟින බසින අයුරුත් ඔබට දකින්නට ලැබෙන බවයැ"යි පැවැසූ සේක.

# 2

## ජලය වයින් කළ හාස්කම

1 දෙදිනකට පසු ගලිලයේ කානාහි විවාහ මංගලයක් විය.

2 යේසුස්වහන්සේගේ මෑණියෝද එහි වූහ. යේසුස්වහන්සේ හා එතුමන්ගේ ගෝලයෝ මංගල උත්සවයට ඇරැයුම් ලද්දෝය.

3 තිබූ වයින්, සංග්‍රහය අතරතුරේ හිඟව ගියෙන්, "වයින් ඉවර වෙළා"යි මෑණියෝ යේසුස්වහන්සේට දැනුම් දුන්හ.

4 "මැතිණියෙනි, ඉතින් මට කියන්නේ මොකද? මගේ ප්‍රකාශ වීමේ මොහොත මෙය නො වේයැ"යි යේසුස්වහන්සේ පිළිවදන් දුන් සේක.

5 එවිට එතුමන්ගේ මෑණියෝ උත්සව ගෙදර සේවකයින් වෙත ගොස්, "එතුමන් කියන ඕනෑම දෙයක් කරන්නැ"යි පැවැසූහ.

6 යුදා චාරිත්‍රයක් වන පවිත්‍රවීම සඳහා වූ ලිටර් 100 ක් පමණ අල්ලන ගල් භාජන හයක් එතැන තබා තිබිණි.

7 "භාජනවලට වතුර පුරවන්නැ"යි යේසුස්වහන්සේ සේවකයින්ට අණ කළෙන්, ඔවුහු මුවවිට දක්වාම ඒවා ජලයෙන් පිරවූහ.

8 "දැන් මෙයින් ස්වල්පයක් ගෙන ගොස් උත්සව සංවිධායකට දෙන්නැ"යි එතුමන් කී කල, ඔවුහු එසේ කළහ.

9 සංවිධායක තැන වයින් බවට පත් වතුර දිවගා බලා, ඒවා කොතැනින් කෙසේ ලැබුණේදැයි සේවකයින් මිස ඔහු නොදත් හෙයින් මනාලයා අමතා,

10 "මේ වයින් නම් හරි අගෙයි. සිරිත නම් පළමු කොට හොඳ වයින්වලින් සංග්‍රහකොට, මිනිසුන් පදනමට බිවූ පසු බාල වයින් දීමයි. එහෙත් ඔබ නම් ඉස්තරම් ඒවා එළියට ගෙන ඇත්තේ දැනුයි" කීවේය.

11 යේසුස්වහන්සේ ගලිලයේ කානාහිදී පෑ මෙම අනුහස් ලකුණ ස්වකීය තේජෝමහිමය ප්‍රසිද්ධියේ පල කළ මුල් අවස්ථාව විය. මේ නිසා යේසුස්වහන්සේගේ ගෝලයෝද එතුමාණන් කෙරෙහි විශ්වාසය තැබූහ.

12 ඉන්පසු යේසුස්වහන්සේ සිය මෑණියන්ද සොහොයුරන්ද ගෝලයන්ද සමඟ කපර්ණවුම් නුවරට පැමිණ ස්වල්ප දිනක් එහි නැවතී සිටි සේක.

## දෙව් මැදුරේ පෙරැළිය

13 යුදා පූජෝත්සවයක් වූ පාස්කුව ළංව තිබූ බැවින්, යේසුස්වහන්සේ යෙරුසලමට පැමිණි සේක.

14 පුද පූජා සඳහා ගනු ලබන ගව, බැටළු, පරෙවි ආදි සතුන් තබාගත් වෙළඳුන්ද පඬුරු සඳහා විනිමය මාරු කරන්නන්ද දෙව් මැදුරු මළුවෙහි ගනු දෙනු කරමින් සිටිනු දුටු එතුමාණෝ,

15 ලණුවලින් කසයක් තනා, සියලුම ගවයින් හා බැටළුවන් පිටතට පන්නා දැමූ සේක. අනතුරුව විනිමය මාරු කරන්නන්ගේ කාසි විසුරුවා, ඔවුන්ගේ මේසද පෙරළා දමා,

16 පරෙවි වෙළඳුන් වෙත හැරුණු එතුමාණෝ, “මේවා මෙතැනින් අරන් පලයල්ලා, මා පිය දෙවි මැදුර වෙළෙඳ පොලක් නො කරල්ලා”යි ගුගුල සේක.

17 එවිට “ඔබගේ ගෘහය කෙරෙහි ඇති භක්ත්‍යාදරයෙන් මා ඇවිලේ” යන ශුද්ධ ලියවිලි පාඨය එතුමන්ගේ ගෝලයින්ට සිහිපත් විණි.

18 “ඔබ ඔවුන් පන්නා දැමුවේ කවර බලයක් පිටද? එය දේව වරමකින් කළ දෙයක් නම් ලකුණක් පෙන්වා ඒ වග ඔප්පු කරන්නැ”යි කියමින් යුදෙව් නායකයෝ එතුමන්ට අභියෝග කළහ.

19 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “හොඳයි, මේ දෙවි මැදුර කඩා දැමුවොත්, මම එය තුන් දවසකින් නැවත ගොඩ නගන්නෙමි”යි පැවැසූ සේක.

20 “මොනවා!”යි විශ්මය පෑ ඔවුහු, “ගොඩ නගන්ට 46 වසරක් ගතවුණු මේ දෙවි මැදුර තුන් දවසකින් ඔබ කොහොම ගොඩ නගන්නදැ”යි ඇසූහ.

21 එනමුත් එතුමාණන් අදහස් කළ දෙවි මැදුර වූයේ, එතුමන්ගේම ශරීරයයි.

22 යේසුස්වහන්සේ මිය ගොස් තෙදිනකින් යළි නැගිටි පසු, එතුමන්ගේ ගෝලයෝ මේ කාරණය සිහිකර ශුද්ධ ලියවිල්ලද එතුමාණන්ගේ වචනද විශ්වාස කළෝය.

23 පාස්කු උත්සව දින යෙරුසලමේදී යේසුස්වහන්සේ දැක්වූ අනුහස් ලකුණු දුටු බොහෝ දෙනෙක්, එතුමාණන් සැබැවින්ම තම ගැලවුම්කරුවාණන් බවට පිළිගත්හ.

24 එහෙත් ඔවුන් කවුරුන්දැයි හොඳින්ම දත් බැවින් යේසුස්වහන්සේ ඔවුන් කෙරෙහි විශ්වාසය තැබුවේ නැත.

25 මිනිසාගේ ඇතුළාන්තය හොඳින්ම දත් හෙයින් කෙනකු ගැන තවත් කෙනකුගේ සහතිකයක් එතුමාණන්ට අවශ්‍ය නො විණි.

# 3 නැවත ඉපදීම

1 පරිසිවරයකු වූ නිකදේමුස් නම් යුදෙව් ජන නායකයෙක්,

2 එක් රැයක යේසුස්වහන්සේ වෙත පැමිණ, "ආචාර්යතුමනි, අපේ පිළිගැනීම ඔබතුමා දෙවියන්වහන්සේ වෙතින් පැමිනි ගුරුවරයකු බවයි. මන්ද, තමන් සමඟ දෙවියන්වහන්සේ වැඩ නොසිටින කිසිම කෙනකුට ඔබතුමා කරන හාස්කම් කරන්නට නුපුළුවනැ"යි කීවේය.

3 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "සත්තකින්ම මා ඔබට කියන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්නට නම්, ඕනෑම කෙනකු නැවත උපදින්නට ඕනෑ බවයැ'යි කී සේක.

4 "නැවත උපදින්න!"යි විස්මිත වූ නිකදේමුස්, "මිනිසකු වූ මහලු වූ පසු යළි උපදින්නේ කෙසේද? නැවත වරක් මවු කුසට ඇතුළුව උපදින්න පුළුවන්දැ"යි ඇසීය.

5 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "සත්තකින්ම මා ඔබට කියන්නේ, වතුරින් හා ආත්මයාණන්ගෙන් නුපන් කිසිම කෙනකුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට පිවිසිය නො හැකි බවයි.

6 මිනිසකුගෙන් උපදින්නේ මිනිසෙක්මයි. එහෙත් ආත්මික උපතක් දීමේ හැකියාව ඇත්තේ ආත්මයාණන්වහන්සේට පමණයි.

7 ඔබ නැවත උපදින්නට ඕනැ'යි මා කිවාට පුදුම නො වන්න.

8 සුළඟ සිතූ සිතූ අත හමයි. එහි හඬ ඔබට ඇසෙන නමුත් එය කොහි සිට එනවාද කොතැනක යනවාද කියා ඔබ දන්නේ නැත. ආත්මයාණන්වහන්සේගෙන් ඉපිද සිටින සියල්ලෝද අන්න ඒ ආකාරයැ"යි පහදා දුන් සේක.

9 "නැවත උපදින්නේ කෙසේදැ"යි නිකදේමුස් විචාළේය.

10 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "විශාරද ඉශ්‍රායෙල් ගුරුවරයකුව සිටියදීත් ඔබට එය තේරුම් ගන්නට බැරිද?

11 සත්තකින්ම මම ඔබට කියන්නම්, අප පවසන්නේ හොඳින් දන්නා දේයි. සාක්ෂි දෙන්නේ සැබෑවටම දුටු දේ ගැනයි. එහෙත් අප කියන දේ තවමත් ඔබ නො පිළිගනී.

12 මා මෙලොවට අදාල කාරණා කී විට ඔබට ඒවා වටහා ගන්නට බැරි නම්, ස්වර්ගය ගැන කීවොත් වටහා ගන්නේ කෙසේද?

13 ස්වර්ගයෙන් බැස්සාවූ, ස්වර්ගයේම සිටින්නාවූ මනුෂ්‍ය පුත්‍රයාණන් වන මා මිස, අන් කිසිවෙක් ස්වර්ගයට නැඟුනේ නැත.

14 කාන්තාර ගමනේදී, මෝසස් ලෝකඩ සර්පයකු සාදා එසවූ අයුරින්, මනුෂ්‍ය පුත්‍රයාත් කුරුසියක එසවිය යුතුමය.

15 එසේ වන්නේ එතුමන් කෙරෙහි අදහා ගන්න සියල්ලන් හට අමාමහා ජීවනය ලැබෙන පිණිසයි.

## අමා මහා ජීවනය

16 "දෙවියන්වහන්සේ ලෝ දන හට කෙතරම් ප්‍රේම කළ සේක්ද යත්, ඔවුන් මුදා ගන්නා පිණිස ස්වකීය එකම පුතණුවන් පවා දුන් සේක. එසේ කළේ පුත්‍රයාණන් කෙරෙහි අදහා ගන්නා කවරකු වුවත් විනාශ නොවී අමාමහ ජීවනය ලබන පිණිසයි.

17 දෙවියන්වහන්සේ තම පුතණුවන් මොලොවට එවුවේ ලෝ ජනතාව වරදට පත් කරන්නට නො ව, පුතණුවන් මඟින් ලොව ගලවා ගන්නටයි.

18 එතුමාණන් කෙරෙහි අදහා ගන්නා කිසි වෙකුටත් දඬුවම් හිමි නො වෙයි. එහෙත් දෙවියන්වහන්සේගේ එකම පුතණුවන් සිය ගැලවුම්කරු ලෙස නො පිළිගන්නා සැවොම දැනටත් විනිශ්චය කොට දඬුවමට නියමව සිටිති.

19 විනිශ්චය පැමිණෙන්නේ මේ හේතුවෙනුයි. එනම් ලෝකයට ආලෝකය පහළ වී ඇති නමුත්, දුසිරිතෙහි ගැලී සිටින මිනිසා ආලෝකයට වඩා අන්ධකාරයට ඇළුම්ව සිටින නිසයි.

20 දුසිරිතෙහි ගැලෙන සැවොම තමන්ගේ දූෂණ හෙළිවෙතැයි බියෙන් ආලෝකයට නොඑනවාත් හැර ඊට වෛරද කරති.

21 එහෙත්, සත්‍යයෙහි පවතින තැනැත්තා තම ක්‍රියා කලාපය දේව කැමැත්තට එකඟව කළ බව පෙණෙන පිණිස ආලෝකය තුළට එන්නේයැ"යි පැවැසූ සේක.

## ඉහළින් එන තැනැත්තා

22 මින් අනතුරුව යේසුස්වහන්සේ සිය ගෝලයින් සමඟින් යුදා දේශයට පැමිණ, එහි නැවති බව්තිස්ම කළ සේක.

23 සාලිම් අසල ඒනොක්හි දිය පිරී ජලාසයේදී යොහන්ද ඔහු වෙත පැමිණි බොහෝ දෙනකු බව්තිස්ම කළේය.

24 යොහන් එතෙක්ම සිර භාරයට පත්ව සිටියේ නැත.

25 යොහන්ගේ ගෝලයකු හා යුදෙව්වකු අතර පවිත්‍රවීමේ චාරිත්‍රය පිළිබඳ වාදයක් හට ගැනිණි.

26 ඔවුහු යොහන්ට ඒ වග සැලකරමින්, "රබ්බී, යෝර්දානෙන් එතෙරදී ඔබ සමඟ සිටි අර දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්යැ'යි ඔබ හැඳින් වූ තැනැත්තාත් දැනි බව්තීස්ම කරන නිසා වැඩි දෙනකු අප වෙත නැවිත් එහිම යති'යි කීවෝය.

27 යොහන් පිළිතුරු දෙමින්, "මනුෂ්‍යකුට කළ හැක්කේ දෙවියන්වහන්සේ වරම් දුන් දෙයක් පමණී.

28 මා ක්‍රිස්තුස්වහන්සේ නො ව, එතුමන්ගේ පෙර ගමන්කරුගේ කාරිය කරන්නට ආ තැනැත්තා බව මා කීවා ඔබ හොඳින්ම දනී.

29 මනාලිය හිමි මනාලයාටයි. ඔහුට සවන් දෙමින් පසෙකින් සිටින මිත්‍රයාට මනාලයාගේ හඬ ඇසීමත් කිව නොහැකි තරම් ප්‍රීතියක්. ඒ ප්‍රීතිය දැන් මට දැනේ.

30 එතුමාණෝ පූර්ණ වෙන්නටත්, මා හීන වෙන්නටත් ඕනෑමයි.

31 ඉහළින් එන තැනැත්තා සැමටම ඉහළයි. පහළ පොළොවෙන් වන තැනැත්තා අයිති පොළොවටමයි. ඔහුගේ කථාවත් පොළොවේ දේටම සීමාවෙයි. ස්වර්ගයෙන් එන තැනැන්වහන්සේ සැම සියල්ලන්ටම වඩා උතුම් තැනැත්තෙක්.

32 එතුමාණන් තමන් ඇසූ දුටු දේ ගැන කථා කරන නමුත් ඒවා පිළිගන්නේ කීයෙන් කී දෙනාද?

33 එතුමාණන්ගේ වචන පිළිගන්නාවූ අය කරන්නේ දෙවියන්වහන්සේගේ සත්‍යවාදිකම සහතික කිරීමක්.

34 දෙවියන්වහන්සේ එවූ තැනැත්තාණන් පවසන්නේ දෙවියන්වහන්සේගේම වචනයි. ඊට හේතුව දෙවියන්වහන්සේ අසීමිතව එතුමන්ට ආත්මයාණන් ප්‍රදානය කිරීමයි.

35 ස්වකීය පුත්‍රයාට ප්‍රේම කරන දෙවියන්වහන්සේ සැම සියල්ලම පුත්‍රයාණන් අතට බාර දී තිබේ.

36 පුත්‍රයාණන් අදහන්නාට අමාමහ ජීවනය තිබෙයි. එහෙත් පුත්‍රයාණන්ට අකීකරුවන්නට ඒ ජීවනය දක්නට නො ලැබෙයි. එපමණක් නො වෙයි දේව උදහස ද ඔහු මත රැඳී පවතියැ”යි පැවැසීය.

# 4 යේසුස්වහන්සේ හා සමාරීය කාන්තාව

1 යේසුස්වහන්සේ යොහන්ට වඩා ගෝලයින් දිනාගෙන බව්තිස්ම කරතියි පරිසිවරුන්ට සැලැ විණි.
2 (බව්තිස්ම කළෝ යේසුස්වහන්සේ නො ව ගෝලයෝය)
3 ස්වමින්වහන්සේ ඒ බව දැන, යුදා දේශයෙන් පිට වී යළි ගලීලය බලා පිටත් වූ සේක.
4 ඒ ගමන යා යුතු වූයේ සමාරි දේශය මැදිනි.
5 (මුල් ඉශ්‍රායෙල්කරු වූ) යාකොබ් සිය පුත් යොසෙප්ට උරුම කොට දුන් බිම් කොටස අසල පිහිටි
සිකාර් නම් සමාරි ගම්මානයට ළඟා වූ
6 යේසුස්වහන්සේ ගමනින් විඩා පත්ව සිටි බැවින් යාකොබ්ගේ ළිඳ අසලින් හිඳගත් සේක. ඒ
මද්දහන් වේලාවය.
7 සමාරියේ කාන්තාවක් දිය අදින්නට එහි ආවාය. එසැණේම ඈ ඇමැතූ යේසුස්වහන්සේ, "මට
බොන්නට වතුර ටිකක් දෙන්නැ"යි ඉල්ලූ සේක.
8 එතුමන්ගේ ගෝලයෝ කෑම ගෙනෙන්ට කඩ මණ්ඩියට ගොස් සිටියහ.
9 (එකල සමාරියයන් කුල හීනයක් ලෙස සැලකූ යුදෙව්වන් සමාරියයන් පරිහරණය කළ බඳුන්වලින්
ආහාර පාන නො ගත් බැවින්) එතුමාණන් දිය ඉල්ලූ කල මවිත වූ කාන්තාව, "යුදෙව් ඔබ සමාරිය
මගෙන් බොන්නට ඉල්ලීම හරිදැ"යි ඇසුවාය.
10 යේසුස්වහන්සේ ඈ අමතමින්, "දෙවියන්වහන්සේ ඔබට පිළිගන්වන දීමනාව කුමක්ද කියාත්,
ඔබෙන් දිය ඉල්ලූ මා කවුරුන්ද කියාත් ඔබ දැන සිටියා නම් මගෙන් ඉල්ලන්නේ ඔබයි. එවිට
ඔබට ජීවන දිය ලැබෙනු ඇතැ"යි පිළිතුරු දුන් සේක.
11 එකල, "මහත්මයා"යි එතුමන් ඇමැතූ ඕ තොමෝ, "කෝ! දිය අදින්නට කළයක්, බාල්දියක් ඔබට
නැත. ළිඳත් මෙතරම් ගැඹුරු කොට ඒ ජීවන දිය ඔබට කොයින්ද?
12 ඇරත් මේ ළිඳ අපට දුන් අපේ ආදි පිය වූ යාකොබ්ටත් වඩා ඔබ ශ්‍රේෂ්ඨද? එදා පටන් අද
දක්වා යාකොබ්ගේ මුළු පරම්පරාවට පමණක් නොව, ඔවුන්ගේ සතුන් සීපාවුන්ට පවා දිය
සැපයුණේ මේ ළිඳෙනි"යි කීවාය.
13 යේසුස්වහන්සේ ඊටද පිළිතුරු දෙමින්, "මේ ළිං වතුර කොතෙක් බීවත් නැවත පිපාස වෙයි.
14 එනමුත්, මා දෙන දියෙන් බීවොත් යළි කිසි කලෙකත් පිපාස ඇති නො වෙයි. මා දෙන දිය බොන
ඇත්තන් තුළ අමර ජීවන උල්පත් මැවෙන්නේයැ"යි පැවසූ සේක.
15 "අනේ මටත් ඒ වතුර දෙන්න: එවිට ආයෙත් මට පිපාස වන එකකුත් නෑ. දිය අදින්නට මෙතරම්
වෙහෙසෙන්නට වන්නේත් නැතැ"යි එවිට ඕ පැවැසුවාය.
16 "හොඳයි ගොසින් ඔබේ සැමියා කැඳවන් එන්නැ"යි යේසුස්වහන්සේ පවසත්ම,
17 "ඕන්! මට සැමියෙක් නැතැ"යි ඕ වහා පැවසුවාය. "ඔබ කීවා හරි ඔබට සැමියකු නැති බව සැබෑ
තමයි" යනුවෙන් ඇයට පිළිතුරු දුන් යේසුස්වහන්සේ,
18 "ඔබ සැමියන් පස් දෙනකු සමඟ දිග කෑ නමුත්, දැන් ඔබ සිටින තැනැත්තා ඔබේ නීත්‍යානුකල
සැමියා නො වේ" යැයිද පැවැසූ සේක.

## සැබෑ නමස්කාරය

19 "මහත්මයාණනි"යි එවිට එතුමන් ඇමතූ ඕ, "මට පෙනෙන්නේ ඔබතුමා දිවැසිවරයකු බවයි.

20 අපේ මුතුන් මිත්තන් නම් දෙවියන් වැන්දේ මේ කන්දෙයි. එනමුත් නමස්කාර කළ යුත්තේ යෙරුසලමේ දී පමණකැයි යුදෙව් ඔබ කියන්නේ මක්නිසාදෑ"යි ඇසුවාය.

21 යේසුස්වහන්සේ කරුණු පහදමින්, "මා කියන දේ විශ්වාස කරන්න. පියාණන්වහන්සේට නමස්කාර කළ යුත්තේ කොතැනකදීද යන්න නො ව කෙසේද යන්න සලකන කාලයක් උදා වෙයි.

22 නමස්කාර කළ යුත්තේ අප දන්නා හඳුනන දෙවියන්වහන්සේටයි. අපි නම් උන්වහන්සේ හඳුනමු. එනමුත් ඔබ උන්වහන්සේ නො දන්නා නිසා නමස්කාර කරන්නේ කරන්නන් වාලේ පුරුද්දටයි. මන්ද ගැලවුම්කරුවාණන් පැමිණේන්නේ යුදෙව්වන් අතරින් බව මා කියන්න කැමතියි.

23 අව්‍යාජ ලෙස පියාණන්වහන්සේට නමස්කාර කරන්නන් ආත්මයෙන් හා සත්‍ය සිතින් නමස්කාර කරන කාලයක් පැමිණෙයි. ඒ කාලය දැනටමත් උදාවෙලා. පියාණන්වහන්සේ අපේක්ෂා කරන්නේත් එසේ නමස්කාර කරන අයයි.

24 දෙවියන්වහන්සේ අදෘශ්‍යමාන ජීවාත්මයාණන් නිසා, උන්වහන්සේට නමස්කාර කළ යුත්තේත් ආත්මයෙන් හා සත්‍ය සිතිනු"යි පැවැසූ සේක.

25 කාන්තාවද කථා කරමින්, "දෙවියන්වහන්සේ එවන්නට පොරොන්දු වූ මිදුම්කරුවාණන් හෙවත් ක්‍රිස්තුස්වහන්සේ ලොව පහළ වන බව මම දනිමි. එතුමන් ආ කල සැබෑ තත්වය අපට පහදා දේවි"යි පවසත්ම,

26 "ඔබ සමඟ කථා කරන මම ක්‍රිස්තුස්වහන්සේ වෙමි"යි යේසුස්වහන්සේ දැනුම් දුන් සේක.

## අපූරු ආහාරය

27 ඒ අවස්ථාවේදී ආපසු පැමිණි ගෝලයෝ, එතුමන් ස්ත්‍රියක හා කථාවෙන් පසුවනු දැක මවිත වූහ. එහෙත්, "සොයන්නේ කුමක්දෑ"යි ඇගෙන්වත්, "කුමක් කථා කළ සේක්දෑ"යි එතුමන්ගෙන්වත් කිසිවකු ප්‍රශ්න කළේ නැත.

28 එම කාන්තාව, තම කළයද එතැනම තබා ගම්මානයට දිව ගොස්,

29 "මා කළ කී හැම දෙයක්ම දිවැසින් කී අමුත්තකු බලන්නට වරෙල්ලා. මෙතුමා ක්‍රිස්තුස්වහන්සේවත්දෝ"යි කීවාය.

30 ඒ ඇසූ ගැමියෝ එතුමන් දකින්නට රොක් වූහ.

31 ඒ අතර ගෝලයෝ, "ආහාර ගන්නැ"යි එතුමන්ට පෙරැත්ත කළ මුත්,

32 "ඔය ආහාරයට වඩා ප්‍රිය මනාප, ඔබ නො දන්නා දෙයක් මට තිබේයැ"යි එතුමාණෝ පැවැසූ සේක.

33 එබැවින්, "කවුරුන් හෝ එතුමන්ට ආහාර ගෙනැවිත් දුන්නාදැ"යි ඔවුහු එකිනෙකාගෙන් විමසූහ.

34 යේසුස්වහන්සේ කරුණු පහදමින්, "මගේ ආහාරය වන්නේ මා එවූ පියාණන්වහන්සේගේ කැමැත් ඉටු කර එය සම්පූර්ණ කිරීමයි.

35 'වපුරා හාර මසකින් කපන කාලය පැමිණෙතැ"යි කියනවා නො වේද? ඇස් හැර බලන්න. මා ඔබට කියන්නේ අස්වනු නෙලීම සඳහා ගොයම දැනටමත් පැසී තිබෙන බවයි.

36 අස්වනු නෙලන්නා සිය මහන්සියට සරිලන වැටුප් ලැබ, අමාමහ ජීවනයට ඵලදාව රැස් කරන්නේය. මෙසේ වපුරන්නාත්, කපන්නාත් එක්ව ප්‍රීති ප්‍රමෝදයට පත් වෙති.

37 'කෙනෙක් වපුරන්නේය. අන් කෙනෙක් කපන්නේය' යන කියමන මින් සැබෑ වෙයි.

38 ඔබ අස් නො වැද්දූ කෙතක අස්වනු නෙලීමට මම ඔබ හැම යැවූවෙමි. වැපිරීමේ වෙහෙස දැරුවේ වෙනත් අයයි. ඔවුන්ගේ වෙහෙසේ ඵල භුක්ති විඳින්නෝ ඔබයැ"යි පැවැසූ සේක.

## ගැමියන්ගේ අත්දැකීම

39 "මගේ වත ගොත දිවැසින් කී කෙනෙක් මට හමුවීනැ"යි ගම්මානය පුරා පතළ වූ ඒ කාන්තාවගේ සාක්ෂිය නිසා, සමාරිවාසීහු බොහෝ දෙනෙක් එතුමාණන් ක්‍රිස්තුස්වහන්සේම බව, එනම් ගැලවුම්කරු ලෙස දේවාභිෂේක ලත් තැනැත්තාණන්ම බව විශ්වාස කළහ.

40 එබැවින් ඔවුහු එතුමාණන් හමුවට ආ කල තමන් සමඟ නවතින්නැයි ඇවිටිලි කළහ. එතුමාණෝද දෙදිනක් ඔවුන් සමඟ ගත කළ සේක.

41 එහිදී එතුමාණන් කළ දේශන ඇසූ බොහෝ දෙනෙක්ද එතුමන් කෙරෙහි අදහා ගත්හ.

42 ඔවුහු පෙර කී කාන්තාවට කථා කොට, "අප දැන් අදහන්නේ ඔබ කී දේ නිසාම නො වෙයි. අපේම කනින් එතුමාණන්ගේ වචන ඇසූ නිසා සැබැවින්ම මුන්වහන්සේ ලෝකයේ ගැලවුම්කාරුවාණන් බව දැන් අපි දනිමු"යි කීවෝය.

## තවත් හාස්කමක්

43 දෙදිනකට පසු යේසුස්වහන්සේ ඔවුන්ගෙන් සමුගෙන ගලීලය බලා ගිය සේක.

44 'ගමේ දිවැසිවරයා ගමට අගේ නැතැ'යි එතුමන් පවසා තිබූ නමුදු,

43 යෙරුසලම්හි පාස්කු උත්සවයට ගොස් සිටියදී යේසුස්වහන්සේ කළ හාස්කම් දැක තිබූ ගලීල වාසීහු එතුමන් හරසරින් පිළිගත්හ.

46 යේසුස්වහන්සේ, එතුමන් වතුර වයින් බවට පත් කළ ගලීලයේ කානා නගරය කරා යළිත් පැමිණි සේක. ඒ අතර කපර්ණාවුම් හි එක්තරා රජයේ නිලධාරියකුගේ පුත්‍රයෙක් රෝගීව සිටියේය.

47 යේසුස්වහන්සේ යුදාහි සිට ගලීලයට ආ වග ඇසූ හෙතෙම එතුමාණන් හමුවට ගොස්, එතුමන්ට කන්නලව් කරමින්, අවුත් මරණාසන්නව සිටින තම පුත්‍රයා සුව කර දෙන මෙන් අයැදීය.

48 යේසුස්වහන්සේ ඔහු අමතා, "හාස්කම් හා නිමිති දුටුවොත් මිස ඔබට විශ්වාස කරන්න බැහැ නො වේදැ"යි ඇසූහ.

49 "මහත්මයාණෙනි, අනේ මගේ දරුවා මැරෙන්නට කලින් අව මැනවැ"යි නිලධාරියා උදක්ම ඇයැද සිටියේය.

50 “බිය නො වී ආපසු යන්න. ඔබේ පුත්‍රයා ජීවත් වනු ඇතැ”යි යේසුස්වහන්සේ පැවසූ කල ඔහු එතුමාණන්ගේ වචන පිළිගෙන ආපසු ගියේය.

51 ඔහු මඟ යද්දීම ඔහුගේ පෙරමගට ආ ගෙදර මෙහෙකරුවෝ, “ඔබගේ පුතාට සුවය ලැබුණා”යි දැන්වූහ.

52 ඔහුට සුවය ලැබුණේ කවර වේලාවෙහිදැයි ඔහු ඔවුන්ගෙන් විමසූ විට, “ඊයේ දවල් එකට පමණ එක් වරම උණ බැස්සා”යි ඔවුහු පිළිතුරු දුන්හ.

53 ඔබේ පුත්‍රයා ජීවත් වනු ඇතැ”යි යේසුස්වහන්සේ වදාළේ හරියටම ඒ මොහොතේදී බව පියාට අවබෝධ විය. එබැවින් ඔහු පමණක් නො ව ඔහුගේ නිවසේ සැවොමද යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගත්හ.

54 යේසුස්වහන්සේ යුදාහි සිට ගලීලයට පැමිණි පසු දැක්වූ දෙවන අනුහස් ලකුණ මෙය විය.

# 5 දෙපයින් ඇවිද ගිය කොරා

1 මින් අනතුරුව යුදා පූජෝත්සවයක් වූයෙන් යේසුස්වහන්සේද යළි යෙරුසලමට පැමිණි සේක.

2 යෙරුසලමේ බැටළු දොරටුව අසල හේබ්‍රෙව් බසින් බෙතෙස්දා නම් ලත් පොකුණක් ද ඒ පොකුණ වටා මණ්ඩප පහක්ද වෙයි.

3 කොර, අන්ධ, අංගබාග ආදි රෝගීන් සමූහයක් ඔත්පලව එම මණ්ඩපයෙහි රැඳී සිටියහ.

4 (ඔවුන් එසේ සිටියේ දේව දූතයෙක් පැමිණ කලින් කල පොකුණු දිය කළඹතැයි ද එසේ කැළැතූ දියට මුලින්ම බට කවර රෝගියකු වුව සුව වෙතැයිද යන විශ්වාසයට අනුව දිය කැළැතෙන තෙක් සෝදිසියෙනි)

5 අත පය වාරු නැතිව පුරා 38 වසරත් ඔත්පලව සිටි මිනිසෙක්ද ඔවුනතර විය.

6 යේසුස්වහන්සේ ඔහු දැක, දිගු කලක්ම ඔහු එසේ සිටි වග දැන, "ඔබ සුව ලබන්නට කැමැතිදැ"යි ඇසූ සේක.

7 රෝගී මිනිසා පිළිතුරු දෙමින්, "අනේ මොනවා කරන්නද මහත්මයා, වතුර කැළැඹෙද්දී පොකුණට මා බස්වන්නට අත් උදව් කාරයෙක් නැහැ නො වැ, හැම වාරේම මා බහින්න හදද්දිත් කවුරුන් හරි බැහැලා ඉවරයැ"යි සොවින් පැවැසීය.

8 "නැඟිටින්න, නැඟිට ඔය පැදුරත් අතින් ගෙන ඇවිදින්නැ"යි යේසුස්වහන්සේ පැවැසූ සේක.

9 එකෙණෙහිම සුව ලත් මිනිසා සිය පැදුරද අතින් ගෙන ඇවිද ගියේය. මෙය සිදුවූයේ (මොන යම් ලෙසකින් හෝ කිසිදු වැඩක් නො කටයුතු යයි සම්මත නියෝගය බල පවත්නා දිනයක් වූ) සබත් දිනෙක බැවින්,

10 යුදෙව්වෝ තම විරෝධය පාමින්, "මේ ශුද්ධ දවසේ වැඩ කිරීම වැරදියි. පැදුරත් අරං යෑම නීති විරෝධීයැ"යි සුවය ලත් මිනිසා දොස් තැබූහ.

11 හෙතෙම පිළිතුරු දෙමින්, "එක යස වැඩක් නො වැ, පැදුරත් අරං යන්නයි මට කීවේ මා සුවපත් කළ උත්තමයායැ"යි කීවේය.

12 "පැදුර උසුලන් යන්නැයි කීවේ කොයි මිනිසාදැ"යි ඔවුහු ප්‍රශ්න කළහ.

13 යේසුස්වහන්සේ ජන සමූහයාට මැදිවී එතැනින් ඉවත්ව ගොස් සිටි බැවින් තමන් සුවපත් කළේ කවරෙක්දැයි ඔහු නො දත්තේය.

14 පසුව දේව මාලිගයේදී යේසුස්වහන්සේ ඔහු මුණ ගැසී, "ඔබ දැන් සුවපත්ව හොඳින් සිටින නිසා මින්මතු පව් නො කරන්නට වග බලා ගන්න. පව් කළොත් සිටියාටත් වඩා කාලකණ්නි විය හැකියැ"යි ඔවා දුන් සේක.

15 හෙතෙම යුදෙව් නායකයින් වෙත ආපසු ගොස්, තමා සුවපත් කළේ යේසුස්වහන්සේ බව සැල කළේය.

## පරම විනිසුරු

16 මෙසේ යේසුස්වහන්සේ සබත් නීති කැඩියැයි සැලැකූ යුදෙව්වෝ එතුමන්ට හිංසා පීඩා කළහ.

17 එහෙත් යේසුස්වහන්සේ කථා කරමින්, "මාගේ පියාණන්වහන්සේ නිරතුරුවම මේ දක්වාත් වැඩ කරන නිසා මමත් වැඩ කරන්නෙමි"යි පැවැසූ සේක.

18 එවිට, යේසුස්වහන්සේ සබත් නීති කඩ කළා පමණක් නො ව, දෙවියන්වහන්සේ 'ස්වකීය පියාණන්යැ'යි කියා ගනිමින් උන්වහන්සේ හා සම තත්වයෙන් දේවත්වයද පවරා ගත් බැවින්, වඩා උරණ වූ යුදෙව් නායකයෝ එතුමන් නසා දමන්නට වඩ වඩා උත්සුක වූහ.

19 සිය පීඩකයන් ඇමතූ යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "සත්තකින්ම මම ඔබට කියන්නම්, පියාණන්වහන්සේ යම් සේ ක්‍රියා කරනවා පුත්‍රයා දකින්නේද, ඒ දේම කරනවා මිස තනිවම කිසිවක් කරන්නට පුත්‍රයාට නුපුළුවන. පුත්‍රයා කරන්නේ ඒ සැටියෙන්ම පියාණන්වහන්සේ අනුගමන කිරීමයි.

20 පියාණන්වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන නිසා තමන් කරන සෑම සියලු දෙයක්ම පුත්‍රයට පෙන්වන සේක. මේ මිනිසා සුව කරවීමටත් වඩා ඔබ සැම මවිත කරවන පුදුමාකාර දේද මතු පෙන්වනු ඇත.

21 පියාණන්වහන්සේ මළවුන් නැඟිටුවා ඔවුන්ට ජීවය දෙන්නා සේම තමන් තෝරා ගත් අයට ජීවනය දෙන්නට පුත්‍රයාටත් පුළුවන.

22 එපමණක් නො වෙයි, පියාණන්වහන්සේ කිසිවකුත් විනිශ්චය නො කර විනිශ්චය මුළුමනින්ම බාර දී තිබෙන්නේ පුත්‍රයා අතටයි.

23 එසේ කර ඇත්තේ සෑම සියල්ලන් වෙතින් පියාණන් ලබන ගෞරවය පුත්‍රයාත් ලබන්නට ඕනෑ නිසයි.

24 සත්තකින්ම මා ඔබට කියන්නේ, මගේ වචන පිළිගෙන මා එවූ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස තබන ඕනෑම කෙනකුට අමාමහ ජීවනය ලැබෙන බවයි. ඒ තැනැත්තාගේ පාප කර්ම අහෝසි කෙරෙන බැවින් ඔහුට එරෙහිව කිසි පැමිණිල්ලක් නො නැගෙයි. ඔහු ජරා බවින් අජර අමර බවට පත්ව සිටී.

25 සත්තකින්ම මා ඔබට කියන්නේ, දේව පුත්‍රයාණන්ගේ කට හඬ මළවුන්ට පවා ඇසෙන අවස්ථාවක් උදා වන බවයි. ඒ අවස්ථාව දැනටමත් උදා වෙළා. පුත්‍රයාණන්ගේ හඬට සවන් දෙන්නේ නම් මළාහු වුවත් ජීවත් වන්නෝමැයි.

26 ජීවනය වන්නේ පියාණන්වහන්සේයි. ඒ ජීවනය දැරීමේ වරම පුත්‍රයාණන්ට පවරා දී තිබේ.

27 එපමණක් නො වෙයි දේව පුත්‍රයා මනුෂ්‍යපුත්‍රයාණන් වූ බැවින් මිනිසුන් විනිශ්චය කිරීමේ පරම විනිසුරුකමේ බලතලද එතුමන්ට පවරා දී තිබේ.

28 පුදුම වනු එපා, සොහොනේ නිදන මළවුන්ට පවා පුත්‍රයාණන්ගේ කට හඬ ඇසෙන අවස්ථාවක් උදා වෙයි.

29 එවිට යහපත කළෝ අමර ජීවනයටත්, අයහපත කළෝ දඬුවම් විඳීමටත් මිනී වළෙන් නැඟිට එති.

30 තනි කැමැත්තට කිසිවක් කරන්නට මට නො හැකියි. මා විනිශ්චය කරන්නේ පියාණන්වහන්සේ මට උපදෙස් දෙන ආකාරයටයි. මා මගේම රුචි අරුචිකම් නො ව, මා එවූ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන නිසා මගේ විනිශ්චය සාධාරණයි. අපක්ෂපාතයි.

31 මා, මා ගැනම සහතික කර ගන්නවා නම් ඒ සාක්ෂිය පිළිගත නො හැකියි.

32 එනමුත් මා වෙනුවෙන් සාක්ෂි දෙන වෙන කෙනෙක් සිටිත්, මා ගැන උන්වහන්සේගේ සාක්ෂිය සත්‍යය බව මම දනිමි.

33 ඔබ යොහන් ළඟට මිනිසුන් යැවූ විට ඔහුත් මා ගැන සත්‍ය ප්‍රකාශ කළා නො වේද?

34 මා මෙසේ කියන්නේ ඔබේම යහපත සඳහායි. එනම්, ඔබේ ගැලවීම සඳහා මිස මට මිනිසකුගේ සහතිකයක් අවශ්‍ය නිසා නො වේ.

35 යොහන් ඇවිලෙන, බැබැළෙන පහනක්ව සිටි සමයේ ඔබත් ඔහුගේ එළියෙන් ප්‍රයෝජන ලබන්නට කැමැත්තෙන් සිටියා නො වේද?

36 "එනමුත් මට තිබෙන්නේ යොහන්ගේ සාක්ෂියට වඩා ඉතා උතුම් සාක්ෂියක්. පියාණන්වහන්සේ මට පැවරූ වැඩ කොටස, එනම් මා දැන් කර ගෙන යන වැඩ කටයුතුම පියාණන්වහන්සේ මා එවූ බවට හොඳම සාක්ෂියයි.

37 මා එවූ පියාණන්වහන්සේම මා ගැන සාක්ෂි දී ඇතත් කිසි දිනෙක ඔබ උන්වහන්සේ ගේ හඬට සවන් දී නැත. උන්වහන්සේගේ රූපකාය දුටුවේද නැත.

38 උන්වහන්සේගේ වචන ඔබේ සිතේ නොරැඳෙන්නේ උන්වහන්සේ වෙතින් පැමිණි මා කෙරෙහි ඔබේ කිසි විශ්වාසයක් නො මැති නිසායි.

39 ඔබ ශුද්ධ ලියවිලි පිරික්සන්නේ අමර ජීවනය ඒවායේ ඇතැයි යන අදහස ඇතිවයි. මා ගැන සාක්ෂි දෙන්නේත් ඒ ලියවිලිමයි.

40 එසේ වුවත් ඒ ජීවනය ලැබීම සඳහා මා වෙත එන්නට ඔබ කැමති නැත.

41 මිනිස් ගරු පැසැසුම් මා පිළිගන්නේ නැත.

42 එපමණක් නො වෙයි, ඔබ ගැනත් මම හොඳින් දනිමි. ඔබ කිසිවකුත් දෙවියන්වහන්සේට ප්‍රේම නො කරන බව මම දනිමි.

43 මා, පියාණන්වහන්සේගේ නියෝජිතයාව, උන්වහන්සේට ගෞරව දක්වමින් ආ නමුත් ඔබ, මා නො පිළිගනිති. එසේ වුවත්. යමෙක් තමාම වර්ණනා කරගනිමින් ආවොත් ඔබ ඔහු පිළිගනු නිසැකයි.

44 එනිසා එකම දෙවියන්වහන්සේ වෙතින් එන ගෞරවයට වඩා තම තමන් අතරේ එකිනෙකා වර්ණනා කර ගන්නා ඔබ, මා නොපිළිගැනීම පුදුමයට කරුණක් නො වේ.

45 ඔබට විරුද්ධව දෙවි පියාණන් ඉදිරියේ මම පැමිණිලි නො කරමි. එනමුත් ඔබට චෝදනා කරන කෙනෙක් සිටී. ඒ අන් කිසිවෙක් නො ව ඔබ මහත් බලාපොරොත්තු තබා සිටින මෝසස්මයි.

46 එබැවින් ඔබ මෝසස් කෙරෙහි විශ්වාසය තබනවා නම් මා කෙරෙහිත් විශ්වාසය තැබිය යුතුයි. මන්ද, මෝසස් තම ලියවිලිවල ලිව්වේ මා ගැනයි.

47 මෝසස්ගේ ලියවිලිවත් හරිහැටි විශ්වාස නො කරන ඔබ, මගේ වචන කෙරෙහි විශ්වාස නො තැබීම පුදුමයක් නො වේයැ"යි කී සේක.

# 6

## රොටි පහේ හාස්කම

1 මින් මද කලකට පසු යේසුස්වහන්සේ තිබේරියස් නම් වූ ගලීල මුහුදින් එතෙරට වැඩම කළ සේක.

2 එතුමාණන් රෝගීන් සුවපත් කරමින් පෑ අනුහස් ලකුණු දුටු අති මහත් ජනකායක් එතුමන් පසුපස ඇදී ගියහ.

3 සිය ගෝලයින් සමඟ අසල කන්දට නැඟුණු යේසුස්වහන්සේ පහසු තැනෙක වාඩිගත් සේක.

4 යුදෙව් පාස්කු පූජෝත්සවයද ළංව තිබිණි.

5 අති මහත් ජනකායක් තමන් වෙත එනු දුටු යේසුස්වහන්සේ පිලිප් අමතා, "මොවුන්ට කන්න දෙන්නට ආහාර මිළයට ගන්නේ කොහෙන්දැ"යි ඇසූ සේක.

6 සිතේ යම් අදහසක් ඇතිව එතුමන් එසේ ඇසුවේ පිලිප් සෝදිසි කරන අටියෙනි.

7 "හැමටම ටික ටිකවත් බෙදා දෙන්නට නම් මසු 200 ක රොටි ගෙනාවත් මදි වේවි" යනු පිලිප්ගේ පිළිතුරු විය.

8 එවිට පේතෘස්ගේ සෝයුරු අන්දෘ ඔත්තුවක් දෙමින්,

9 "රොටි පහකුත් මසුන් දෙදෙනකුත් ඇති ළමයෙක් නම් සිටියි. ඒත් මෙතරම් සෙනඟකට එය මක්කරන්නදැ?"යි පැවැසිය.

10 "මිනිසුන් හිඳුවන්නැ"යි යේසුස්වහන්සේ අණ දුන් විට, රැස්ව සිටි සියල්ලෝ එහි සරුවට වැඩී තිබුණු තණ නිල්ල මත හිඳ ගත්හ. පිරිමි පමණක් 5000 ක් පමණ එහි වූහ.

11 යේසුස්වහන්සේ රොටි පහ ගෙන දෙවියන්වහන්සේට තුති පුදා, වාඩි ගත් ජනයා රිසි පරිද්දෙන් මසුන් සමඟ රොටි බෙදා දුන් සේක.

12 මෙසේ ඔවුන් සිත් සේ කෑ පසු සිය ගෝලයින් ඇමැතූ යේසුස්වහන්සේ, "කිසිවක් අපතේ නැර ඉතිරි වූ කැබැලි එකතු කරන්නැ"යි පැවැසූ සේක.

13 මෙසේ රොටි පහෙන් සැවොම කා ඉතිරි වූ කැබලි එකතු කළ ඔවුහු ඒවායින් මලු දොළසක් පිරවූහ.

14 යේසුස්වහන්සේ පෑ මෙම හාස්කම දුටු ජනතාව, "සැබැවටම ලොවට පහළ වන්නට සිටින ගැලවුම්කාර දිවැසිවරයා මෙතුමාණෝමයැ"යි ඔල්වර හඬ නඟන්නට වන්හ.

15 බලහත්කාරයෙන් තමන් රජකමට පත් කර ගන්නට ඔවුන් අර අඳින බව දැනගත් යේසුස්වහන්සේ, හුදෙකලා වී යළි කන්දට නැඟුණු සේක.

## මුහුදු දිය මත ඇවිද යෑම

16 සවස් වේලෙහි එතුමන්ගේ ගෝලයෝ වෙරළට බැස,

17 ඔරුවක නැගී කපර්නවුම් බලා යාත්‍රා කළහ. අඳුරද පැතිරෙමින් තිබිණි. ඒ වන තුරුත් යේසුස්වහන්සේ ඔවුන් අතරට පැමිණියේ නැ.

18 ඒ අතර සැඩ කුණාටුවක් හමා මුහුද කැළැඹී බිහිසුණු රළ රැළි නැංගේය.

19 ඔවුහු කිලෝ මීටර පහක් පමණ දියඹට අසීරුවෙන් ඔරුව පැදවූ පසු අපූරු දෙයක් සිදුවිණි. යේසුස්වහන්සේ මුහුදු දිය මත ඇවිද ආවෙන්, ඔවුහු ඒ දැක ත්‍රස්ත වූහ.

20 "බිය වන්න එපා, මේ මමයැ"යි කියමින් එතුමෝ ඔවුන්ගේ බිය දුරු කළ කල,

21 එතුමන් ඔරුවට නංවා ගන්නට ඔවුන් කැමති වූ මුත් එකෙණෙහිම ඔරුව ඔවුන්ගේ ගමනාන්තයට සේන්දු වී තිබිණි.

22 පෙරදින සවස වෙරළෙහි වූයේ එක් ඔරුවක් පමණක් බවත්, යේසුස්වහන්සේගේ ගෝලයින් එහි නැඟී එතෙර ගිය නමුත් එතුමාණන් ඔවුන් සමඟ නො ගිය බවත්, මෙගොඩ ජනයා පසු දා දැන ගත්හ.

23 ස්වාමින්වහන්සේ තුති පිදූ පසු ජනයා රොටි වැළැඳූ පෙදෙස අසලට එවේලේ තිබේරියස් හි සිට ඔරු කිහිපයක් ළඟා විණි.

24 යේසුස්වහන්සේත්, ගෝලයිනුත් මෙතෙර නො මැති බව වැටහුණු කල, ජනයා එම ඔරුවල නැඟී යේසුස්වහන්සේ සොයමින් කපර්නවුම් බලා ගියහ.

## අජර අමර අහර

25 එතෙරදී එතුමන් හමු වූ කල, "ගුරු හිමියනි, ඔබ තුමා මෙහි ආවේ කවර වේලේද"යි ඔවුහු ඇසූහ.

26 යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "සත්තකින්ම මම ඔබට කියන්නම්, ඔබ මා සොයන්නේ අනුහස් ලකුණු දුටු නිසා නො වෙයි. රොටි කෑමෙන් සෑහීමට පත් වූ නිසයි.

27 දිරා ජරාවට යන ආහාර සඳහා නො ව සදා පවතින, අමර ජීවය ගෙනෙන ආහාර සඳහා වෙහෙසෙන්න. දෙවි පියාණන්වහන්සේගේ අනුමැතිය ලබා මනුෂ්‍ය පුත්‍රවූ මා පැමිණියේ ඔබ සැමට ඒ ජීවනය පිළිගන්වන්නටයැ"යි පැවැසූ සේක.

28 "දෙවියන්වහන්සේගේ කැමැත් ඉෂ්ට කරන්නට අප කළ යුත්තේ කුමක්දැ"යි එවිට ඔවුහු ප්‍රශ්න කළහ.

29 "දේව කැමැත්ත ඉටු කරන්නට නම් ඔබ සැම උන්වහන්සේ එවූ තැනැත්තා කෙරෙහි අදහා ගත යුතුයැ"යි යේසුස්වහන්සේ පිළිතුරු දුන් සේක.

30 එකල එතුමන් ඇමතූ ඔවුහු, "හොඳයි, ඔබ දෙවියන්වහන්සේ වෙතින් ආ බව අදහා ගැනීම සඳහා අපට පෙන්වන හාස්කම කුමක්ද? හොඳයි, අපට කර පෙන්වන්නේ කුමක්ද?

31 ආහාර පිණිස එතුමෝ ඔවුන්ට ස්වර්ගයෙන් රොටි දුන් සේකැ'යි දහම් ලියවිල්ලේ ලියා තිබෙන ලෙස කාන්තාර ගමනේදී අපේ මුතුන් මිත්තෝ මන්නා නැමැති ස්වර්ගීය ආහාර කෑවෝයැ"යි පැවැසූහ.

32 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "සත්තකින්ම මා ඔබට කියන්නේ, ස්වර්ගික ආහාර ඔබට දුන්නේ මෝසස් නො වන බවයි. නියම, අව්‍යාජ ස්වර්ගික ආහාර ඔබට දෙන්නේ මගේ පියාණන්වහන්සේයි.

33 මන්ද, දෙවියන්වහන්සේ දෙන ආහාර නම්, ස්වර්ගයෙන් බැස ලොවට ජීවනය දෙන තැනැත්තාණන්යැ"යි පැවැසූ සේක.

34 “හැමදාමත් අපට ඒ කෑම දෙන්න මහත්මයා”යි එවිට ඔවුහු ඉල්ලා සිටියහ.

35 යේසුස්වහන්සේ කරුණු පහදමින්, “ජීවනදායක ආහාරය මම වෙමි. මා වෙත එන පුද්ගලයාට කිසි කලෙකත් සාගිනි නො වේ. මා තුළ විශ්වාසය තබන පුද්ගලයාගේ පිපාසය සදහටම සංසිඳේ.

36 එනමුත් මා කලිනුත් කී ලෙස ඔබ සැම මා දැක දැකත් විශ්වාස කරන්නේ නැත.

37 පියාණන්වහන්සේ මට බාර දෙන සැවොම මා කරා එත්මැයි. මා වෙත එන කිසිවකු මම කිසිදාක පළවා නො හරමි.

38 මන්ද ස්වර්ගයෙන් බැස මා ආවේ, මගේම මනාපය නො ව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන පිණිසයි.

39 මා එවූ උතුමන්ගේ කැමැත්ත වන්නේ උන්වහන්සේ මට බාර දුන් සෑම සියල්ලන්ගෙන් එක්කෙනකු හෝ නැති නාස්ති වී යා නොදී කල්පාවසාන දවසේදී ඔවුන් නැඟිටුවීමයි.

40 සත්තකින්ම, මා පියාණන්ගේ කැමැත්ත, සිය පුතණුවන් දෙස බලා එතුමන් අදහා ගන්න සෑම කෙනකුම අමාමහ ජීවනයට ඇතුළු වීමයි. කල්පාවසාන දවසේදී මම ඔවුන් නැඟුටුවන්නෙමි”යි දෙසූ සේක.

41 මෙවිට, “ස්වර්ගයෙන් බැස ආ ආහාරය මමයැ”යි එතුමන් කී බැවින් යුදෙව්වෝ එතුමන්ට එරෙහිව මැසිවිලි කියමින්,

42 “මේ යේසුස් අර යෝසෙප්ගේ පුතා නෙවේද? මොහුගේ මා-පියන් අප හොඳින් හඳුනද්දී මොහු ස්වර්ගයෙන් බැස්සැයි කියන්නේ කොහොමදැ”යි මිමුණන්නට වූහ.

43 “ඔබ මැසිවිල්ල නවතා ගන්න”යි යළි පිළිතුරු දුන් යේසුස්වහන්සේ,

44 “මා එවූ පියාණන්වහන්සේ විසින් පොළඹවනු ලැබූ කෙනකුට මිස අන් කිසිවකුට මා වෙත ආ නො හැකියි. මා වෙත ආ කෙනා, කල්පාවසාන දවසේදී මම නැඟිටුවමි.

45 'දෙවියන්වහන්සේ හැම දෙනාමට උගන්වන සේකැ'යි දිවැස්වැකිවල ලියා තිබෙනවා නො වේද? පියාණන්වහන්සේට සවන් දෙන, උන්වහන්සේගේන් ඉගෙන ගන්න හැම කෙනෙක්ම මා වෙත එත්මැයි.

46 දෙවියන්වහන්සේ වෙතින් ආ තැනැත්තා හැර අන් කිසිවෙක් පියාණන්වහන්සේ දැක නැත. පියාණන්වහන්සේ දැක ඇති එකම පුද්ගලයා මමයි.

47 සත්තකින්ම මා ඔබට කියන්නේ, මා අදහාගන්නාට අමාමහ ජීවනය ලැබෙන බවයි.

48 ජීවන දායක ආහාරය මමයි.

49 ඔබේ මුතුන් මිත්තෝ කාන්තාරයේදී මන්නා කෑ නමුත් ඔවුහුද නැසී ගියහ.

50 එනමුත් මා කියන මේ ආහාරය නම්, එයින් කන මිනිසා නො නැසෙන පිණිස සර්වර්ගයෙන් බැස එන ආහාරයයි.

51 ස්වර්ගයෙන් බැස ආ ජීවන දායක ආහාරය මමයි. මේ ආහාර වළඳන කවරෙක් වේවා අජරාමර වෙයි. ලෝ ජනතාවගේ ජීවනය සඳහා මා පිළිගන්වන ආහාරය නම් මගේ මාංශ ධාතුවයැ”යි ප්‍රකාශ කළ සේක.

52 එවිට ඔවුනොවුන් අතරේ වාද කරන්නට පටන් ගත් යුදෙව්වෝ, “ඒක යස කථාවක්නෙ! මොහු අපට ඔහුගේ මාංශ කන්නට දෙන්නේ කෙසේදැ”යි විමසන්නට වූහ.

53 යේසුස්වහන්සේ නැවතත් කථා කරමින්, “සත්තකින්ම මා ඔබට කියන්නේ, මනුෂ්‍ය පුත්‍රයාගේ මාංශ හා රුධිරයෙන් පෝෂය වුවොත් මිස ඔබ තුළ ජීවනය නො මැති බවයි.

54 මා ගතින් හා රුධිරයෙන් පෝෂ්‍ය වන කවරෙක් වුවත් අජරාමර වෙයි. කල්පාවසාන දවසේදී මම ඔහු නැඟුටුවන්නෙමි.

55 අව්‍යාජ ආහාරය මගේ මාංශයයි. අව්‍යාජ පානය මගේ රුධිරයයි.

56 මාගෙන් මේ ආහාර පාන ලබන්නා මා තුළ ජීවත් වෙයි. මමත් ඔහු තුළ වැඩ වසන්නෙමි.

57 මා එවූ ජීවනයේ පියාණන් මගින් මා ජීවය ලබන්නේ යම් සේද, මගෙන් පෝෂ්‍යවන්නා මා මඟින් ජීවනය ලබයි.

58 ස්වර්ගයෙන් බැස ආ මේ ආහාරය, අපේ මුතුන් මිත්තන් කෑ මන්නා මෙන් නොවෙයි. ඔවුන් නැසී ගිය නමුත් මේ ආහාරය වළඳන තැනැත්තා අජරාමර වේයැ”යි පැවැසූ සේක.

59 යේසුස්වහන්සේ මේ අනුශාසනා කළේ කපර්නාවුම්හි පිහිටි ධර්මශාලාවේදී දේශනා කරමින් සිටියදීය.

## පාරිශුද්ධ තැනැත්තාණෝ

60 ඒ කියමන ඇසූ එතුමාගෙන් අනුගාමිකයන්ගේ වැඩි දෙනෙක්, “මේ නම් මහ තද කියමනකි. ඕවා අහන්න පුළුවන් කවරකුටදැ”යි මැසිවිලි නැඟුහ.

61 සිය ගෝලයින් එසේ මැසිවිලි නගන බව දත් යේසුස්වහන්සේ, “කිමද? ඔබටත් මෙය පැකිළීමට කාරණයක්ද?

62 එසේ නම් මනුෂ්‍ය-පුත්‍රයා පෙර විසූ තැනට නැගී යනවා ඔබ දුටුවොත් හෙම කෙසේද?

63 ජීවනය නඟන්නේ ආත්මයාණෝයි. මාංශය නොවටිනා දෙයක්. මා ඔබට පැවසූ වචන ආත්මයයි. ජීවනය නඟන්නේ ඒ වචනයයි.

64 එසේ නමුත් විශ්වාස නො කරන අයත් ඔබ අතර සිටිති”යි තතු පැහැදූ සේක. මන්දයත් විශ්වාස නොකරන්නෝ කවුරුද, තමා පාවා දෙන්නේ කවුරුදැයි එතුමාණන් මුල පටන්ම දැන සිටි බැවිනි.

65 වැඩි දුරටත් කථා කළ එතුමාණෝ, “මගේ පියාණන්වහන්සේගෙන් අනුමැතිය නොලැබ කිසිවකුට මා කරා ආ නො හැකි බව මා කීවේ ඒ නිසායැ”යි පැවසූ සේක.

66 මේ සිද්ධියෙන් පසු අනුගාමිකයන්ගෙන් වැඩි දෙනෙක් එතුමාණන්ගෙන් වෙන් වී එතුමන් අනුව යෑම අත් හළහ.

67 යේසුස්වහන්සේ ගෝලයින් දොළොස් දෙනා වෙත හැරී, “ඔබත් මා හැර යනවාදැ”යි ඇසූ සේක.

68 සීමොන් පේතෘස් ඊට පිළිතුරු දෙමින්, “ස්වාමිනී, අප වෙන කවරෙක් ළඟට යන්නද? අමාමහ ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ ළඟ පමණයි.

69 දෙවියන්වහන්සේගේ පාරිශුද්ධ තැනැත්තාණන් වන ක්‍රිස්තුරජාණෝ ඔබවහන්සේම බව අපට හොඳටම විශ්වාසයැ”යි පැවැසීය.

70 එවිට යේසුස්වහන්සේද කථා කරමින්, “ඔබ දොළොස් දෙනා තෝරා ගත්තේ මමයි. එනමුත් ඔබෙන් කෙනෙක් යක්ෂයෙකැ”යි පැවැසූ සේක.

71 එතුමා එසේ කීවේ සීමොන් ඉස්කාරියෝත්ගේ පුත්‍රයා වූ යුදස් ගැනය. දොළොස් දෙනාගෙන් කෙනකු වූ නමුත් එතුමාණන් පාවා දෙන්නට සිටියේ ඔහුය.

# 7

## කසුකුසුවක්

1 යුදෙව්වන් එතුමන් නසා දමන්නට සෙවූ බැවින්, යේසුස්වහන්සේ යුදා දේශයෙන් නික්ම, ගලීලයේ සැරි සැරූ සේක.

2 කූඩාරම් මංගල්‍යය නම් යුදා උත්සව සමය ආසන්න වෙත්ම,

3 යේසුස්වහන්සේගේ සහෝදරයෝද එතුමන් පොළඹවමින් කථාකොට, “මෙහි හිඳීමෙන් කුමණ පලක්ද, යන්න යුදාහි උත්සවයට, ඔබ කරන හාස්කම් ඔබේ ගෝලයින් රැසකටම දකින්නට ලැබෙන්නේ එවිටයි.

4 ජනප්‍රියත්වය සොයන කිසි කෙනෙක් අප්‍රසිද්ධියේ කටයුතු නො කරයි. ඔබ කරන මේ දේවල් ලෝකයට පෙන්වන්නට මේක හොඳ අවස්ථාවකැ”යි කීවෝය.

5 එසේ වූයේ එතුමන්ගේ සහෝදරයින් පවා එතුමාණන් කෙරෙහි නො ඇදහූ බැවිනි.

6 යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, “මගේ නිසි වෙලාව තවමත් උදාවී නැත. ඔබට නම් කවර වේලාවත් එකයි.

7 ඔබට වෛර කරන්නට ලෝකයාට කිසි හේතුවක් නැත. එනමුත් මගේ වචනවලින් ඔවුන්ගේ දූෂණ හෙළිවන නිසා ඔවුහු මට වෛර කරති.

8 ඔබ හැම උත්සවයට යන්න. මා නම් මේ උත්සවයට දැන්ම යන්නේ නැත. තවමත් මගේ නිසි වෙලාව උදාවී නැතැ”යි පැවැසූහ.

9 එසේ පැවැසූ එතුමෝ, ගලීලයෙහි නැවතී සිටි සේක.

10 පසුව, සිය සෝවුරන් උත්සවය සඳහා පිටත්ව ගිය පසු එතුමාණෝද රහසිගතව එහි ගිය සේක.

11 යුදා නායකයෝ උත්සවයේදී එතුමන් සොයමින්, “කෝ ඔහු කොහේදැ?”යි විපරම් කළෝය.

12 ජන සමූහයා අතරේද යේසුස්වහන්සේ පිළිබඳ කසුකුසුවක් හට ගත්තේය. “හේ සත්පුරුෂයෙකැ”යි සමහරු කී අතර, “නැත, ඔහු ජනතාව මුළා කරන්නෙකැ”යි අන් සමහරු මත දැක්වූහ.

13 එහෙත් යුදා ප්‍රභූවරුන්ට ඇති බිය නිසා කිසිවෙක් ඒ ගැන එළිපිට නො දෙඩූහ.

## ඉහළින් එන අනුශාසන

14 උත්සවයෙන් අඩක් ගෙවුණු පසු දෙවි මැඳුරු මළුවට ඇතුළු වූ යේසුස්වහන්සේ ධර්මානුශාසනා කරන්නට වන් සේක.

15 ඒ දෙසුම් ඇසූ යුදෙව්වෝ විස්මපත් වී, “කිසි දවසක ශුද්ධ ලියවිලි හදාරා නැති මොහුට මේ සා දහම් දැනුමක් කොයින්දැ!”යි විපිළිසර වූහ.

16 යේසුස්වහන්සේ කරුණු පහදමින්, “මේ ධර්මානුශාසන මා එවූ දෙවියන්වහන්සේගෙන් එන ඒවා මිස මගේම ඉගැන්වීම් නො වෙයි.

17 දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නට යමකු සැබෑවටම අදහස් කරන්නේ නම්, ඔහු මේ අනුශාසනා දෙවියන්වහන්සේගෙන් පැමිණි ඒවාද නැති නම් මගේම ප්‍රබන්ධදැයි දැන ගනු ඇත.

18 තමාගේම මත හා අදහස් ගෙන හැර පා කථා කරන්නේ තමාගේම ගෞරවය සොයන අයයි. එහෙත් තමා එවූ තැනැන්වහන්සේගේ ගෞරවය සඳහා ක්‍රියා කරන්නා කිසි ප්‍රයෝගයක් නැති සත්‍යමය පුද්ගලයෙක්.

19 මෝසස් ඔබට නිති සංග්‍රහයක් දුන්නේ නැද්ද? ඔබ කිසිවකුත් ඒ නිති පිළිපදින්නේ නැතිව නීති කැඩුවේ යැයි මා මරන්ට තනන්නේ මන්දැ"යි ඇසූ සේක.

20 "ඔබට යක්ෂයෙක් වැහිලාද! කවුරුද ඔබ මරන්ට සොයන්නේ?"යි එවිට ඔවුහු පිළිතුරු දුන්හ.

21 යේසුස්වහන්සේ ඔවුන්ට කතා කරමින්, "මා කළ එක් හාස්කමකින්ම ඔබ හැම අන්ද මන්ද වෙලා.

22 මෝසස් ඔබට චර්මඡේද චාරිත්‍රයක් නියම කර තිබෙනවා නො වේද? (සැබවින්ම එය මෝසස්ට ඉහත සිටි ආදි පියවරුන්ගෙන් පැවත එන්නකි.) එනමුත් සබත් දවස්වලදී පවා දරුවන් චර්මඡේදන කැරේ.

23 හොඳයි. චර්මඡේදනයට නියමිත දවස සබත් දවසකදී යෙදුනහොත්, වැඩ වැරීමේ මෝසස්ගේ සබත් නීතිය කඩ නො වන්නට එම දවසේ චර්මඡේදනය කළ හැකි නම්, සබත් දවසක මිනිසකු සම්පූර්ණයෙන්ම සුවපත් කිරීම ගැන මා සමඟ උරණ වන්නේ ඇයි?

24 බැලූ බැල්මට පිටතින් පෙනෙන ලෙස නො ව සැබෑ ඇතුළාන්තය හරය අනුව විනිශ්චය කරන්නැ"යි පැවැසූ සේක.

## මොහු කවුරුද

25 මේ හේතුවෙන් යෙරුසලම් වාසී ඇතැමෙක් අදහස් දක්වමින්, "ඔවුන් මරන්නට සොයන්නේ මොහු නො වේද?

26 එනමුත් මෙන්න, ඔහු එළිපිටම දේශනා කරයි. කෝ! කවුරුවත්ම කථා නැත්තේ මෙතුමා සැබෑවටම ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ බව මහතැන්වල අයත් පිළිගෙනවත්ද?

27 හැබැයි, අප නම් අසා ඇත්තේ, පොරොන්දු වූ ක්‍රිස්තුස්වහන්සේ කොහි සිට එනවාද කියා කිසිවකුත් දැන නො ගන්නා බවයි. මොහු නම් කොහෙන් ආ කෙනක්දැයි අපි දනිමු"යි කීහ.

28 එවිට දෙව්මැදුරු මළුවෙහි දහම් දෙසමින් උස් හඬින් කථා කළ යේසුස්වහන්සේ, "හොඳයි, මා කවුරුන්ද කොතැනක සිට ආවාදැයි ඔබ දනිති. මගේම කැමැත්තෙන් මා ආවා නො වෙයි. මා එවූවේ සත්‍යතාව වන තැනන්වහන්සේයි. ඔබ උන්වහන්සේ හඳුනන්නේ නැත.

29 එනමුත් මා උන්වහන්සේ වෙතින් ආ නිසාත්, උන්වහන්සේ මා මෙහි එවූ නිසාත් මම උන්වහන්සේ හඳුනම්"යි වදාළහ.

30 එකල එතුමන් අත්අඩංගුවට ගැනීමට ඔවුහු වෙහෙස ගත් නමුදු කිසිවෙක් හෝ එතුමන්ට අත තැබුවේ නැත. එසේ වූයේ එතුමන් ඔවුන්ගේ අත්වලට හසු වීමේ නිසි මොහොත ඒ වන තුරුත් එළඹ නො තිබූ බැවිනි.

31 එසේ වුවද එතුමන් මත විශ්වාසය තැබූ ජන සමූහා අතරින් වැඩිදෙනෙක් අදහස් දක්වමින්, "ක්‍රිස්තුස්වහන්සේ පහළ වූවාම මේ මිනිසා කරනවාටත් වඩා හාස්කම් කරයිදැ?"යි පැවැසූහ.

32 එතුමන් පිළිබඳව ජනතාව අතරේ පැන නැඟුණු කසුකුසුව ඇසූ පරිසිවරු, නායක පූජකයින් හා එක්ව එතුමාණන් අල්ලාගෙන ඒම සඳහා මුර භටයින් යැවූහ.

33 යේසුස්වහන්සේ කථා කොට, “තව ස්වල්ප දවසකට පමණක් මා ඔබ අතරේ හිඳ, ඉන්පසු මා එවූ තැනැන්වහන්සේ වන දෙවියන්වහන්සේ වෙත යන්නෙමි.

34 එවිට ඔබ මා සොයනු ඇත. එනමුත් ඔබට මා දකින්නට ලැබෙන්නේ නැත. මා සිටින තැනට එන්නට ඔබට නුපුළුවනැ”යි පැවැසූ සේක.

35 යුදෙව්වන්ට මේ කථාව ප්‍රහෙලිකාවක් විය. එබැවින් ඔවුහු එකිනෙකා විමසමින්, “අපට සොයන්නට බැරි ලෙස කොහේ යන්නට මොහු සිතා සිටීද? ග්‍රීසියටවත් ගොස් එහි වෙසෙන අපේ මිනිසුන්ට දේශනා කරන්නට අර අඳිනවාද?

36 ''ඔබ මා සොයනු ඇත. එනමුත් ඔබට මා දකින්නට ලැබෙන්නේ නැත. මා සිටින තැනට එන්නට ඔබට නුපුළුවනැ’යි ඔහු කියන කථාවේ තේරුම කුමක්ද?”යි අසා ගත්හ.

37 උත්සවයේ අවසාන මහා දවසේදී නැඟී සිටි යේසුස්වහන්සේ මහ හඬින් කථා කොට, “පිපාස ඇති ඕනෑම කෙනෙක් මා වෙත ඇවිත් පානය කෙරෙත්වා !

38 මා කෙරෙහි අදහාගන්නාගේ ඇතුළාන්තයෙන් ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් පරිදි ජීවන ජල දහරා ගලා එන්නේයැ”යි දෙසූ සේක.

39 එතුමන් ඉන් අදහස් කළේ එතුමන් කෙරේ විශ්වාසය තැබූ අය මතු ලබන්නට සිටි ශුද්ධාත්මයාණන්වහන්සේ ගැනය. ශුද්ධාත්ම ප්‍රදානය සිදුවන්නේ යේසුස්වහන්සේ මෙලොව පහළ වීමේ අරමුණ සම්පූර්ණ වී එතුමාණන් යළි දිව්‍ය මහිමශ්‍රීයට පැමිණීමෙන් පසුවය. ඒ දේ මේ අවස්ථාව වන තුරුත් ඉටුව නොතිබුණෙන් ශුද්ධාත්මයාණන්ද ඒ තාක්ම නො දෙන ලද්දේය.

## දිවැස්වරයා.......?

40 එම කිතු වදන් ඇසූ සමහරෙක්, “සැබැවින්ම මෙතුමා අප බලාපොරොත්තුව සිටි දිවැස්වරයාණෝමයැ”යි පැවැසූ අතර

41 අන් සමහරු, “මුන්වහන්සේ ගැලැවුම්කාර ක්‍රිස්තුස්වහන්සේමයැ”යි කීහ. සෙසු අය අදහස් දක්වමින්, “ක්‍රිස්තුස්වහන්සේ ගලිලයකු වන්නේ කෙසේද?

42 ශුද්ධ ලියවිල්ලේ දැක්වෙන්නේ ක්‍රිස්තුස්වහන්සේ දවිත් රජ පරපුරෙන්, දවිත් පුර වන බෙත්ලෙහෙමෙන් එන බව නො වේදැ”යි තර්ක කළහ.

43 මෙසේ වන්දනාකාර ජනතාව අතරේ යේසුස්වහන්සේ පිළිබඳ මත භේදයක් හට ගත්තේය.

44 එතුමන් සිර භාරයට ගැනීම කොටසකගේ කැමැත්ත වුවත් කිසිවකු හෝ එතුමන්ට අත තැබුවේ නැත.

45 මුර සෙබලුන් හිස් අතින් ආපසු පැමිණි බව දුටු නායක පූජකවරු හා පරිසිවරු “කෝ! ඔහු අල්ලා ගෙන නාවේ මක්නිසාදැ”යි ඔවුන්ගෙන් ප්‍රශ්න කළහ.

46 ඔවුහු පිළිතුරු දෙමින්, “මේ මනුෂ්‍යයා කථා කරන විදියට කිසි කෙනෙක් කිසි දෙනක කථා කර නැතැ”යි කීහ.

47 එවිට, "කිමද? නුඹලාත් මුළා වුණාදැ"යි විමසූ පරිසිවරු,

48 "අපේ පරිසීන්ගෙන් හෝ නායකයින්ගෙන් එකම වැදගතෙක්වත් ඔහු පිළිගෙන තිබෙනවාද?

49 ඔහු පසු පස යන්නේ ආගම ධර්මය ගැන කිසිත්ම නො දන්නා මෝඩ රැළක්" යැයි කෝපයෙන් පැවැසූහ.

50 එවිට ඔවුන්ගේම සාමාජිකයකු වූ වරක් යේසුස්වහන්සේ හමුවීමට පැමිණි නිකදේමුස් කථා කොට,

51 "කරුණු හරි හැටි විමසා, වරදක් ඇතොත් මිස කෙනකු වරදකරුවකු ලෙස හැඳින්වීම අපේ ධර්ම නීතිවලට පටහැනි නො වේදැ"යි අදහස් දැක්වීය.

52 "මොකද? ඒ පැත්තට කථා කරන්නේ ඔබත් ගලිලයෙක්ද? ලියවිලි කියවා බලන්න. ගලිලයෙන් දිවැස්වරයකු නො එන බව එවිට ඔබටත් වැටහේවි"යි ඔවුහු පිළිතුරු දුන්හ.

53 ඉන් අනතුරුව සැවොම තම තමන්ගේ නිවෙස් බලා ගියහ.

# 8

## වරදෙහි බැඳුණු ස්ත්‍රිය

1 යේසුස්වහන්සේ ඔලිව කන්දට නැඟුණු සේක.

2 එහෙත් එතුමාණෝ පසුදා හිමිදිරි උදෙන්ම දෙව් මැදුර වෙත යළි පැමිණි සේක. එවිට සැදැහැවතුන් වටවී එතුමන් පිරිවරා ගත්තෙන්, එතුමෝ ඔවුන්ට ධර්මානුශාසනා කරන්නට වන් සේක.

3 ඒ අතර පර පුරුෂ සේවනයෙහි ගැලෙද්දී අසුවූ ස්ත්‍රියක අල්වා ගත් දහම් පඬිවරු හා පරිසිවරු ඇය ඇදගෙන විත්, සැමට පෙනෙන්නට සිටුවා,

4 යේසුස්වහන්සේ අමතමින්, “ආචාර්යතුමනි, අප මැය අල්ලා ගත්තේ පර පුරුෂ සේවනයේ ගැලෙද්දීමයි.

5 මෝසස්ගේ නීති සංග්‍රහයෙන් අපට අණ කර තිබෙන්නේ මේ වාගේ ගැහැණුන් ගල් ගසා මරා දමන්නයි. කොහොමද ඔබේ අදහස”යි ඇසූහ.

6 ඔවුන් එසේ ඇසුවේ එතුමන්ට එරෙහිව හේතුවක් අල්ලා ගැනීමේ උගුලක් වශයෙනි. එනමුත් යේසුස්වහන්සේ එය නෑසුනා සේ පහතට නැමී, ඇඟිල්ලකින් බිම යමක් ලියූ සේක.

7 ඔවුහු නැවත නැවතත් බල කරමින් විමසූ කල හිස ඔසවා ඔවුන් දෙස බැලූ යේසුස්වහන්සේ, “හොඳයි පවක් නො කළ ශුද්ධවන්තයා පළමු ගල ගසත්වා”යි පවසා,

8 නැවතත් නැමී ඇඟිල්ලෙන් බිම ලියූසේක.

9 ඒ ඇසූ ඔවුහු පරාජිතවී වැඩි මහල්ලා පටන් බාලයා දක්වා එකකු පස්සේ එකකු බැගින් හීන් සීරුවේ මඟ හැර ගියහ. යේසුස්වහන්සේ සමඟ ඉතිරිවූයේ ඒ වන තුරුත් සිටිවනම සිටි ඒ ස්ත්‍රිය පමණි.

10 යේසුස්වහන්සේ ඇය දෙස බලා, “කෝ, ඔවුන් කොහේද? කවුරුවත් ඔබට දඬුවම් කළේ නැද්ද”යි ඇසූ කල,

11 “නැත ස්වාමිනි”යි ඕ පිළිතුරු දුන්නාය. යේසුස්වහන්සේ ඇයට ඔවාදෙමින්, “මමත් ඔබට වරද නො තබමි. යන්න, හැබැයි ආයෙත් පවෙහ නො ගැලෙන්නැ”යි වදාළ සේක.

## වලංගු සාක්ෂිය

12 යේසුස්වහන්සේ යළිත් ජනතාව අමතමින්, “ලෝකයේ ආලෝකය මම වෙමි. මා අනුගමන කරන කවරෙක් වුවද භව අඳුරේ නො ගැලෙනවාත් හැර ජීවිතාලෝකයද ලබන්නේයැ”යි පැවසූ සේක.

13 එවිට, “ඔබ ගැන ඔබම සහතික කර ගැනීම වලංගු නැතැ”යි පරිසිවරු විරෝධය පෑහ.

14 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “මා කොතැනක සිට ආවාද කොතැනකට යනවාදැයි මා හොඳින්ම දන්නා නිසා මා ගැනම දෙන මගේ සාක්ෂිය වලංගුයි. එහෙත් මා කොතැනක සිට එනවාද කොතැනකට යනවාදැයි ඔබ දන්නේ නැත.

15 ඔබ විනිශ්චය කරන්නේ බොහෝ සීමිත මානව මිණුම්වලිනි. මම නම් කිසිවකුත් විනිශ්චය නො කරමි.

16 මා විනිශ්චය කළත් මගේ තීරණය සර්ව සාධාරණයි. මන්ද, මා තනියෙන් සිටිනවා නො ව මා එවූ පියාණන්වහන්සේද මා හා සිටින හෙයිනි.

17 “දෙදෙනෙක් එකඟත්වයෙන් දෙන සාක්ෂිය වලංගුය කියා ඔබගේ ධර්ම නීති සංග්‍රහයේ සඳහන් වෙයි.

18 මා ගැන සාක්ෂි දෙන එක සාක්ෂිකරුවෙක් වන්නේ මමයි. අනෙක් සාක්ෂිකරුවාණෝ මා එවූ පියාණන්වහන්සේයැ”යි පැවැසූ සේක.

19 “ඔබේ පියා කොතැනකදැ”යි එවිට ඔවුහු ඇසූහ. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “ඔබ මා හඳුනන්නේ නැත. මගේ පියාණන් හඳුනන්නේත් නැත. ඔබ මා හැඳින ගතහොත් මාගේ පියාණන්වහන්සේත් හඳුනා ගනු ඇතැ”යි පැවැසූ සේක.

20 යේසුස්වහන්සේ මෙසේ පැවසුවේ දේව මාලිගයේ පඬුරු ගබඩාව තුළදී කළ දහම් දෙසුමකදිය. එහෙත් කිසිවෙක් එතුමන් අත්අඩංගුවට ගත්තේ නැත. සැබවින්ම ඒ සඳහා නිසි වෙලාව තවමත් එළඹ තිබුණේ නැත.

## මම වෙමි

21 යේසුස්වහන්සේ තව දුරටත් කථා කරමින්, “දැන් ඉතින් ඔබෙන් සමු ගැනීමේ කාලය ළඟයි. මම ඉවත්ව යන්නෙමි. ඔබ කොතෙක් සෙවුවත් ඔබට මා හමු නො වෙයි. හේතුව නම් ඔබ ඔබගේම අකුසල් ඇතිව මිය යන බැවින් මා යන තැනට ඒමට ඔබට නුපුළුවන් වීමයැ”යි පැවැසූ සේක.

22 මින් අන්ද මන්ද වූ යුදෙව්වෝ, “අපට යන්නට බැරි තැනකට ඔහු යනවැයි කියන්නේ දිවි නසා ගැනීමටවත් යනවාදැ”යි ඔවුනොවුන්ගෙන් විමසන්නට වූහ.

23 එහෙත් යේසුස්වහන්සේ කරුණු පහදමින්, “ඔබ කවුරුන් පහළ මනු ලොව්හි: මා ඉහළ ස්වර්ගයෙනි. ඔබ අයිති මෙලොවටයි. මා මෙලොවට අයිති නැත.

24 ඔබ ඔබගේම අකුසල් ඇතිව මැරී යතැ යි මා කීවේ එබැවිනි. දෙවියන්වහන්සේ වෙතින් ආ ගැලවුම්කරු මා බව අදහා නො ගතහොත් සැබවින්ම ඔබ මිදීමක් නො ලබා ඔබේ අකුසල් සමඟ මිය යනු ඇතැ”යි කී සේක.

25 “සැබැවටම ඔබ කවුරුන්දැ”යි එවිට ඔවුහු ප්‍රශ්ණ කළහ. “මා කවුරුන්දැයි මුල පටන්ම ඔබට හඳුන්වා දුන් පරිදි, මම එම තැනැත්තාම වෙමි”යි පිළිතුරු දුන් යේසුස්වහන්සේ,

26 “ඔබට විරුද්ධව පැමිණිලි කරන්නටත්, තීන්දුවක් දෙන්නටත් ඕන තරම් කරුණු මට තිබේ. එනමුත් සත්‍යතාව නම් මා එවූ තැනැන්වහන්සේයි. මා ලෝකයට ප්‍රකාශ කරන්නේ උන්වහන්සේගෙන් අසා ඉගෙන ගත් දේමයැ”යි පැවැසූ සේක.

27 එතුමාණන් කථා කළේ ස්වකීය පියාණන්වහන්සේ ගැන බව වටහා ගැනීමට ඔවුහු අපොහොසත් වූහ.

28 එබැවින් යේසුස්වහන්සේ තව දුරටත් කථා කරමින්, “ඔබ මනුෂ්‍ය-පුත්‍රයා කුරුස ගසක එසවූ කල, මා 'මම වෙමි'යි කී තැනැත්තාම බවත්, පියාණන්වහන්සේ ඉගැන්වූ දේම දේශනා කළා මිස මගේම සහජ හැකියාවෙන් මා කිසිවක් නො කළ බවත් හොඳකාරව දැන ගන්නවා ඇති.

29 මා එවූ තැනැන්වහන්සේ මා සමඟයි. මා සැම විටම උන්වහන්සේ මනාප දේ කරන නිසා උන්වහන්සේ මා තනි කරන්නේ නැතැ"යි කී සේක.

30 යේසුස්වහන්සේ මෙසේ කී විට බොහෝ දෙනෙක් එතුමන් අදහා ගත්හ.

## වහලා හා පුත්‍රයා

31 එසේ අදහාගත් යුදෙව්වන් ඇමතූ යේසුස්වහන්සේ, "ඔබ මගේ වචනයෙහි පිහිටා ජීවත් වේ නම් සැබවින්ම ඔබ මගේ ගෝලයෝයි.

32 එවිට ඔබ සත්‍යය දැන ගන්නවාත් හැර ඒ සත්‍යය ඔබ නිවහල් කරනු ද ඇතැ"යි පැවසූ සේක.

33 "ආබ්‍රාහම්ගේ පරම්පරාවෙන් එන අප කිසිවකුටත් වහල්ව සිටියේ නැත. එහෙම නම් ඔබ කියන ඔය නිවහල්කම මොකක්දැ?"යි එවිට ඔවුහු තර්ක කළහ.

34 "මේ අහන්නැ"යි ඇමැතූ යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, "සත්තකින්ම මා ඔබට කියන්නේ, පව් කරන සියල්ලෝම පාපකර්මයාගේ වහලුන් බවයි.

35 වහලා පවුලේ නිත්‍ය සාමාජිකයකු ලෙස පිලිගැනීමක් නෑ. එනමුත් පුත්‍රයාට ඇති හිමිකම ස්ථිරයි. සදතනිකයි.

36 එබැවින් පුත්‍රයා ඔබ නිදහස් කරයි නම් ඒකාන්තයෙන්ම ඔබ නිවහල්.

37 ඔබ ආබ්‍රහම්ගෙන් පැවැතෙන්නන් බව මම දනිමි. එහෙත් තවමත් ඔබේ අදහස මා මරා දමන්නටයි. ඊට හේතුව මගේ වචනයට ඔබේ සිත් තුළ කිසි ඉඩක් නො මැතිකමයි.

38 මා පවසන්නේ මගේ පියාණන් ළඟ සිටියදී මා දුටු දේයි. එහෙත් ඔබ කරන්නේ ඔබේ පියාගෙන් ඔබ ඇසූ දේයැ"යි පවසත්ම,

39 "අපේ පියා ආබ්‍රහම්"යැයි ඔවුහු මොර දුන්හ. යේසුස්වහන්සේ නැවතත් කථා කරමින්, "පුතා කළ යුත්තේ අප්පා කළ දේයි. ආබ්‍රහම්ගේ දරුවෝ නම් ඔබත් ක්‍රියා කරන්නේ අබ්‍රහම් කළ පිළිවෙලටයි.

40 මා දෙවියන්වහන්සේගෙන් ඇසූ සත්‍යය ඔබට දැනුම් දුන් හේතුව නිසා ඔබ මා නසා දමන්නට හැදුවත්, ආබ්‍රහම් එසේ කළේ නැත.

41 සැබැවින්ම ඔබ ක්‍රියා කරන්නේ ඔබේ නියම පියාගේ සහජ ගති ලෙසටයැ"යි පවසත්ම ඔවුහු විරෝධය පාමින්, "අපි අවජාතයෝ නො වෙයි. අපට ඉන්නේ එකම පියෙක් පමණයි. අපේ පියාණෝ දෙවියන්වහන්සේයැ"යි ගෝෂා කළහ.

42 යේසුස්වහන්සේද කථා කරමින්, "දෙවියන්වහන්සේ ඔබගේ පියාණෝ නම්, දැන් මෙහි සිටින මා දෙවියන්වහන්සේ වෙතින් පැමිණි බැවින්, ඔබ මට ප්‍රේම කළ යුතු නො වේද? උන්වහන්සේ මා එවුවා මිස මගේ තනි කැමැත්තට මා ආවා නො වෙයි.

43 මෙතරම් පැහැදිළිව කියද්දීත් මගේ කථාව ඔබ වටහා නො ගන්නේ ඔබ මගේ වචන නො පිළිගන්නා නිසයි.

44 නුඹලාගේ පියා අන් කවරෙක්වත් නො වෙයි. යක්ෂයායි. නුඹලා යන්නේ නුඹලාගේ පියාගේ අඩි පාරෙයි. යක්ෂයා පටන් ගැන්මේ සිටම මිනී මරන්නෙක්: සැබෑවේ හතුරෙක් අමු බොරු කාරයෙක්. බොරුවේ පියා ඔහු නිසා බොරු කීම ඔහුගේ සහජ ගතියයි.

45 එනමුත් මා සත්‍යය කථා කරන බැවින් ඔබ මා කෙරෙහි විශ්වාසය නො තබති.

46 මා පවක් හෝ වරදක් හෝ කළැයි චෝදනා කරන්නට ඔබ කිසිවකුට හෝ පුළුවන්ද?

47 දේව දරුවෙක් නම් දෙවි පියාණන්ගේ වචනවලට ඕනෑකමින් සවන් දෙයි. ඔබ ඊට සවන් නො දෙන්නේ ඔබ උන්වහන්සේගේ දරුවන් නො වන නිසායැ"යි පැවැසූ සේක.

46 "මිත්‍යා දෘෂ්ටිකයා"යි කෑ ගැසූ යුදෙව්වෝ, "ඒයි සමාරියයා, අප කිව්වේ බොරුද? නුඹට නම් යක්ෂයෙක් වැහිලා"යි හඬ තැලූහ.

49 "මට වැසී ඇති යක්ෂයෙක් නැතැ"යි පිළිතුරු දුන් යේසුස්වහන්සේ "ඔබ මට නිගරු කළත් මම මගේ පියාණන්වහන්සේට ගෞරව දෙන්නෙමි.

50 මගේම ගෞරවය සඳහා මා වෙහෙසෙන්නේ නැති නමුත්, මගේ ගෞරවය ගැන සැලකිලිමත් වන්නේ පියාණන්වහන්සේයි. විනිශ්චය උන්වහන්සේ සතුයි.

51 සත්තකින්ම මම ඔබට කියන්නම්: මගේ වචනයෙහි පිහිටන කිසිවෙක් කිසිකලෙක ජරා මරණයට පත් නො වේයැ"යි පැවැසූ සේක.

52 "දැන් නම් කිසි සැකයක් නැතිවම අප දන්නවා ඔබට යක්ෂයකු වැහිලාම තමයි"යි ප්‍රති උත්තර දුන් යුදෙව්වෝ, "නැතිනම් දේවාසිරි ලැබූ ආබ්‍රහම්නුත්, දේව පණිවුඩ ගෙනා දිවැස්වරුන්නුත් මැරුණු කොට ඔබේ වචන පිළිපදින්නා නො මැරේ යයි කියන්නේ කෙසේද?

53 අපේ ජාතියේ පියාවූ ආබ්‍රහම්ටත් වඩා උත්තමයෙක්ද ඔහේ? ආබ්‍රහම්නුත් මැරුණි. දිවැස්වරුනුත් මැරුණාහ. ඔහේ කවුරුන් කියලද හිතා ඉන්නේ?"යි සමච්චල් කළහ.

54 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මම මා ගැනම ආත්ම වර්ණනා කර ගන්නෙම් නම් ඒ ගෞරවය නො වටිනා එකක්. එසේ වුවත් මා ගෞරවයට පමුණුවන්නේ ඔබ ඔබගේ දෙවියන්වහන්සේ යයි හඳුන්වන මගේ පියාණන්වහන්සේයි.

55 ඔබ උන්වහන්සේ හඳුනන්නේ නැති නමුත් මම උන්වහන්සේ හොඳින් හඳුනමි. මා උන්වහන්සේ හඳුනන්නේ නැතැයි කීවොත් මාත් ඔබ හා සමාන බොරුකාරයෙක් වේවි. මම උන්වහන්සේ හඳුනනවා පමණක් නොව උන්වහන්සේගේ අණ පණත්ද සතුටින් පිළිපදින්නෙමි.

56 මා ලොව පහළ වන දවස දකින්නට ආශාවෙන් පුල පුලා සිටි ඔබේ පියා වූ ආබ්‍රහම් එය දැක ප්‍රීතියෙන් ඉපිල ගියේයැ"යි පවසත්ම,

57 "තවම අවුරුදු පණහක්වත් නැති ඔබ ආබ්‍රහම් දුටුවාදැ"යි යුදෙව්වෝ ඇසූහ.

58 "සත්තකින්ම මම ඔබට කියන්නම් "කියමින් පිළිතුරු දුන් යේසුස්වහන්සේ, "ආබ්‍රහම් උපදින්නටත් පෙර සිට මම වෙමි"යි වදාළ සේක.

59 එකෙණෙහිම යුදෙව්වෝ එතුමන්ට ගසනු පිණිස ගල් අවුලා ගත් නමුත්, යේසුස්වහන්සේ ඔවුන්ගෙන් මුවා වී දෙවි මැදුරු බිමෙන් බැහැර වූ සේක.

# 9

## අපූරු වෙදකම

1 වරක් යේසුස්වහන්සේ මග ඇවිද යන අතර උපතින්ම අන්ධ වූ මිනිසකු දුටු සේක.

2 එවිට ගෝලයෝ එතුමන් අමතා, "ගුරු හිමියනි, මොහු අන්ධව උපන්නේ මොහුගේ කර්මය නිසාද? නැතහොත් මොහුගේ මා-පියන් කළ අකුසල් නිසාදැ"යි විමසූහ.

3 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මෙසේ වී ඇත්තේ මොහු හෝ මවු පියන් හෝ කළ පාප නිසා නො වෙයි. දෙවියන්වහන්සේගේ බලය ඔහු තුළ ප්‍රදර්ශණ වීම සඳහායි.

4 දැන් දහවල්ව තිබෙද්දී මා එවූ තැනැන්වහන්සේගේ සේවයේ අප යෙදිය යුතුයි. රාත්‍රියත් ළඟ ළඟම එයි. එවිට කිසිවකුටත් වැඩ කරන්නට බැරි වෙයි.

5 මා මෙලොවෙහි සිටින තුරු ලෝකයේ ආලෝකය මම වෙමි"යි වදාළ සේක.

6 යේසුස්වහන්සේ එසේ කියා, බිමට කෙළ ගසා, එයින් මඩ සාද, ඒවා අන්ධ මිනිසාගේ ඇස්වල ගා,

7 "සිලෝවම් පොකුණට ගොස් සෝද ගන්නැ"යි පැවැසූ සේක. (සිලෝවම් යන හේබ්‍රෙව් වචනයේ අර්ථය එවන ලද්දේය යනුයි) ඔහුද ගොස්, සෝද පෙනීම ලැබ ආයේය.

8 එකල අසල්වාසීහුද ඔහු සිඟමන් ඉල්ලනු දැක තිබූ අයද අදහස දක්වමින්, "මේ අර හිඳගෙන සිඟා කෑ මිනිහා නො වේද?"යි විමසූහ.

9 සමහරු "මේ ඔහුමයැ"යි ද තවත් සමහරු, "මොහු හරියට ඔහු වගේමයැ"යි ද පැවසූ විට ඒ මිනිසා ස්ව කැමැත්තෙන්ම කථා කරමින්, "ඒ මා තමා"යි ප්‍රකාශ කළේය.

10 "ඕ! එහෙම නම් කෙසේද ඔබේ ඇස් ඇරුණේ"යි එවිට ඔවුහු ඇසූහ.

11 ඔහු පිළිතුරු දෙමින්, "අර යේසුස් කියන මැතිතුමා මඩ සාද, මගේ ඇස්වල ගා, සිලොවම් පොකුණෙන් සෝද ගන්නැයි මට කීවා, මා ගොස් සෝද ගත්තාම පෙනීම ලැබුණා"යි කීවේය.

12 "කෝ, ඔහු කොහේදැ"යි ඔවුන් විමසූ කල, "මා දන්නේ නැහැ"යි ඔහු පිළිතුරු දුන්නේය.

13 එවිට ඔවුහු ඒ මිනිසා පරිසිවරුන් වෙත ගෙන ගියහ.

## අන්ධයාගේ පලහිලවුව

14 යේසුස්වහන්සේ මඩ සාද ඔහුගේ ඇස් පෑදුවේ සබත් දවසකදීය.

15 එවිට පරිසිවරුද, "පෙනීම ලැබුණේ කෙසේදැ'යි ඔහුගෙන් විමසූ කල, ඔහු පිළිතුරු දෙමින්, "එතුමා මගේ ඇස්වල මඩ තැවරුවා, මා සෝද ගත්තා, දැන් මට පෙනෙනවා"යි කීවේය.

16 "එහෙනම් සබත් විනය කඩ කරන මේ පුද්ගලයා දෙවියන්වහන්සේ වෙතින් ආවා වෙන්නට බැරියැ"යි පරිසින්ගෙන් ඇතැමෙක් පැවැසූ අතර, "පව්කාර මනුෂ්‍යයකුට නම් මෙබඳු හාස්කම් කරන්නට බැරියැ"යි අන් සමහරු පැවැසිය. මෙසේ ඔවුහු දෙපිළකට බෙදුණහ.

17 එබැවින් අන්ධව සිටි මිනිසා යළි ඇමතූ ඔවුහු, "හොඳයි ඔහු පෙනීම දුන්නේ ඔබටයි. ඔහු ගැන ඔබේ අදහස කුමක්දැ"යි ඇසූහ. "එතුමෝ දිවැස්වරයෙකැ"යි ඔහු වහා පිළිතුරු දුන්නේය.

18 එහෙත්, ඔහුගේ මවු-පියන්ගෙන් විමසන තුරු, ඔහු අන්ධව සිට පෙනීම ලද බව පිළිගැනීමට මැළි වූ යුදෙව්වෝ, ඔවුන් දෙපොළ ගෙන්වා,

19 “අන්ධව උපන්නැයි කියන නුඹලාගේ පුත්‍රයා සැබෑවටම මොහුද? එසේ නම් ඔහුට පෙනීම ලැබී ඇත්තේ කෙසේදැ” ප්‍රශ්න කළහ.

20 මාපිය දෙදෙන පිළිතුරු දෙමින් “මේ අපේ පුතා බව අපි දනිමු. ඔහු අන්ධව උපන් බවත් අපි දනිමු.

21 එනමුත් දැන් ඔහුට පෙනෙන්නේ කොහොමද, කවුරු පෙනීම දුන්නද කියන වග නම් අපි නො දනිමු. ඔහු වයස් පිරුණු කෙනෙකි. තමන් ගැන උත්තර දෙන්නට ඔහුට පුළුවනි. ඔහුගෙන්ම අසන්නැ”යි කීහ.

22 ඔවුන් දෙදෙන එසේ කීවේ යුදෙව්වන්ට බිය වූ නිසාය. යේසුස්වහන්සේ ගැලවුම්කරුවාණන් ලෙස දේවාභිෂේක ලත් ක්‍රිස්තුස්වහන්සේ බවට පිළිගන්නා කවරකු වේවා සිනගෝග නමින් හැඳින්වුනු ධර්ම සභා සාමාජිකත්වයෙන් නෙරපා දමන බවට ඒ වන විටත් යුදෙව්වන් විසින් සම්මත කොට තිබිණි.

23 ’ඔහු වයස් පිරුණු කෙනෙක්, තමන් ගැන උත්තර දෙන්නට ඔහුට පුළුවනැ’යි ඔවුන් කීවේ එබැවිනි.

24 අන්ධව සිටි මිනිසා දෙවන වතාවටද ඉදිරියට කැඳවූ ඔවුහු, “ඇත්ත කියා දෙවියන්වහන්සේට ගෞරව දක්වනවා හොඳයි. මේ පුද්ගලයා අසත්පුරුෂයකු බව අපි දනිමු”යි කීහ.

25 ඔහු පිළිතුරු දෙමින්, “එතුමා අසත්පුරුෂයකු ද නැද්ද කියා මා දන්නේ නෑ. නමුත් සිකුරටම එකක් දන්නවා. මා අන්ධව සිටියා. ඒත් දැන් මට අපූරුවට පෙනෙනවා”යි කීවේය.

26 එවිට ඔවුහු ඔහු අමතා, “හොඳයි, ඔහු නුඹට මොනවද කළේ? ඔහු නුඹේ ඇස් පෑදුවේ කොහොමදැ”යි ඇසූහ.

27 ඔහුද පිළිතුරු දෙමින්, “මා දැං වරක් කී නමුත් මා කී දේ ඔබ ඇසුවේ නෑ. ආයෙත් ඔය ගැන හාර හාර අහන්නේ ඔබත් එතුමන්ගේ ගෝලයින් වෙන්ට කැමැත්තෙන්දැ”යි අසත්ම,

28 ඔහුට බැණ වැදුණු ඔවුහු, “නුඹයි ඔහුගේ ගෝලයා, අපි නම් මෝසස්ගේ ගෝලයෝයි.

29 දෙවියන්වහන්සේ මෝසස්ට කථා කළ බව කවුරුත් දන්නවා. එනමුත් මේ මිනිහා කොහෙන් ආවාද කියලවත් අප දන්නේ නැතැ”යි කීහ.

30 “ඒක මහ පුදුම කථාවක්නේ”යි පිළිතුරු දුන් ඒ මනුෂ්‍යයා, “එතුමා මගේ ඇස් පෑදුවා, ඒත් එතුමා ආවේ කොහෙන්ද කියා ඔබ දන්නේ නෑ!

31 දෙවියන්වහන්සේ අසත්පුරුෂයින්ගේ කන්නලව් අහන්නේ නැති බව අප දන්නවා. එනමුත් උන්වහන්සේට විශ්වාසවන්තව වැඩ කරන ශ්‍රද්ධාවන්තයින්ගේ ඉල්ලීම ඉෂ්ට කරන බව කවුරුත් දන්නවා.

32 උපන් ගෙයි පටන් අන්ධව සිටි කෙනකුට පෙනීම දීමක් ගැන නම් ලෝකාරම්භයේ පටන් නැසූ දෙයක්.

33 දෙවියන්වහන්සේ වෙතින් නාවා නම් මෙතුමන් මෙපමණ දෙයක් කරන්නේ කොහොමදැ”යි ඇසුවේය.

34 “පව්කාර හිඟන්නා, උඹ එනවාද අපට උගන්වන්නැ”යි බැණ වැදුණු ඔවුහු ඔහු පන්නා දැමූහ.

35 ඔවුන් ඔහු නෙරපා දැමූ බව යේසුස්වහන්සේට සැල වූ පසු ඔහු හමුවූ එතුමාණෝ, “ඔබ මනුෂ්‍ය-පුත්‍රයාණන් කෙරෙහි විශ්වාසය තබනවාදැ”යි ඇසූ සේක.

36 “අනේ ආයුබෝවන්, කෝ! උන්වහන්සේ කවුරුද? මට කියන්න මං විශ්වාසය තබනවා”යි එවිට ඔහු විමසුවේය.

37 “දැන් ඔබේ ඇස්වලින් දකින්නේත්, ඔබ හා කථා කරන්නේත් එතුමාණන්යැ”යි යේසුස්වහන්සේ කියත්ම,

38 “ස්වාමීනි, මම විශ්වාස කරමි”යි කියමින් ඔහු යේසුස්වහන්සේට වැඳ නමස්කාර කළේය.

39 යේසුස්වහන්සේ කථා කරමින්, “මා මෙලොවට ආවේ නොපෙනෙන අයට පෙනීම දීමටත්, පෙනෙනවාය’යි සිතන අයගේ අන්ධ භාවය පෙන්වා දීමටත් ලොව විනිශ්වයකරුවාණන් හැටියටයැ”යි පැවැසූ සේක.

40 ඒ අසා, “මොනවා!”යි විමසූ පරිසින් කිහිප දෙනා, “අපිත් අන්ධයෝදැ”යි ඇසූහ.

41 යේසුස්වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින්, “අන්ධව සිටියා නම් ඔබ වැරදිකරුවන් නොවන්නට තිබිණි. එනමුත් පෙනෙනවායැයි කියමින් බැඳිවලම යන නිසා ඔබට නිදහසට කරුණු ඇත්තේම නැතැ’යි පැවැසූ සේක.

# 10

## එඬේරා හා සොරා

1 "සත්තකින්ම මම ඔබට කියන්නම් දොරටුවෙන් ඇතුළු නො වී අන් තැනෙකින් බැටළු ගාලට රිංගා එන්නා සොරෙක් හා මංකොල්ලකාරයෙකි.

2 දොරටුවෙන් ඇතුළුවන පුද්ගලයා රැළේ එඬේරායි.

3 එඬේරාට ඇතුළු වීමට දොරටුපාලයා දොර හැර දෙයි. ඔහු අමතන තුරු බැටළුවෝද සවන් දී ගෙන සිටිති. ඔහු තමන්ගේම බැටළුවන්ට උන්ගේ නම් කියා හඬගසා උන්ට පිටතට යෑමට මඟ පෙන්වයි.

4 මෙසේ තමන්ගේ මුළු බැටළු රැළම පිටතට ආ පසු, ඔහු උන්ට පෙරටුවෙන් යයි. බැටළුවෝද ඔහුගේ හඬ හඳුනන බැවින් ඔහු පසු පස්සේම යති.

5 එහෙත් උහු අමුත්තකු පසු පස්සේ යන්නේ නැතිවා පමණක් නොව, එවැන්නකු කෙරෙන් ඉවතට පැන දුවති. එසේ වන්නේ අමුත්තන්ගේ හඬ උන්ට නුහුරු නුපුරුදු බැවිනි.

6 යේසුස්වහන්සේ මේ උපමාව පැවසූ නමුත් එතුමන් ඉන් අදහස් කළේ කුමක්දැ"යි ඔවුන්ට වැටහුණේ නැත.

7 යේසුස්වහන්සේ යළිත් ඔවුන් අමතමින්, "සත්තකින්ම මම ඔබට කියන්නම්, බැටළුවන්ට දොරටුව මම වෙමි.

8 එඬේරුන් යයි කියා ගනිමින් මට කලින් ආ සියල්ලෝ සොරු හා මංකොල්ලකරුවොයි. එහෙත් බැටළුවෝ ඔවුන්ට ඇහුම්කන් නො දුන්හ.

9 දොරටුව මම වෙමි. යමෙක් මා තුළින් ඇතුළු වේ නම් ඔහුට රැකවරණයත්, ඇතුළට හා පිටතට යෑමේ නිදහසත් රිසි අහරත් ලැබෙනු ඇත.

10 සොරා එන්නේ සොරකම් කරන්නට, මරන්නට හා විනාශ කරන්නට පමණි. එනමුත් මා ආවේ ඔවුන්ට ජීවනය දෙන්නටයි. සැබවින්ම ! සියල්ලෙන් සපිරි ජීවනයක් දෙන්නටයි.

11 යහපත් බැටළු එඬේරා මම වෙමි. බැටළුවන් උදෙසා තමන්ගේ ජීවිතය පූජා කරන්නේ යහපත් එඬේරායි.

12 එහෙත් කුලීකරුවා එසේ නො වෙයි. ඔහු එඬේරාවත්, බැටළු හිමියාවත් නො වන නිසා වෘකයකු එනවා දුටුවොත්, ඔහු කරන්නේ රැළ අත්හැර පලා යෑමයි. එවිට වෘකයා කඩා පැන, බැටළුවන් සී සී කඩ විසුරුවා දමයි.

13 ඔහු එසේ පලා යන්නේ කුලීකරුවා තම කුලිය ගැන මිස බැටළුවන් ගැන කිසි තැකීමක් නැති බැවිනි.

## දෙපිළ බෙදුණු යුදෙව්වෝ

14 යහපත් එඬේරා මම වෙමි. මම මගේ බැටළුවන් හඳුනමි. මාගේ බැටළුවෝද මා හඳුනති.

15 ඒ හැඳිනීම පියාණන්වහන්සේ මා ද මා පියාණන්වහන්සේද හඳුනන ලෙසින්මය. මාගේ බැටළුවන් වෙනුවෙන් මම මගේ ජීවිතය පූජා කරමි.

16 මේ රැළට අයිති නැතත් තවත් බැටළුවෝ මට සිටිති. මා ඔවුන්ද ගෙන ආ යුතුයි. ඔවුන්ද මගේ හඬට සවන් දෙනු නියතයි. එසේ, එකම එඬේරෙක් යටතේ එකම රැළක් වනු ඇත.

17 පියාණන්වහන්සේ මට ප්‍රේම කරන්නේ මරණින් නැගිටිනු පිණිස මා මගේ දිවි පුදන නිසායි.

18 කිසිවෙක් මගේ දිවි පැහැර ගන්නවා නො වේ. මා එය පුජා කරන්නේ මගේම කැමැත්තෙනි. එය පුජා කිරීමේ බලයත්, නැවත ගැනීමේ බලයත් මට හිමිය. මේ ආඥාව මා ලද්දේ මගේ පියාණන්වහන්සේගෙනි"යි දෙසූ සේක.

19 යළිත් වරක් යුදෙව්වන් අතර මත ගැටුමක් ඇති කරන්නට මේ කථාව තුඩු දුන්නේය.

20 ඔවුන් අතරින් බොහෝ දෙනෙක්, "මොහුට හොඳටම පිස්සු, යක්ෂයෙක් වැහිලා. මේවා ඇසීමෙන් කවර ප්‍රයෝජනයක්ද"යි කී අතර,

21 සෙස්සෝ ඊට එරෙහිව, "අපට පෙනෙන විදියට මේක යක්ෂයෙක් වැහුණු කෙනකුගේ කථාවක් නො වෙයි. අන්ධ ඇස් පාදන්නට යක්ෂයකුට පුළුවන්දැ"යි තර්ක කළහ.

## දෙගිඩියාව

22 යෙරුසලම්හිදි පැවැත්වෙන කැප කිරීමේ පූජෝත්සව දවස් පැමිණියේය. ඒ ශීත සෘතුවය.

23 යේසුස්වහන්සේ දේව මාලිගයේ සලමොන් මළුවහි සක්මන් කරමින් සිටි සේක.

24 එවිට එතුමන් වටකර ගත් යුදෙව්වෝ, "තව කොතෙක් කලක් අප දෙගිඩියාවෙන් තියන්නද කල්පනාව? ඔබ ක්‍රිස්තුස්වහන්සේ නම් කෙළින්ම අපට කියන්නැ"යි ඉල්ලා සිටියහ.

25 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "සහසුද්දෙන්ම මා ඔබට කී නමුත් විශ්වාස නො කරන්නේත් ඔබමයි. මාගේ පියාණන්ගේ නාමයෙන්, එනම් දිව්‍යම බලයෙන් මා කළ දේවල්ම මා කවුරුන්දැයි සාක්ෂි දෙයි.

26 ඔබ මා විශ්වාස නො කරන්නේ ඔබ මගේ රැළේ බැටළුවන් නො වන නිසයි.

27 මගේ බැටළුවෝ මට සවන් දී මගේ වචන පිළිගනිති. මමත් ඔවුන් හඳුනමි. ඔවුහු මා පසු පස්සේ එති.

28 මම ඔවුන්ට අමර ජීවනය සලසා දෙමි. ඔවුහු ජාති ජරා මරණයට පත් නො වෙති. මගේ අතින් ඔවුන් උදුරා ගන්නට කිසිවකුටත් නො හැක.

29 ඔවුන් මට දුන් මගේ පියාණන්වහන්සේ සැම සියල්ලන්ටම වඩා ඉහළයි. උන්වහන්සේගේ අතින් ඔවුන් පැහැර ගත හැකි කිසි සමතෙක් නැත.

30 මමත් පියාණන්වහන්සේත් එකයැ"යි වදාළ සේක.

## දෙව්වරු

31 යුදෙව්වෝ යළිත් ගල් අහුලා ගත්තේ එතුමන්ට ගසන පිණිසය.

32 එහෙත් යේසුස්වහන්සේ කථා කොට, "පියාණන්වහන්සේගේ මඟ පෙන්වීමෙන් මම කොතෙකුත් අගනා දේ කළෙමි. ඔබ මට ගල් ගසන්නට යන්නේ ඒ කුමන යහපත් ක්‍රියාව නිසාදැ"යි ඇසූ සේක.

33 යුදෙව්වෝ පිළිතුරු දෙමින්, "අප ගල් ගසන්නේ හොඳක් කළාට නො වෙයි. නිකම්ම මිනිසකු වන ඔහේ දෙවියන්වහන්සේය කියා ගනිමින් කළ දේව අපහාසය නිසායැ"යි කීහ.

34 "යේසුස්වහන්සේද කරුණු පහදමින්, "ඔබ දෙවිවරුය මම කීවෙමි" කියා ශුද්ධ ලියවිල්ලේ ලියා නැද්ද?

35 ලියවිල්ල ප්‍රතික්ෂේප කළ නො හැකියි. ඉතින් දෙවියන්වහන්සේගේ වචනය ලැබූවන්ට දෙවිවරු යයි දෙවියන්වහන්සේම කීවා නම්,

36 පියාණන්වහන්සේම තෝරා වෙන් කොට ලොවට එවූ තැනැත්තා වන මම දේව පුත්‍රයාය කීම දේව අපහාසයක් වන්නේ කොහොමද?

37 පියාණන්වහන්සේ කළ ආකාරයෙන්ම මා වැඩ නො කරනවා නම් මා විශ්වාස නො කළාට කමක් නැත.

38 එනමුත් මා එලෙස ක්‍රියා කරයි නම්, ඔබට මා ගැන විශ්වාසයක් නැතත් අඩු වශයෙන් මා කරන සත් ක්‍රියා ගැන විශ්වාස කරන්න. එවිට පියාණන්වහන්සේ මා තුළත්, මා පියාණන්වහන්සේ තුළත් සිටින බව ඔබ සැමට දැන ගන්නට ලැබේයැ"යි පැවැසූ සේක.

39 ඔවුහු නැවතත් එතුමන් අල්ලා ගැනීමට තැත් දැරූ නමුත් යේසුස්වහන්සේ ඔවුන්ගෙන් මිදී ඉවත්ව ගිය සේක.

40 යොර්දන් නදියෙන් එතෙරව ගිය යේසුස්වහන්සේ, ඉහතදී යොහන් බව්තීස්ම සිදු කළ ස්ථානයට යළි පැමිණ, එහි නැවතී සිටි සේක.

41 "යොහන් කිසි හාස්කමක් සිදු නො කළත් මෙතුමන් ගැන ඔහු කී සියල්ල සැබෑයැ"යි එතුමන් වෙත පැමිණි බොහෝ දෙනා පැවසූහ.

42 එහිදී බොහෝ දෙනෙක් යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගත්හ.

# 11

## යේසුස්වහන්සේගේ හිතවතුන්

1 මරියා හා මාර්තා යන සොහොයුරියන් දෙදෙන සමඟ බෙතානි ගම්මානයෙහි විසූ ලාසරස් නැමැත්තෙක් රෝගීව සිටියේය.

2 රෝගීව සිටි ලාසරස්ගේ සොහොයුරිය වූ මේ මරියා, වරක් සුවඳ පැනින් ස්වාමින්වහන්සේගේ පා දෝවා, සිය කෙස් වැටියෙන් පිසදැමූ තැනැත්තියමය.

3 "ස්වාමීනි, ඔබේ හිතවතා රෝගීව සිටීයැ"යි සහෝදරියෝ දෙදෙන යේසුස්වහන්සේට දන්වා යැවූහ.

4 ඒ ඇසූ යේසුස්වහන්සේ, "මේ රෝගයේ කෙළවර මරණය නො වෙයි. එය දෙවියන්වහන්සේගේ මහිමශ්‍රීය සඳහායි. ඒ මඟින් දේව පුත්‍රයාණන් තේජශ්‍රීයට පැමිණෙනු ඇතැ"යි පැවැසූ සේක.

5 යේසුස්වහන්සේ මාර්තාටද ඇගේ සෝවුරියටද ලාසරස්ටද ප්‍රේම කළ සේක.

6 එසේ වුවත් ලාසරස් රෝගී වූ පුවත ඇසූ කල එහි යෑමට ඉක්මන් නො වී, සිටි ස්ථානයෙහිම තවත් දෙදිනක් නැවතී සිටි සේක.

7 අනතුරුව සිය ගෝලයින් ඇමැතූ එතුමාණෝ. "ආයෙත් යුදා දේශය පැත්තේ යමු"යි යෝජනා කළ සේක.

8 එහෙත් ගෝලයෝ ඊට අදි මදි කරමින්, "ගුරු හිමියනි, යුදෙව්වන් ඔබ මරන්නට හැදුවේ මේ ඊයේ පෙරේද නො වේද? ඉතිං ආයෙත් එහි යනවාදැ"යි ඇසූහ.

9 යේසුස්වහන්සේ උත්තර දෙමින්, "දහවල දොළොස් පැයක් පුරා තියෙනවා නො වේද? දහවලේදී මෙලොව එළිය තිබෙන නිසා කෙනකුට අවහිරයක් නැතිව ඇවිදින්නට පුළුවනි.

10 එනමුත් ඔහු රාත්‍රියේ ඇවිදිනවා නම් මඟ බලා ගැනීමට එළියක් නැති නිසා ඔහු පැකිළේයැ"යි කී සේක.

11 එසේ පැවැසූ යේසුස්වහන්සේ යළිත් කථා කරමින්, "සැතපී සිටින අපේ හිත මිත්‍ර ලාසරස් පුබුදුවන්නට මා යන්න ඕනෑ"යි කී සේක.

12 "ස්වාමීනි, සැතපී ඉන්නවා නම් ඔහු සුවපත් වේවි"යි ගෝලයෝ පැවැසූහ.

13 යේසුස්වහන්සේ ව්‍යාංගයෙන් කීවේ ලාසරස්ගේ මරණය පිළිබඳව වුවද, ගෝලයින් සිතුවේ ඔහු සුව පහසුව නිසා සිටිතැයි කියාය.

14 එබැවින් යේසුස්වහන්සේ කරුණු පහදමින්, "ලාසරස් මිය ගොසින්,

15 එසේ වුවත්, ඔබේ ඇදහිල්ල ගැන සලකා, මා එහි නොසිටි එක ගැන ඔබ නිසා මම සතුටු වෙමි. එහෙත් ඔහු බලන්න යමු"යි කී සේක.

16 එවිට, නිවුන්නා නම් ලත් තෝමස් අනෙක් ගෝලයින් අමතා "අපිත් මෙතුමන් එක්ක මරු කටට වුවත් යමු"යි කීවේය.

## මරණින් නිඟිටුවන්නා

17 ඔවුන් බෙතානියට ළඟා වූ විට ලාසරස් සොහොන් ගත කර සිවු දිනක් බව යේසුස්වහන්සේ දැන ගත් සේක.

18 බෙතානිය පිහිටියේ යෙරුසලමට කිලෝ මීටර් තුනක් පමණ නුදුරින් බැවින්,

19 සොයුරු වියොවින් පෙළෙන මාර්තා හා මරියා සනසනු පිණිස යුදෙව්වරු බොහෝ දෙනෙක්ද එහි පැමිණ සිටියහ.

20 යේසුස්වහන්සේ මඟ එන බව දැනගත් කල, මාර්තා එතුමන් හමුවීමට පෙර මඟට ගියාය. මාරියා නිවසෙහිම නැවති සිටියාය.

21 මාර්තා යේසුස්වහන්සේ අමතමින්, "අනේ ස්වාමිනි, ඔබතුමා මෙහි සිටියා නම් මගේ සහෝදරයා මරණින් බේරා ගන්න තිබුණා,

22 දැන් වුවත් ඔබතුමා යමක් ඉල්ලා සිටියොත්, දෙවියන්වහන්සේ එය ඉටු නො කර සිටින්නේ නැති බව මා දන්නවා"යි කීවාය.

23 "ඔබේ සහෝදරයා යළි නැඟිටිනු ඇතැ"යි යේසුස්වහන්සේ පැවසූ සේක.

24 "මළවුන් නැඟිටින කල්පාවසාන දවසේදි ඔහුත් නැවත නැඟිටින බව මා දන්නවා"යි මාර්තා උත්තර දුන්නාය.

25 "මරණින් නැඟිටීමත්, ජීවනයත් මම වෙමි"යි ඇයට පැවසූ යේසුස්වහන්සේ, "මා කෙරෙහි අදහගන්නාහු මැරුණත් යළි ජීවනය ලබති.

26 ජීවත්ව සිටින කවුරුන් හෝ වේවා මා කෙරෙහි අදහා ගතහොත් ඔහු කිසි දිනක නො මැරෙයි. එය ඔබ විශ්වාස කරනවාදැ"යි ඇසූ සේක.

27 ඕ පිළිතුරු දෙමින්, "එහෙමයි ස්වාමිනි, ඔබතුමා දේව පුත්‍රයාණන් බවත්, මෙලොවට එන්නට සිටි දේවාභිෂේක ලත් තැනැන්වහන්සේ බවත්, ලොව ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේ බවත් මම මුළු සිතින්ම විශ්වාස කරමි"යි පැවැසුවාය.

## සංවේගී අවස්ථාවක්

28 මෙසේ පැවැසූ ඕ ආපසු ගොස්, සිය සෝවුරිය පසෙකට කැඳවා, "ගුරු හිමියන් ඇවිත් සිටියි. එතුමා ඔබට කථා කරනාවයැ"යි රහසින් කීවාය.

29 ඒ ඇසූ කල වහා නැගී සිටි මරියා එතුමන් හමුවට ගියාය.

30 ඒ වන තෙක්ම ගමට ඇතුළු නො වූ යේසුස්වහන්සේ, මාර්තා හමු වූ ස්ථානයේම නැවති සිටි සේක.

31 මරියා අස්වසමින් නිවසෙහි සිටි යුදෙව්වෝ, හදිසියේම ඇය නැඟිට ගෙන් පිටතට යනු දැක, වැළපෙනු පිණිස සොහොන වෙත යතැයි සිතා ඇය පසු පසින් ගියහ.

32 යේසුස්වහන්සේ හුන් තැනට පැමිණි මරියා, එතුමන් දුටු ඇසිල්ලෙහිම එතුමන් පාමුල වැටී, "අනේ ස්වාමිනි, ඔබතුමා මෙහි සිටියා නම් මගේ සහෝදරයා මරණින් බේරා ගන්න තිබුණා"යි කීවාය.

33 මරියාද ඇය හා පැමිණි යුදෙව්වන්ද හඬනු දුටු යේසුස්වහන්සේ කැළැඹුණු සිතැතිය, සොවින් සුසුම්ලා,

34 "ඔහු තැන්පත් කළේ කොතැනකදැ"යි විමසූ සේක. "එන්න, ඇවිත් බලන්න ස්වාමිනී"යි ඔවුහු කීවෝය.

35 යේසුස්වහන්සේ හඬන්නට වන සේක.

36 එවිට යුදෙව්වෝ, "මෙතුමා ඔහුට ප්‍රේම කළ තරම පෙනේදැ"යි කීවෝය.

37 එහෙත් ඔවුන'තරින් සමහරෙක් අදහස් දක්වමින්, "අන්ධයාගේ ඇස් පාදන්නට පුළුවන් වූ මෙතුමාණන්ට මොහු මරණින් ගලවා ගන්න බැරි වුණේ මන්දැ"යි කීහ.

## ලාසරස් සොහොනින් නැගිට්ටියි

38 නැවතත් සොවින් සුසුම් ලූ යේසුස්වහන්සේ සොහොන අසලට පැමිණි සේක. ඒ සොහොන ගල් ලෙනකි. ලෙන් දොර වසා තිබුණේද ගලකිනි.

39 "ඔය ගල ඉවත් කරන්නැ"යි යේසුස්වහන්සේ පැවැසූ සේක. එවිට, මළ තැනැත්තාගේ සොහොයුරිය වූ මාර්තා, "අනේ ස්වාමිනි, ඔහු මිය ගොස් අදට දවස් හතරක් දැන් හරියට ගඳ ඇති"යි කීවාය.

40 යේසුස්වහන්සේ ඇය අමතා, "සැක නො කොට විශ්වාස කළ හොත්, දෙවියන්වහන්සේගේ තේජෝමහිමය ඔබට දකින්නට පුළුවන් බව මා කීවා නො වේදැ?"යි පැවැසූ සේක.

41 එවිට ඔවුහු ගල ඉවත් කළහ. යේසුස්වහන්සේ ඉහළ බලා, "පියාණෙනි, ඔබවහන්සේ මගේ වචන ඇසූ නිසා බොහෝ ස්තුතියි.

42 සැමවිටම ඔබ මට සවන් දෙන බව මා දැන සිටි නමුත් පියාණෙනි, මා මෙසේ කීවේ මා එවූවේ ඔබම බව මෙහි සිටින පිරිස අසා විශ්වාස කරන පිණිස ඔවුන් උදෙසායැ"යි

43 පවසා, "ලාසරස් පිටතට එනු"යි උස් හඬින් විධාන කළ සේක.

44 මැරී සිටි ලාසර්ස් පිටතට ආවේය. යුද සිරිත ලෙස මළවුන් වෙළන පටිවලින් ඔහුගේ අත් පා වෙළා තිබුණු අතර, මුහුණද රෙදි කඩකින් වසා තිබිණි. "ඔබ බැම් මුද ඔහු යන්න හරින්නැ"යි යේසුස්වහන්සේ ඔවුන්ට පැවැසූ සේක.

## ඉහළ පෙළේ කුමන්ත්‍රණයක්

45 මරියා බලන්නට පැමිණ සිටි යුදෙව්වන්ගෙන් බොහෝ දෙනෙක් යේසුස්වහන්සේ කළ දේ දැක, එතුමාණන් කෙරෙහි අදහා ගත්හ.

46 එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් යේසුස්වහන්සේ කළ දේ පරිසිවරුන්ට දැනුම් දුන්හ.

47 එවිට, නායක පූජකවරු හා පරිචසිවරු යුදද ධර්ම මන්ත්‍රණ සභාව රැස් කරවා සාකච්ඡා කරමින්, "මීට කළ යුත්තේ කුමක්ද? මේ මිනිසා මහ පුදුම දේ කරයි.

48 ඔහුට ඉඩදී මෙසේ බලා සිටිය හොත් හැමෝම ඔහු විශ්වාස කොට ඒ පැත්තට හැරේවි. එසේ වුවහොත් රෝමවරුන් ඇවිත් අපේ සිද්ධස්ථානයත්, ජාතියත් වනසා දමනු ඇතැ"යි කීහ.

49 ඔවුන්'තර සිටි ඒ වසරේ උත්තම පූජක නිලය හිමි කායාපස් කථා කොට. "ඔබ කිසිවක් නොදන්නා හැටි!

50 මුළු මහත් ජාතියම වැනසී යනවාට වඩා, ජනතාව වෙනුවෙන් එක මිනිසකු මරණයට බිලිවීම වැඩදයක බව ඔබට කල්පනා වන්නේ නැතැ"යි කීවේය.

51 ඒ, ඔහු තමන්ම සිතා මතා කී දෙයක් නො ව, එම වසරේ උත්තම පූජකයා ලෙසින් පැවැසූ අනාවැකියකි. එනම් යේසුස්වහන්සේ ජීවිතය පූජා කරන්නේ මුළු යුදෙව් ජාතිය වෙනුවෙන් බවත්,

52 ඒ ජාතිය වෙනුවෙන් පමණක් නො ව ලොව පුරා විසිර සිටින දෙවියන්වහන්සේගේ දරුවන් එක් රැස් කර, එක්සත් කරනු පිණිස බවත් කීමකි.

53 මෙසේ ඔවුහු එවක් පටන් යේසුස්වහන්සේ නසන්නට උපා යෙදූහ.

54 එබැවින් යේසුස්වහන්සේ තව දුරටත් යුදෙව්වන් අතර ප්‍රසිද්ධියේ නො ගැවසී, පාළුකරයට යාබද එප්‍රයිම් නම් ගම්මානයට ගොස්, සිය ගෝලයින් සමඟ එහි නැවති සිටි සේක.

55 එකල යුදෙව්වන්ගේ පාස්කු උත්සවය ආසන්න වූයෙන්, චාරිත්‍රානුකූලව තමන් පවිත්‍ර කර ගන්නා පිණිස, පිට පළාත්හි සිට බොහෝ දෙනෙක් යෙරුසලමට සේන්දු වූහ.

56 යේසුස්වහන්සේ සොයමින් දෙව් මැදුරේ සිටි ඔවුහු, "ඔබ සිතන්නේ කුමක්ද? උත්සවයට ඔහු නැවිත් සිටිදැ"යි එකිනෙකාගෙන් විමසූහ.

57 යේසුස්වහන්සේ සිටින තැන ගැන යම් හෝඩුවාවක් දනිතොත්, එතුමන් අත්අඩංගුවට ගන්නා පිණිස ඒ වග තමන්ට දැනුම් දිය යුතුය යන අණක් නායක පූජකයින් හා පරිසිවරුන් කෙරෙන් නිකුත් වී තිබිණි.

# 12

## සාදර සත්කාරයක්

1 පාස්කු උත්සවයට සදවසකට පෙර යේසුස්වහන්සේ තමන් විසින් මරණින් නැඟිටුවන ලද ලාසරස් විසූ බෙතානියට පැමිණි සේක.

2 ඔවුහු එතුමාණන් හට භෝජන සංග්‍රහයක් පැවැත්වූහ. ලාසරස්ද එතුමාණන් සමඟ කෑමට වාඩි වූ අතර මාර්තා සත්කාර කිරීමෙහි නියැලුණාය.

3 මරියා ඉතා වටිනා සුවඳ විලවුන් කරඬුවක් ගෙනැවිත්, එයින් යේසුස්වහන්සේගේ පා දෝවා, ඇගේ කෙස් කළඹින් පිස දැමුවාය. මුළු ගෙයම එහි සුවඳින් පිරුණේය.

4 එවිට එතුමන්ගේ ගෝලයකු වූ යුදස් ඉස්කාරියෝත් හෙවත් එතුමන් පාවා දීමට සිටි පුද්ගලයා ඒ ගැන අදහස් දක්වමින්,

5 "අපරාදේ! මේ වටිනා විලවුන් මසු 300 කට විකුණා ඒ මුදල දුප්පතුන්ට බෙද නුදුන්නේ මක්නිසාදැ"යි කිවේය.

6 ඔහු එසේ කීවේ දුප්පතුන් ගැන සැලකු නිසා නොව ඔහුගේ සොර සිත නිසාය. කණ්ඩායමේ මුදල් පසුම්බිය බාරව සිටි ඔහු වරින් වර ඉන් සොරා ගන්නට පුරුදුව සිටියේය.

7 "ඇයට දොස් තබන්න එපා"යි පැවැසූ යේසුස්වහන්සේ, "මගේ භූමදානයට ඇය ඒක තබා ගත්තාවේ.

8 කවදත් ඔබ අතරේ ඉන්න දුප්පතුන්ට උදව් කරන්නට නම් මතුත් පුළුවනි. එහෙත් මා නම් ඔබ අතරේ වැඩි දවසක් ඉන්නේ නැතැ"යි පැවසූ සේක.

9 ඒ අතර යේසුස්වහන්සේ එහි පැමිණ සිටිතියි යන පුවත සැල වූයෙන්, යේසුස්වහන්සේ පමණක් නො ව එතුමාණන් මරණින් නැඟිටවූ ලාසරස්ද දකින රිසියෙන් යුදෙව්වෝ බුරුතු පිටින් රැස් වූහ.

10 එබැවින්, ලාසරස්ද මරා දමන්නට නායක පූජකයෝ කතිකා කර ගත්හ.

11 ඊට හේතුව, ලාසරස් සම්බන්ධ පුදුමය නිසා යුදෙව්වන්ගෙන් බොහෝ දෙනකු ඔවුන් කෙරෙන් බැහැරව යේසුස්වහන්සේ මත විශ්වාසය තැබූ හෙයිනි.

## රාජකීය පිළිගැනීම

12 පසුද යේසුස්වහන්සේ යෙරුසලම බලා එන බව උත්සවය සඳහා පැමිණ සිට අති විශාල ජනකායට සැල වූ කල,

13 ඔවුහු තල් අතු ඔසවා ගෙන එතුමන් පෙර මගට ලහි ලහියේ ගොස්, "හෝසන්නා! ස්වාමින්වහන්සේගේ නාමයෙන් එන විශේෂ නියෝජිතයා සැරදේවා! ඉශ්‍රායෙල් මහ රජ්ජුරුවන්ට ජය වේවා!"යි ජය ගොස නගන්නට වන්හ.

14 යේසුස්වහන්සේ කොටළු වස්සකු දැක ඌ පිට නැඟුණේ, ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් පරිදි,

15 "සියොන් පුරඟන බිය නො වන්න. මෙන්න ඔබේ රජ, කොටළු වස්සකු අරා එන්නේය." යන පාඨය සනාථ කරමිනි.

16 එකල්හි, එතුමන්ගේ ගෝලයෝ මෙය වටහා නො ගත් නමුදු පසුව යේසුස්වහන්සේ යළි දිව්‍ය මහිමශ්‍රීය ලැබූ පසු, එතුමාණන් පිළිබඳව එසේ ලියැවී තිබූ බවද ඊට අදළව මෙසේ සිදුවූ බවද සිහිපත් කළෝය.

17 යේසුස්වහන්සේ ලාසරස්ට හඬ ගසා ඔහු මරණින් නැඟිටවනු සියැසින් දුටුවෝ සාක්ෂි දරමින්, එපුවත ජනතාව අතරේ පතළ කරන්නට වූහ.

18 ජන සමූහයා එතුමන්ගේ පෙර මඟට ගියේ මෙම අනුහස් ලකුණ එතුමන් පෑ බව ඔවුන්ට සැලවූ නිසාය.

19 එබැවින්, ඔවුනොවුන් ඇමතූ පරිසිවරු, "කෝ? අපට කිසි ජයක් ලැබෙන පාටක් නැහැ. අන්න! මුළු ලෝකයම ඔහු පස්සේ යන හැටි බලන්නැ"යි කීහ.

## තමන් ගැනම අනාවැකියක්

20 නමස්කාර කරන පිණිස උත්සවයට පැමිණ සිටි සැදැහවතුන් අතර ග්‍රීකයෝ සමහර දෙනෙක්ද වූහ.

21 ගලිලි-බෙත්සයිදා සිට පැමිණි පිලිප් වෙත ඉල්ලීමක් ගෙන ගිය ඔවුහු. "මහත්මයා, අපත් යේසුස්වහන්සේ දකින්නට කැමැතියැ"යි කීහ.

22 පිලිප් ඒ වග අන්ද්‍රෑට කීවේය. අන්ද්‍රෑ හා පිලිප් යන දෙදෙනම ගොස්, යේසුස්වහන්සේට ඒ වග දැන්වූහ.

23 යේසුස්වහන්ස් ඔවුන්ට පිළිතුරු දෙමින්, "මනුෂ්‍ය-පුත්‍රයාණන් තේජෝමහිමයට පැමිණෙන අවස්ථාව උදා වී ඇත.

24 සත්තකින්ම මම ඔබට කියන්නම්, වී ඇටයක් පසට යටවී නො මළොත්, තව දුරටත් එය වී ඇටයක්ම පමණයි. එහෙත් එය මළොත් පැළැවී, එයින් සරුසාර පලදාවක් උපද්දවයි.

25 තම ජීවිතයට ආශා වඩන්නා එය නැති නාස්ති කර ගනී. එහෙත් මෙලොවදී තම ජීවිතයට ආශා නොවඩන්නා අමාමහ ජීවනය තෙත් එය රැක ගනී.

26 යමෙක් මට සේවය කරන්නේ නම් ඔහු මා අනුව ආ යුතුයි. මගේ සේවකයා සිටිය යුත්තේ මා සිටින තැනයි. මට සේවය කරන පුද්ගලයාට පියාණන්වහන්සේ ගෞරව කරනු ඇත.

27 දැන් මගේ සිත කැළඹී ඇත ඕ! මම කුමක් කියම්ද?" පියාණෙනි, මේ අවස්ථාවෙන් මා මුද ගත මැනවැ'යි කියන්නද? එසේ කිව නො හැක. මා මේ අවස්ථාවට පැමිණියේ හුදෙක්ම මේ බැරෑරුම් තත්වයට මුහුණ දීමටයි.

28 පියාණෙනි, ඔබගේ ශ්‍රී නාමය තේජෝමහිමයට පැමිණවුව මැනවැ"යි අයැදූ සේක. එවිට. "මම එය තේජෝමහිමයට පැමිණවීමි. යළිත් පමුණුවන්නෙමි"යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි.

29 ඒ හඬ ඇසූ එහි සිටි ජනයා, "එය අහස් ගිගුරුමකැ"යි කී අතර, "දේව දූතයෙක් එතුමන්ට කථා කළේයැ"යි අන් අය පැවැසූහ.

30 යේසුස්වහන්සේ කථා කරමින්, "ඒ හඬ මා උදෙසා නො ව ඔබෙග් ප්‍රයෝජනය උදෙසා පැමිණි එකකි.

31 ලෝකය විනිශ්චය කිරීමේ අවස්ථාව දැනුයි. දැන් මෙලොව අධිපතියා වූ සාතන් පිටතට පලවා හරිනු ලබයි.

32 එනමුත්, කුරුස ගසේ මා එසවූ කල, මම සකල ජනතාවම මා වෙතට ඇදගනිමි"යි පැවැසූ සේක.

33 එතුමාණන් එසේ කීවේ තමන් විඳින්නට යන්නේ කෙබඳු ආකාර මරණයක්දැයි හඟවනු පිණිසය.

### යෙසායාගේ අනාවැකිය

34 ජන සමූහයා අදහස් දක්වමින් "ශුද්ධ ලියවිල්ලෙන් අප නම් අසා ඇත්තේ, දේවාභිෂේක ලත් ක්‍රිස්තුස්වහන්සේ අජරාමරව ජීවත්වන බවයි. එසේ නම්, මනුෂ්‍ය පුත්‍රයා ඔසවනු ලැබිය යුතුයැයි ඔබ කියන්නේ කෙසේද? කවුරුද මේ මනුෂ්‍ය පුත්‍රයා"යි ඇසූහ.

35 යේසුස්වහන්සේ ඔවුන් අමතමින්, "ආලෝකය ඔබ අතරේ තිබෙන්නේ තව ටික කලකට පමණයි. අන්ධකාරය ඔබ ගිලගන්නට පෙර, එනම් ආලෝකය පවතිද්දී ගමන් කරන්න. අන්ධකාරයේ ගමන් කරන මිනිසා තමන් කොතැනක යනවාදැයි නො දනී.

36 ආලෝකය ඔබ අතරේ තිබියදීම ඒ මත විශ්වාසය තබන්න. එවිට, ඔබත් ආලෝකයේ පුත්‍රයින් වනු ඇතැ"යි කී සේක. යේසුස්වහන්සේ එසේ පැවසූ පසු එතැනින් බැහැරව ගොස් ඔවුන් කෙරෙන් සැඟවුණු සේක.

37 ඔවුන්ගේ ඇස් ඉදිරිපිටදීම, යේසුස්වහන්සේ මෙපමණ අනුහස් ලකුණු පෑ නමුත් ඔවුන් එතුමන් මත විශ්වාසය තැබුවේ නැත.

38 එසේ වූයේ, දිවැසිවර යෙසායා අනාවැකියෙන් පැවැසූ, "සමිඳුනි, අප පැවැසූ දේ විශ්වාස කළෝ කවුරුද? සමිඳු බලය හෙළි කරන ලද්දේ කවරකුටද?" යන වදන් සැබෑ වනු පිණිසය.

39 සැබැවින්ම, ඔවුන්ට විශ්වාස කිරීමට නො හැකි වූ හේතුව යෙසායා අන් තැනෙක මෙසේ දක්වයි.

40 "උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අන්ධ කළ සේක. සිත් දැඩි කළ සේක. එසේ කළේ ඔවුන් තමන්ගේ ඇස්වලින් නො දැකීමටත්, සිත්වලින් තේරුම් නො ගැනීමටත්, මාගෙන් සුවය ලැබීමට මා වෙත නො හැරීමටත්ය."

41 යෙසායා මෙම අනාවැකිය පැවසුවේ යේසුස්වහන්සේගේ තේජෝමහිමය දුටු නිසා එතුමාණන් ගැන සඳහන් කරමිනි.

### තවත් සත්‍යයක්

42 එසේ වුවත්, යුදෙව් ප්‍රභූන් පවා බොහෝ දෙනෙක් යේසුස්වහන්සේ අදහා ගත්හ. එහෙත් ඒ වග හෙළි වුවහොත් තමන් ධර්ම සභාවෙන් නෙරපා හරිතැයි පරිසිවරුන්ට ඔවුන් බිය වූ හෙයින් තම ඇදහිල්ල කිසිවකුටත් නො ඇඟවූහ.

43 මන්දයත් දෙවියන්වහන්සේගෙන් ලැබෙන ගෞරවයට වඩා මිනිසුන්ගෙන් ලැබෙන ගෞරවය ඔවුන් අගය කළ හෙයිනි.

44 එකල යේසුස්වහන්සේ උස් හඬ නඟා කථා කරමින්. "මා අදහා ගන්නා තැනැත්තා සැබවින්ම මා පමණක් නොව. මා එවූ තැනැන්වහන්සේ වන පියාණන්වහන්සේත් අදහා ගනී.

45 මා දෙස බලන තැනැත්තා මා එවූ පියාණන්වහන්සේ දකී.

46 මා ලෝකයට ආලෝකයව ආවේ, මා අදහා ගන්නා කිසිවකුත් අන්ධකාරයෙහි නො සිටිනු පිණිසයි.

47 යමෙක් මාගේ වචන අසා ඒවා පිළිපදින්නේ නැති වුවත්. මා නම් ඔහු විනිශ්වය නො කරමි. මා ආවේ ලෝකය ගලවා ගැනීමට මිස එය විනිශ්චය කිරීමට නො වෙයි.

48 එනමුත් මා එපා කොට මගේ වචන නො පිළිගන්න අයට විනිශ්චයක් තිබෙයි. කල්පාවසාන දවසේදී ඔවුන්ගේ විනිශ්චයකරුවා වන්නේ මා පැවසූ මේ වචනමයි.

49 ඊට හේතුව මා කථා කළ වචන මා තුළින් පැන නැංග ඒවා නොවීමයි. මවිසින් පැවැසිය යුත්තේ මොනවද කථා කළ යුත්තේ කෙසේදැයි මා එවූ පියාණන්වහන්සේ මට නියෝග කර තිබේ.

50 උන්වහන්සේගේ නියෝග අමාමහ ජීවනයේ මාර්ගය බව මම දනිමි. එබැවින් මා පවසන යම් වදනක් වේද ඒවා පියාණන්වහන්සේ මට කීමට කී වදන්මය"යි පැවැසූ සේක.

# 13 උතුම් ආදර්ශයක්

1 ඒ පාස්කු උත්සවයට පෙර දිනයයි. මෙලොවින් බැහැරව පියාණන්වහන්සේ වෙත යෑමේ මොහොතට තමන් මුහන පා සිටින යේසුස්වහන්සේ දැන සිටි සේක. මෙලොව සිටි ස්වකීයයන්ට කවදත් ප්‍රේම කළ එතුමාණෝ, දැන් ස්වකීය ප්‍රේමයේ පරිපූර්ණත්වය ඔවුන්ට පෑ සේක.

2 යේසුස්වහන්සේ සිය ගෝලයින් සමඟින් රාත්‍රී ආහාරයට වාඩි වූ සේක. එතුමන් සතුරන් අතට පාවා දීමට සීමොන්ගේ පුත් යුදස් ඉස්කාරියොත්ගේ සිත යක්ෂයා විසින් ඒ වන විටත් පොළඹවා තිබිණි.

3 පියාණන්වහන්සේ සන්තක සියල්ල තමන් වෙත පවරා දී ඇති බවද දෙවියන්වහන්සේ වෙතින් පැමිණි තමන් යළි උන්වහන්සේ වෙත යන බවද දත් යේසුස්වහන්සේ,

4 රෑ අහර ගැන්මෙන් නැඟිට, උඩු කබාය ගලවා, තුවායක් ඉඟ දවටා ගත් සේක.

5 ඉන්පසු එතුමාණෝ දිය බඳුනක් ගෙන, ඉන් සිය ගෝලයින්ගේ පා සෝදමින්, ඉඟ බැඳි තුවායෙන් පිස දමන්නට වන් සේක.

6 මෙසේ, එතුමන් සීමොන් පේතෘස් වෙත ආ කළ, "ස්වාමීනි, ඔබතුමා මාගේ පාදත් සෝදනවාදැ"යි ඔහු ඇසුවේය.

7 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මා මෙසේ ඔබේ පාද සෝදන්නේ කිමද කියා දැන් ඔබට නො වැටහුණත් පසුව වටහා ගනු ඇතැ"යි කී කල,

8 පේතෘස් එතුමන් වළක්වමින්, "නෑ! නෑ මගේ පාද සෝදන්නට ඔබතුමන්ට කවදවත් ඉඩ දෙන්නේ නැතැ"යි කීවේය. "මා ඔබ නොසේදුවොත් මා හා කිසි පංගුකාරකමක් ඔබට නැතැ"යි යේසුස්වහන්සේ පිළිතුරු දුන් සේක.

9 "එසේ නම් ස්වාමීනි, මගේ පා පමණක් නොව අත් හා හිසත් එලෙසම සේදුව මැනවැ"යි සීමොන් පේතෘස් නොවලහා පැවසීය.

10 "දිය නා ගත් කෙනකු මුළුමනින්ම පවිත්‍ර නිසා ඕනෑ කරන්නේ පා සේදීම පමණකැ"යි පැවැසූ යේසුස්වහන්සේ, "ඔබ පවිත්‍රයි, එනමුත් ඔබ හැම කෙනෙක්ම නො වේයැ"යි ද කී සේක.

11 "ඔබ හැම කෙනෙක්ම පවිත්‍ර නැතැ'යි එතුමාණන් පැවසුවේ, තමන් පාවා දෙන්නා කවරෙක්දැයි දැන සිටි හෙයිනි.

12 මෙසේ ඔවුන්ගේ පා සෝද නිම කළ යේසුස්වහන්සේ තම කබාය යළි ඇඟ ලා, නැවත අසුන් ගෙන ඔවුන්ට මෙසේ පැවසූ සේක. "මා දැන් ඔබට කළ දේ කුමක්ද කියා ඔබට වැටහෙනවාද?

13 ඔබ මා අමතන්නේ, ගුරු හිමියනි, ස්වාමීනි, කියායි. එසේ ඇමතීම හරි මන්ද ඔබේ ගුරුවරයාත්, ස්වාමියාත් මමයි.

14 ඔබේ ගුරුවරයාත්, ස්වාමියාත් වන මා ඔබේ පා සේදුවා නම්, ඔබත් එකිනෙකාගේ පා සේදිය යුතුයි.

15 මා කළේ, මා කළ ලෙසම ඔබත් කළ යුතු බවට ආදර්ශයක් දීමය.

16 "සත්තකින්ම මා ඔබට කියන්නේ, සේවකයෙක් තම ස්වාමියාට වඩා උතුම් නො වන බවයි. එසේම පණිවුඩකරුවෙක් ඔහු යැවූ තැනැත්තාට වඩා උතුම් නො වෙයි.

17 ඔබ මේවා වටහා ගනිත් නම්, දිගටම පිළිපදිත් නම් ඔබ භාග්‍යවන්තයි.

18 මා කථා කරන්නේ ඔබ හැම කෙනකු ගැනම නො වෙයි. මා තෝරා ගත් අය කවුරුදැයි මම හොඳින්ම දනිමි. එනමුත් මා හා එක පතේ කෑ තැනැත්තා මට ද්‍රෝහි වීයැ'යි ලියා ඇති ශුද්ධ ලියවිලි පාඨය සැබෑ විය යුතුයි.

19 සිදුවන්නට කලින් මා ඔබට කියන්නේ, ඒ දේ සිදු වූ කල, 'මම වෙමි'යි කී තැනැත්තා මා ම බව ඔබ විශ්වාස කරනු පිණිසයි.

20 සත්තකින්ම මම ඔබට කියන්නම්, මවිසින් එවන කවරකු හෝ පිළිගන්නා මා පිළිගනී. මා පිළිගන්නා මා එවූ තැනැන්වහන්සේ පිළිගනියැ"යි පැවැසූ සේක.

## පාවා දෙන්නේ කවරෙක්ද?

21 මෙසේ පැවැසූ පසු යේසුස්වහන්සේ දැඩි සිත් සංවේගයට පත්ව, "සත්තකින්ම මම ඔබට කියන්නම්, මා පාවා දෙන්නේ ඔබ අතරින්ම කෙනෙක්යැ"යි ප්‍රකාශ කළ සේක.

22 ඒ කීමෙන් වියවුල් වූ ගෝලයෝ ඒ කවුරුන්දැයි නො දැන එකි'නෙකා දෙස සැක සහිත සිතින් බැලූහ.

23 යේසුස්වහන්සේ බෙහෙවින් ඇලුම් කළ ගෝලයා එතුමන් අසලින්ම හාන්සිවී සිටියේය.

24 සීමොන් පේතෘස් ඔහුට සංඥා කොට, එතුමාණන් අදහස් කළේ කවරකු ගැනදැයි අසන්නට කීවේය.

25 එබැවින් ඔහු යේසුස්වහන්සේ වෙත නැඹුරුව, "ස්වාමීනි ඒ කවුරුන්දැ"යි ඇසුවේය.

26 "මා මේ රොටි කැබැල්ල පොඟවා දෙන තැනැත්තායැ"යි පිළිතුරු දුන් යේසුස්වහන්සේ රොටි කැබැල්ල පොඟවා, සීමොන්ගේ පුත් යුදස් ඉස්කාරියොත්ට දුන් සේක.

27 යුදස් රොටි කැබැල්ල ගත් විගස, සාතන් ඔහුට ආවේශ විය. එවිට යේසුස්වහන්සේ ඔහු අමතා, "ඔබ කරන්නට යන දේ විගසින් කරන්නැ"යි කී සේක.

28 ඒ කියමනේ අදහස කිමෙක්දැයි එතැන හිඳ සිටි කිසිවකුටත් වැටහුණේ නැත.

29 පොදු මුදල් (පසුම්බිය බාරව හිටියේ යුදස් බැවින්) උත්සවය සඳහා යමක් මිළට ගැනීමට හෝ දිළිඳුන්ට යමක් දීමට හෝ යේසුස්වහන්සේ උපදෙස් දෙන්නට ඇතැයි සමහරු සිතූහ.

30 රොටි කැබැල්ල ගත් විගසම යුදස් පිටතට ගියේය. රාත්‍රිය එළැඹිණි.

## අලුත් ආඥාවක්

31 ඔහු ඉවත්ව ගිය පසු යේසුස්වහන්සේ කථා කොට, "දැන් මනුෂ්‍ය-පුත්‍රයාණන් මහිමශ්‍රීයට පමුණුවන ලද්දේය: දෙවියන්වහන්සේ එතුමන් තුළ මහිමශ්‍රීය ලත් සේක.

32 එතුමන් තුළ දෙවියන්වහන්සේ මහිමශ්‍රීයට පැමිණි සේක් නම්, උන්වහන්සේ තමන් තුළ පුත්‍රයාණන්ද මහිමශ්‍රීයට පමුණුවන සේක්: වහාම එසේ කරන සේක.

33 මා ප්‍රේමණීය දරුවනි, මා ඔබ සමඟ සිටින්නේ තව ස්වල්ප වේලාවක් පමණයි. ඉන්පසු ඔබ මා සොයනු ඇති නමුත්, මා යන තැනට එන්නට ඔබට නුපුළුවන.

34 "අලුත් ආඥාවන් මම ඔබට දෙමි. එකිනෙකාට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම කළා සේ, ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.

35 එකිනෙකාට ඔබ දක්වන ප්‍රේමයෙන්ම, ඔබ මගේ ගෝලයින් බව සකල ලෝකයම දැන ගනු ඇතැ"යි පැවැසූ සේක.

36 "ස්වාමීනි, ඔබතුමා යන්නේ කොහේදැ"යි සීමොන් පේතෘස් විචාළේය. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මා යන තැනට මා අනුව ඒමට දැන්ම ඔබට නුපුළුවන එහෙත් පසුව ඔබ එනු ඇතැ"යි කී සේක.

37 පේතෘස් යළි කථා කරමින්, "ස්වාමිනි දැන්ම ඔබ අනුව එන්නට මට බැරි ඇයි? ඔබ උදෙසා ජීවිතය වුවත් දෙන්නට මා සූදනම්යැ"යි කීවේය.

38 එවිට "මා උදෙසා ඔබේ ජීවිතය දෙන්නට සූදනම්?" යනුවෙන් ඔහු ඇමැතූ යේසුස්වහන්සේ, "සත්තකින්ම මා ඔබට කියන්නම්, කුකුළා හඬලන්නට පළමු මා හඳුනන්නේ නැතැයි ඔබ තුන් වතාවක්ම කියනු ඇතැ"යි කී සේක.

# 14

## මාර්ගය, සත්‍යය හා ජීවනය

1 “ඔබේ සිත් කලබල කර නො ගන්න. දෙවියන්වහන්සේ තුළ විශ්වාසය තබන්න. මා තුළත් විශ්වාසය තබන්න.

2 මාගේ පියාණන්වහන්සේගේ දිව්‍ය විමානයෙහි වාසය පිණිස බොහෝ නිවහන් තිබේ. එසේ නො වී නම් මම ඔබට කියන්නෙමි. මා එහි යන්නේ ඔබටත් ස්ථානයක් සුදනම් කරන්නටයි.

3 මම ගොස් ඔබටත් තැනක් සුදනම් කොට, ඔබත් මා හා කැඳවා යැමට එන්නේමි. එවිට මා සිටින තැනම සිටින්නට ඔබටත් හැකි වෙයි.

4 මා යන තැනට යන මාර්ගය ඔබත් දනිති“යි යේසුස්වහන්සේ පැවසූ සේක.

5 තෝමස් කථා කරමින්, “ස්වාමිනි, ඔබ කොතැනක යනවාදවත් අප දන්නේ නැත. එහෙම නම් අප මාර්ගය දන්නේ කෙලෙසද,“යි ඇසීය.

6 යේසුස්වහන්සේ, “මාර්ගයද සත්‍යයද ජීවනයද මම වෙමි: මා මඟින් මිස කිසිවකුටත් පියාණන්වහන්සේ වෙත යා නො හැකියි.

7 ඔබ සැබවින්ම මා හැඳින ගත්තා නම් පියාණන්වහන්සේ හැඳුනත්මැයි. මෙතැන් පටන් ඔබ උන්වහන්සේ හඳුනනු පමණක් නොව දැකලාත් තිබේයැ“යි පැවැසූ සේක.

8 “ස්වාමිනි, අනේ අපට පියාණන්වහන්සේ පෙන්වන්න. එපමණක්ම අපට සෑහෙත“යි එවිට පිලිප් කීවේය.

9 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “මෙපමණ කලක් මා සමඟ ඉඳලත් තවම මා හඳුනන්නේ නැද්ද පිලිප්? මා දුටු තැනැත්තා පියාණන්වහන්සේ දැක තිබේ. එසේ නම්, ’අපට පියාණන්වහන්සේ පෙන්වන්න’යි කියන්නේ කෙසේද?

10 මා පියාණන්වහන්සේ තුළත්, පියාණන්වහන්සේ මා තුළත් වෙසෙන බව විශ්වාස කරන්නේ නැද්ද? මා ඔබට පවසන වචන මවිසින්ම කරන කථා නො වෙයි: පියාණන්වහන්සේ මා තුළ වැඩ වසමින් කරන උන්වහන්සේගේම ක්‍රියායි.

11 ’මා පියාණන්වහන්සේ තුළත් පියාණන්වහන්සේ මා තුළත් වෙසෙන සේක’යන මගේ කීම විශ්වාස කරන්න. අඩු වශයෙන් මා මේ කරන මේ බලවත් ක්‍රියා නිසාවත් විශ්වාස කරන්න..

12 සත්තකින්ම මම ඔබට කියන්නම්: මා තුළ විශ්වාසය තබන ඕනෑම කෙනකු, මා කරන්නා සේම බලවත් ක්‍රියා කරනු ඇත. එසේම මා, පියාණන්වහන්සේ වෙත යන නිසා, ඊටත් වඩා බලගතු ක්‍රියා ඔහු කරනු ඇත.

13 මාගේ නමින් ඔබ මොනයම් දෙයක් ඉල්ලුවත්, පුත්‍රයාණන් මඟින් පියාණන්වහන්සේ ගෞරවයට පැමිණෙනු පිණිස මම ඒ ඉල්ලීම ඉටු කරමි.

14 එසේය, ඔබ මගේ නාමයෙන් මොනයම් දෙයක් ඉල්ලුවත් මම එය ඉටු කරමි.

## වෙනත් සහනදයකයෙක්

15 ඔබ සැබෑවටම මට ප්‍රේම කරනවා නම් ඔබ මගේ අණ පිළිපදිනු ඇත.

16 එවිට, සදහටම ඔබ පසෙකින් සිටින්නට වෙනත් සහනදයකයකු එවන ලෙස මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි.

17 ඒ සහනදයකයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේයි. ලෝකයා එතුමන් දකින්නේත්, අඳුනන්නෙත් නැති නිසා එතුමන් පිළිගන්නට ලෝකයාට නො හැකියි. එනමුත් එතුමණන් ඔබ හා වාසය කරමින් ඔබ තුළම වැඩ වසන නිසා ඔබ එතුමාණන් හඳුනති.

18 "ඔබ අනාථ වීමට ඉඩ නො තබමි: නැවතත් ඔබ වෙත එන්නෙමි.

19 තව ස්වල්ප වේලාවකට පසු ලෝකයා තවත් මා දකිනු නැත. එනමුත් ඔබ නම් මා දකිනු ඇත. මා ජීවත්වන නිසා ඔබත් ජීවත්වනු ඇත.

20 මා, පියාණන්වහන්සේ තුළත්, ඔබ මා තුළත්, මා ඔබ තුළත් යන ආධ්‍යාත්මික සබඳතාවකින් අප වෙළී සිටින බව, ඒ දවසේදී ඔබ වටහා ගනු ඇත.

21 මට සැබෑවටම ප්‍රේම කරන්නේ මගේ අණ පිළිගෙන ඊට කීකරු වන තැනැත්තායි. යම් කෙනෙක් එසේ මට ප්‍රේම කරන්නේ නම් මගේ පියාණන්වහන්සේගේ ප්‍රේමට ඒ තැතැන්තාට හිමි වෙයි. එපමණක් නො වෙයි, මමත් ඔහුට ප්‍රේම කරමින් ඔහුට හෙළිදරව් වෙමි"යි පැවැසූ සේක.

22 එවිට යුදස් කථා කොට, (යුදස් ඉස්කාරියෝත් නො වේ.) "ස්වාමිනි, ඔබතුමා ලෝකයට හෙළිදරව් නො වී අපට පමණක් හෙළිදරව් වන්නේ ඇයිදැ"යි ඇසීය.

23 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, ඔහු මාගේ වචන පිළිපදියි. මාගේ පියාණන්වහන්සේ ඔහුට ප්‍රේම කරන සේක. එවිට පියාණන්වහන්සේත්, මමත් ඔහු වෙත පැමිණ, ඔහු හා එක්ව අපේ නිවස තනා ගන්නෙමු.

24 මට ප්‍රේම නොකරන තැනැත්තා මාගේ වචන නො පිළිපදියි. ඔබ අසන මේ වචන මගේ නොවෙයි: මා එවූ පියාණන්වහන්සේගෙයි.

25 මා ඔබ අතර සිටියදී මේ දේවල් ඔබට කියන නමුත්,

26 මගේ නමින් මා වෙනුවට පියාණන්වහන්සේ එවන සහනදයකයාණන්වහන්සේ හෙවත් ශුද්ධාත්මයාණන් පැමිණි කල, එතුමාණෝ හැම දෙයක් ගැනම ඔබට උගන්වමින්, මා ඔබට කියා දුන් සියල්ල යළි සිහිපත් කරනු ඇත.

27 මා ඔබෙන් සමු ගන්නේ ශාන්තිය ඔබට දයාද කරලයි. මා ඔබට දෙන්නේ මාගේම ශාන්තියයි. මා ඔබට දෙන්නේ ලෝකයා දෙන විදියේ ශාන්තියක් නො වෙයි. ඒ නිසා සිත් කලබල කර නො ගන්න. බිය නො වන්න.

28 මා වෙන්ව ගොස්, යළිත් ඔබ වෙත එන බව මා කියනු ඔබ අසා සිටියා. ඔබ සැබවින්ම මට ප්‍රේම කළා නම්, පියාණන්වහන්සේ වෙත මා යන නිසා ඔබ ප්‍රීති විය යුතුයි. මන්ද, පියාණන්වහන්සේ මට වඩා උතුම් සේක.

29 මෙය සිදුවන්නට කලින් මා ඔබට කීවේ, එය සිදු වූ විට ඔබ විශ්වාස කරන පිණිසයි.

30 දිගින් දිගටම මා තවත් ඔබ සමඟ කථා කරන්නේ නැහැ. ඊට හේතුව මේ ලෝකයේ අධිපතියා වූ සාතන් ළඟා වීමයි. එනමුත් ඔහුට මා කෙරෙහි කිසිදු බලයක් නැත.

31 එසේ වුවත් පියාණන්වහන්සේට මා ප්‍රේම කරන බවත්, පියාණන්වහන්සේගේ නියෝග මා ඒ ලෙසින්ම පිළිපදින බවත් ලෝකයාට පෙන්නුම් කළ යුතුයි. එන්න, අපි යමු.“

# 15

## මිදි වැල, අතු සහ එල

1 “සැබෑ මිදි වැල මම වෙමි: වැවිලිකරුවාණෝ මගේ පියාණන්වහන්සේයි.

2 මා මත ඇති කමකට නැති හැම නිසරු අත්තක්ම රැහැ දමන උන්වහන්සේ, එල බර අතු හැම එකක්ම සරු සාරව එල දරන පිණිස ඒවා ශුද්ධ පවිත්‍ර කරන සේක.

3 මා ඔබට පැවසු වචන මගින් දැනටමත් ඔබ ශුද්ධ පවිත්‍රයි.

4 මා තුළ රැඳී සිටින්න: මමත් ඔබ තුළ රැඳෙන්නෙමි. මිදි වැලට යා නො වී ස්වයංව එල දැරීමට අත්තකට නො හැකිවා සේම, මා හා ඒකාබද්ධ වන තෙක් එල දරන්නට ඔබටත් නුපුළුවන.

5 මිදි වැල මම වෙමි: එහි අතු ඔබයි. යම් කෙනෙක් මා තුළ පවති නම්, මාද ඔහු තුළ පවති නම්, ඒ තැනැත්තා සරු සාරව එල දරයි. මගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නො හැකියි.

6 මා තුළ නො පවතින කවරකු වුවත් කපා දමනු ලැබ වියැලී යන අත්තක් වැන්න. එවැනි අතු ගින්නෙහි ලා දවනු ලැබේ.

7 ඔබ මා තුළ පවති නම්, මාගේ වචන ඔබ තුළ පවති නම්, ඔබ කැමති ඕනෑම දෙයක් ඉල්ලන්න: ඉල්ලන දේ ඔබට ලැබෙයි.

8 මගේ පියාණන්වහන්සේ තේජශ්‍රීයට පැමිණෙන්නේ ඔබ සැම වඩ වඩා එල දරමින් මගේ සැබෑ ගෝලයන් බව සනාථ කිරීමෙනි.

9 පියාණන්වහන්සේ මට ප්‍රේම කළ සේම මමත් මුළු සිතින්ම ඔබට ප්‍රේම කළෙමි. මගේ ප්‍රේමයෙහි පැවත සිටින්න.

10 මා, මගේ පියාණන්වහන්සේගේ ආඥා පිළිපදිමින් උන්වහන්සේගේ ප්‍රේමයෙහි පැවැතුණු අයුරින්ම, ඔබත් මාගේ ආඥා පිළිපද්දින්නේ නම් මගේ ප්‍රේමයෙහි පැවත සිටිනු ඇත.

11 මේ දේවල් මා ඔබට කීවේ, මගේ ප්‍රීතියට ඔබ පංගුකාර වනු පිණිස හා ඔබේ ප්‍රීතිය අංග සම්පූර්ණ වනු පිණිසයි.

12 මාගේ ආඥාව මෙයයි: මා ඔබට ප්‍රේම කළ අයුරින්ම, ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.

13 තම මිතුරන් උදෙසා දිවි දීමට වඩා වැඩි ප්‍රේමයක් කිසිවකුට තිබිය නො හැකියි.

14 ඔබ මගේ අණ පිළිපදින්නේ නම්, සැබැවින්ම ඔබ මගේ මිත්‍රයෝයි.

15 තව දුරටත් දසයින් යයි මම ඔබට නො කියමි. මන්ද, තම ස්වාමියා කරන්නේ මොනවාදැයි දසයෙක් දන්නේ නැත. එනමුත් ඔබ මාගේ මිත්‍රයින් යැයි මා කීවේ මගේ පියාණන්ගෙන් මා ඇසු හැම දෙයක්ම මා ඔබට දැනගන්නට සැලසු නිසයි.

16 ඔබ, මා තෝරා ගත්තා නො වෙයි. ඔබ තෝරා පත්කර ගත්තේ මමයි. එසේ කළේ, ඔබ පිටත්ව ගොස් එල දරන පිණිසයි: නො නැසී පවතින එල දරන පිණිසයි. එවිට මගේ නමින් ඔබ ඉල්ලන කවර දෙයක් වුවත්, පියාණන්වහන්සේ ඔබට දෙනු ඇත.

17 මාගේ ආඥාව මෙයයි: එකිනෙකාට ප්‍රේම කරන්න.

## ලෝකයාගේ ද්වේශය

18 "ලෝකයා ඔබට ද්වේශ කරන විට, ඔබට පළමුවෙන් ඔවුන් මට ද්වේශ කළ බව මතක තබා ගන්න.

19 ඔබ ලෝකයට අයිති නම්, තමන්ගේම එකකුට සේ ලෝකයා ඔබට ප්‍රේම කරනු ඇත. එනමුත් මා ලෝකයෙන් ඔබ තෝරා වෙන් කර ගත් නිසා, ඔබ ලෝකයට අයිති නැත. ලෝකයා ඔබට වෛර වන්නේ ඒ නිසයි.

20 'දසයා තම ස්වාමියාට වඩා උතුම් නැත'යි මා කී වචන සිහියට නඟා ගන්න. ඔවුහු මට පීඩා කළෝ නම්, ඔබටත් පීඩා කරනු ඇත. මගේ වචන පිළිපැද්දේ නම්, ඔබගේ වචනත් පිළිපදිනු ඇත.

21 ඔවුන් මෙලෙස ඔබට හිරිහැර කරන්නේ ඔබ මාගේ නාමය දරමින් මා නියෝජනය කරන නිසයි. ඔවුන් මා එවූ තැනැන්වහන්සේ අඳුනන්නේ නැත..

22 "මා අවුත් ඔවුන්ට කරුණු පහද නො දුන්නා නම් පාපකර්ම ගැන ඔවුන් වරදකරුවන් නො වන්නට ඉඩ තිබිණි. එහෙත් දැන් තම පාප කර්ම ගැන නිදහසට කරුණක් ඔවුන්ට නැත.

23 මට ද්වේශ කරන්නා මගේ පියාණන්වහන්සේටද ද්වේශ කරයි.

24 කිසි කෙනකු නො කළ තරමේ බලවත් හාස්කම් මා ඔවුන් මධ්‍යයේ සිදු නො කළා නම්, තම පාප ගැන ඔවුන් වරදකරුවන් නො වන්නට තිබිණි. එනමුත් දැන් මේ හැම දෙයක්ම දුටු පසුව පවා ඔවුහු අප දෙදෙනාටම, එනම් මටත්, මගේ පියාණන්වහන්සේටත් ද්වේශ කරති.

25 මෙසේ වන්නේ, 'අහේතුකව ඔවුහු මට ද්වේශ කළහ.' යන ඔවුන්ගේ ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වනු පිණිසයි.

26 පියාණන්වහන්සේ වෙතින් මා ඔබ වෙත එවන සහනදායකයාණෝ, එනම් සත්‍යතාවයේ ආත්මයාණන්වහන්සේ ආ කල, එතුමාණෝ මා ගැන සාක්ෂි දරන සේක.

27 එනමුත්, මුල පටන්ම ඔබ මා සමඟ සිටි නිසා ඔබත් මා ගැන සාක්ෂි දැරිය යුතුයි."

# 16

## සහනදායකයාණන්ගේ මෙහෙයය

1 "මේ සියල්ල මා ඔබට කීවේ ඔබ මුළා නො වන පිණිසයි.

2 ඔවුන් තම ධර්ම සභාවලින් ඔබ නෙරපා දමනු පමණක් නො ව, ඔබ මරා දැමීම දෙවියන්වහන්සේට කරන මෙහෙයකැයි සිතන අවස්ථාවක් උදා වනු ඇත.

3 මෙවැනි දේ කරන්නේ ඔවුන් මා හෝ පියාණන්වහන්සේ හෝ නාඳුනන නිසයි.

4 මා මේවා ඔබට කීවේ, ඒවා සිදුවන අවස්ථාව පැමිණි කල මා ඔබට අවවාද කළ බව සිහිවීම පිණිසයි. මුල් අවස්ථාවේදීම මේ දේවල් ඔබට නො කීවේ මා ඔබ සමඟම සිටි නිසයි.

5 මම දැන්, මා එවූ පියාණන්වහන්සේ වෙත යන්නෙමි. එහෙත්, 'ඔබ යන්නේ කොහේදැ'යි ඔබ කිසිවෙක් මගෙන් අහන්නේ නැත.

6 එනමුත් මා කී මේ දේවල් නිසා ඔබේ සිත් දුකින් පිරී ඇත.

7 එසේ වුවත් මම ඔබට සැබෑව කියන්නම්: මා ඉවත්ව යන්නේ ඔබේම යහපත පිණිසයි. මා ඉවත්ව ගියහොත් මිස සහනදායකයාණෝ ඔබ වෙත නො පැමිණෙන්නාහ. එහෙත් මා ගියහොත් එතුමාණන් ඔබ වෙත එවන්නෙමි.

8 එතුමාණන් පැමිණි කල පාපය, ධර්මිෂ්ඨකම හා විනිශ්චය පිළිබඳව සාධක සහිතවම ලෝකයාට වටහා දෙනු ඇත.

9 ඔවුන් මා අදහා නොගැනීම නිසා පාපය පිළිබඳවද

10 මා, පියාණන්වහන්සේ වෙත යන හෙයින් මින් මතු ඔබට මා දකින්නට නොලැබීම නිසා ධර්මිෂ්ඨකම පිළිබඳවද

11 මෙලොවෙහි අධිපතියා වන සාතන් විනිශ්චයෙන් වරදට පත් කරනු ලැබ සිටීම නිසා විනිශ්චය පිළිබඳවද වටහා දෙනු ඇත.

12 ඔබට කිව යුතු තවත් බොහෝ දේ තිබෙයි. එහෙත් දැන් ඒවා දරන්නට ඔබට අපහසු තරම්.

13 එනමුත් සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ ආ කල, එතුමාණෝ සම්පූර්ණ සත්‍යය කරා ඔබට මඟ පෙන්වනු ඇත. එතුමාණන් තම සිතු මනාපය ලෙසින් නොව එතුමන් අසන උපදෙස් අනුව පමණක් කථා කරමින්, මතු සිදුවන දේ ඔබට දන්වනු ඇත.

14 එතුමාණෝ මා සතු දෙයින් රැගෙන ඔබට ප්‍රකාශ වෙමින් මා තේජසට පමුණුවන සේක.

15 පියාණන්වහන්සේ සන්තක සියල්ල මාගෙයි. 'ආත්මයාණන්වහන්සේ මා සතු දෙයින් රැගෙන ඔබට දන්වනු ඇතැ'යි මා කීවේ එබැවිනි.

16 'තව ස්වල්ප වේලාවකට පසු ඔබට තවත් මා දකින්නට නො ලැබෙයි. යළි තවත් ස්වල්ප වේලාවකට පසු ඔබ මා දකිනු ඇතැ"යි කී සේක.

## ප්‍රහේලිකාවක්

17 එවිට එතුමාණන්ගේ ගෝලයන්ගේන් සමහරෙක් එකිනෙකා අමතමින්, "තව ස්වල්ප වේලාවකට පසු ඔබට තවත් මා දකින්නට නො ලැබෙයි. යළි තවත් ස්වල්ප වේලාවකට පසු ඔබ මා දකිනු ඇතැ"යි කියාත්, "මා පියාණන්වහන්සේ වෙත යන නිසාය" කියාත් මෙතුමන් කියන කථාවේ තේරුම කුමක්ද?

18 මේ කියන ස්වල්ප වේලාව කුමක්ද? මෙතුමන් කියන දේ අපට නම් නො වැටහේයැ"යි පැවැසූහ.

19 ඔවුන් ඒ ගැන තමන්ගෙන්ම අසන්නට කැමැති බව දත් යේසුස්වහන්සේ, "හොඳයි, තව ස්වල්ප වේලාවකට පසු ඔබට තවත් මා දකින්නට නොලැබෙයි. යළි තවත් ස්වල්ප වේලාවකට පසු ඔබ මා දකිනු ඇතැ"යි කීමෙන් මා අදහස් කළේ කුමක්දැයි ඔබ එකිනෙකාගෙන් අසනවා නො වේද?

20 සත්තකින්ම මම ඔබට කියමි. මුළු ලෝකයම ප්‍රීතිවන අතර ඔබ හඬමින් විලාප නඟනු ඇත. ඔබ ශෝකයට පත්වනු ඇත. එනමුත් ඔබේ ශෝකය ප්‍රීතියට හැරෙයි.

21 දරු ප්‍රසූතියේදී ගැබිණියකට වේදනා දැනෙයි. ඒ ඇගේ වේලාව පැමිණ තිබෙන නිසයි. එහෙත් ළදරුවා බිහි කළ පසු, ලෝකයට දරුවෙක් උපන්නේය යන ප්‍රීතිය නිසා ඇගේ වේදනා අමතක වෙයි.

22 එලෙසම දැන් ඔබගේ ශෝක වීමේ වේලාවයි. එනමුත් මම යළිත් ඔබ හමු වෙමි. එවිට ඔබගේ සිත් ප්‍රීතියෙන් ඉතිරී යනු ඇත. එම ප්‍රීතිය ඔබෙන් පැහැර ගැනීමට කිසිවකුටත් නුපුළුවන.

23 එදාට ඔබ මගෙන් කිසිම ප්‍රශ්ණයක් නො අසනු ඇත. සත්තකින්ම මම ඔබට කියන්නම්. මගේ නමින් ඔබ ඉල්ලන කවර දෙයක් වුවත්, පියාණන්වහන්සේ ඔබට දෙන සේක.

24 මේ දක්වා මගේ නමින් ඔබ කිසිවක්ම ඉල්ලා නැත. ඉල්ලන්න: එවිට ඔබට ලැබෙනු ඇත. එසේ ඔබේ ප්‍රීතිය සම්පූර්ණ වනු ඇත.

25 මා මේ දේවල් උපමා උපහැරණ මගින් කීවත්, තවත් මේ අයුරින් කථා නො කොට පියාණන්වහන්සේ ගැන බොහෝ පැහැදිළිව කථා කරන අවස්ථාවක් උදාවනු ඇත.

26 ඒ දවසේදී ඔබ මගෙන් ඉල්ලනු ඇත. එවිට ඔබ වෙනුවෙන් පියාණන්වහන්සේට කරුණු කියන්නට මගේ මැදිහත් වීමක් අවශ්‍ය නො වෙයි.

27 මන්ද, ඔබ මට ප්‍රේම කළ නිසාත්, මා දෙවියන්වහන්සේ වෙතින් ආ බව ඔබ විශ්වාස කළ නිසාත් පියාණන්වහන්සේම ඔබට ප්‍රේම කරන සේක.

28 මම පියාණන්වහන්සේ වෙතින් නික්ම ලෝකයට ඇවිත් සිටිමි. දැන් මෙලොවින් නික්ම යළි පියාණන්වහන්සේ වෙත යන්නෙමි"යි පැවැසූ සේක.

29 එතුමන්ගේ ගෝලයෝ කථා කොට, "ඕ! ඔබතුමා දැන් උපමා නැතිව ඔය හොඳට පැහැදිලිව කථා කරන්නේ!

30 ඔබ සියලු දේම දන්නා බවත් ඔබෙන් ප්‍රශ්න විචාරන්නට වුවමනා නැති බවත් දැන් අපට සහතිකයි. එනිසා ඔබතුමා දෙවියන්වහන්සේ වෙතින් ආ බව අපට හොඳටම විශ්වාසයැ"යි කිවෝය.

31 "හා! දැන් ඔබ විශ්වාස කරනවාදැ"යි ඇසූ යේසුස්වහන්සේ,

32 “මේ අහන්න, ඔබ හැම කෙනකුම එකිනෙකාගේ නිවෙස්වලට විසුරුවා දමනු ලබන අවස්ථාවක් එනම් ඔබ හැම මා තනිකර දමන අවස්ථාවක් උදවනු ඇත. දැනටමත් එය උදව තිබේ. එනමුත් මා තනි වන්නේ නැත. මන්ද, පියාණන්වහන්සේ මා සමඟ සිටින බැවිනි.

33 මේ සියල්ල මා ඔබට කීවේ මා තුළ ඔබට සැබෑ ශාන්තිය ලැබෙන පිණිසයි. මෙලොවෙහිදී ඔබට කරදර පීඩා ඇති වෙයි. එනමුත් දිරිමත් වන්න: මම ලෝකය පරදා ජය ගතිමි”යි පැවැසූ සේක.

# 17

## ඓතිහාසික යාච්ඤාව

1 එසේ පැවසූ යේසුස්වහන්සේ ස්වර්ගය දෙස නෙත් යොමා, මෙසේ යාච්ඤා කළ සේක. "පියාණෙනි, තීරණාත්මක මොහොත පැමිණ තිබේ. පුත්‍රයා විසින් ඔබ තේජෝමහිසයට පමුණුවන පිණිස, ඔබගේ පුත්‍රයාණන් තේජෝමහිමයට පැමිණවුව මැනව.

2 මන්ද, ඔබ විසින් පුත්‍රයාණන්ට බාර දෙන ලද සියළු දෙනා හට අජරාමර ජීවනය දෙනු පිණිස සකල මිනිස් වර්ගයා කෙරෙහිම ඔබවහන්සේ පුත්‍රයාණන්ට බලය පවරා දුන් හෙයිනි.

3 අජරාමර ජීවනය නම් මෙයයි: එකම, සත්‍යම දෙවියන්වහන්සේ වන ඔබ හා ඔබ එවූ තැනැත්තාණන් වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් හාඳින ගනු ලැබීමයි.

4 ඉටු කරනු පිණිස ඔබ මට පැවරූ වැඩ කොටස සම්පූර්ණ කරමින් මම මිහිපිටදී ඔබ තේජෝමහිමයට පැමිණ වීමි.

5 එබැවින් දැන් පියාණෙනි, ලෝකය මැවීමට පළවුවෙන් ඔබ සමඟින් මට තිබූ තේජෝමහිමයෙන්ම, ඔබ ඉදිරියේ මා තේජශ්‍රීයට පැමිණ වුව මැනව.

6 ලෝකයෙන් වෙන් කර ඔබ මට බාර දුන් මිනිසුන්ට ඔබගේ ශ්‍රී නාමය, එනම් ඔබගේ මුළු ස්වභාවයම හෙළිදරව් කළෙමි. ඔබ සන්තකව සිටි ඔවුන් ඔබ මට බාර දුන් සේක. ඔවුහුද ඔබට කීකරුව ඔබගේ වචන පිළිපැද්දේය.

7 ඔබ මට දුන් හැම දෙයක්ම ලැබී ඇත්තේ ඔබගෙන්ම බව දැන් ඔවුහු හොඳන්ම දනිති.

8 මන්ද, ඔබ මට දුන් ඔබගේම වචන මම ඔවුන්ට දුනිමි. ඒවා පිළිගත් ඔවුහු, මා ඔබ වෙතින්ම ආ බව සහතිකවම දැන, ඔබම මා එවූ බව විශ්වාස කළෝය.

## වත්මන් තේජස

9 "මම ඔවුන් උදෙසා යාච්ඤාකරමි. ලෝකයා උදෙසා (දැන්) යාච්ඤා නො කරමි. එනමුත් ඔබ මට දුන්නවුන් උදෙසා යච්ඤ කරමි. මන්ද ඔවුන් ඔබගේම බැවිනි.

10 මා සතු සියල්ලන් ඔබෙයි. ඔබ සතු සියල්ලන් මගෙයි. ඔවුන් තුළින් මම තේජසට පැමිණ සිටිමි.

11 මම තව දුරටත් ලෝකයෙහි නො සිට ඔබ වෙත එමි. එනමුත් මොවුහු ලෝකයෙහිම සිටිති, ශුද්ධ වූ පියාණෙනි, අප මෙන්ම මොවුන්ද ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් ඔබගේ ශ්‍රී නාමයේ අනුහසින් ඔවුන් සුරකිනු මැනවි.

12 මා ඔවුන් සමඟ සිටියදී ඔබ මට දුන් නාමයෙන් මම ඔවුන් රැක බලා පරෙස්සම් කළෙමි. ලියවිල්ල සනාථ වනු පිණිස විනාශයේ පුත්‍ර යුදස් හැර අන් හැම කෙනෙක්ම සුරැකිව සිටිති.

13 මම දැන් ඔබ වෙත එමි. එහෙත් මේ දක්වාත් මෙලොවෙහි සිටියදී මා ඔවුන්ට මේවා දන්වන්නේ මගේ ප්‍රීතිය ඔවුන් තුළ සම්පූර්ණ වනු පිණිසය.

14 මම ඔවුන්ට ඔබගේ වචන දුනිමි. මා ලෝකයට අයිති නැති සේම, ඔවුන්ද තවදුරටත් මෙලොවට අයත් නැති බැවින් ලෝකයා ඔවුන්ට ද්වේශ කළහ.

15 ලෝකයෙන් ඔවුන් ඉවත් කර ගන්නා පිණිස නො ව, දුෂ්ටයාවූ සාතන්ගෙන් ඔවුන් ආරක්ෂා කරන ලෙස ඔබෙන් ඉල්ලමි.

16 මා ලෝකයට අයිති නැති සේම ඔවුන්ද මෙලොවට අයිති නැත.

17 සත්‍යතාවෙන් ඔවුන් ඔබටම කැප කර ගත මැනව: ඔබගේ වචන සත්‍යතාවයි.

18 ඔබ ලෝ තුළට මා එවූ අයුරින්ම, මමත් ලොව වෙත ඔවුන් යැවීමි.

19 ඔවුන්ද සැබවින්ම කැප වන පිණිස මම ඔවුන් උදෙසා මා ම කැප කරමි.”

## අපූරු ඒකත්වය

20 “මොවුන් උදෙසා පමණක් නො ව මොවුන් දෙසන ශුභාරංචිය හේතු කොට මතු කල මා අදහා ගන්න අය ගැනත් මගේ යාච්ඤාව නම්,

21 ඔවුන් සැවොම එකකු සේ එක්සත් වේවා යනුයි, පියාණෙනි, මා එව්වේ ඔබම බව ලෝකයා විශ්වාස කරන පිණිස ඔබ මා තුළත්, මා ඔබ තුළත් සිටින අයුරින් ඔවුන්ද අප තුළ ඒකත්වයක් වේවා!

22 ඔබ මට දුන් තේජශ්‍රීයම මම ඔවුන්ට දුනිමි. එසේ කළේ, අප ඒකත්වයක්ව සිටින සේ ඔවුන්ද එකාමෙන් එක සිතින් එක්සත්ව සිටින පිණිසත්,

23 මා ඔවුන් තුළත්, ඔබ මා තුළත් සිටීමෙන් සැවොම ඒකත්වයේ සම්පූර්ණත්වයට පත් වීමෙන් ඔබම මා එවූ බවත්, ඔබ මට මෙන්ම මොවුන්ටද එක සමානව ප්‍රේම කළ බවත් සකල ලෝකවාසීන්ම දැන ගන්නා පිණිසත්ය.

24 පියාණෙනි, ලෝකය මැවීමට ඉහත පටන්ම ඔබ මට ප්‍රේම කළ සේක. එබැවින් ඔබ මට දුන් තේජෝමහිමය ඔබම මට දුන් මොවුන්ද දකිනු පිණිස, මොවුනුත් මා සිටින තැනම සිටිම මගේ ඕනෑකමයි.

25 ධාර්මික පියාණෙනි. ලෝ වැසියන් ඔබ හැඳින ගත්තේ නැති මුත් මම ඔබ හැඳින්නෙමි. ඔබ මා එවූ බව මොවුහුද දැන ගත්හ.

26 ඔබ දැක්වූ අපරිමිත ප්‍රේමය මොවුන් තුළ රජ කරනු පිණිසත්, මා ද මොවුන් තුළ වෙසෙන පිණිසත්, ඔබවහන්සේ කවුරුදැයි මම ඔවුන්ට හඳුන්වා දුනිමි. මතුත් එසේ කරන්නෙමි.”

# 18

## මහා පාවාදීම

1 මෙසේ යාච්ඤා කර නිම වූ යේසුස්වහන්සේ සිය ගෝලයින් සමඟ කිද්‍රොන් ඇළෙන් එතෙර වී, එහි වූ ඔලිව් උයනට ඔවුන් සමඟින්ම ඇතුළු වූ සේක.

2 යේසුස්වහන්සේ නිතර නිතර සිය ගෝලයින් සමඟ එහි ආ ගිය බැවින් ද්‍රෝහී යුදස් මේ ස්ථානය ගැන හොඳින් දැන සිටියේය.

3 එබැවින් යුදස්, රෝම හමුද කණ්ඩායමක්ද නායක පූජකයින් හා පරිසිවරුන්ගෙන් ලබාගත් මුර භට කණ්ඩායමක්ද සමඟ උයන වෙත ආයේය. ඔවුන් අත පහන්, පන්දම් හා අවිද විය.

4 තමන්ට සිදුවන්නට යන දේ හොඳින් දත් යේසුස්වහන්සේ ඉදිරියට විත්, “ඔබ සොයන්නේ කවරකුදැ”යි ඇසූ සේක.

5 “නාසරත් හි යේසුස්යැ”යි ඔවුහු පිළිතුරු දුන්හ. එවිට “ඒ මම වෙමි”යි යේසුස්වහන්සේ කී සේක. ද්‍රෝහි යුදස් ඔවුන් සමඟ සිටියේය.

6 යේසුස්වහන්සේ, “ඒ මම වෙමි’යි කී කල ඔවුහු පස්සෙන් පස්සට ගොස් බිම ඇද වැටුණහ.

7 එතුමාණෝ නැවතත් ඔවුන් අමතා “ඔබ සොයන්නේ කවරකුදැ”යි ඇසූ සේක. ඔවුහුද, “නාසරත්හි යේසුස්යැ”යි කීහ.

8 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “ඒ මම වෙමියි මා කීවා නො වේද? ඔබ සොයන්නේ මා නම්, මොවුන් යන්නට හරින්නැ”යි කී සේක.

9 මෙසේ වූයේ, ’ඔබ මට දුන් අයගෙන් කිසිවකුත් විනාශ වූයේ නැතැ’යි එතුමන්ම පෙර වතාවකදී පැවැසූ වචන ඉටු වන පිණිසය.

10 එවිට, තමා වෙත වූ කඩුව ඇදගත් සීමොන් පේතෘස් උත්තම පූජකයාගේ දසයාගේ දකුණු කන කැපෙන්නට කඩු පහරක් ගැසීය. ඒ දසයාගේ නම මල්කස්ය.

11 යේසුස්වහන්සේ පේතෘස් අමතා, “ඔය කඩුව කොපුවේ දමා ගන්න. පියාණන්වහන්සේ මට දී ඇති කුසලානෙන් නො බොම්දැ”යි පැවසූ සේක.

## ප්‍රශ්න කිරීම

12 එවිට රෝම භටයෝද ඔවුන් ගේ අණ දෙන නිලධාරියාද යුදා මුර භටයෝද එක්ව යේසුස්වහන්සේ අල්ලා බැඳ,

13 පළමු කොට අන්නස් වෙත එතුමන් ගෙන ගියහ. අන්නස් එම වසරේ උත්තම පූජක වූ කායපස්ගේ මාමණ්ඩියය.

14 ජනතාව වෙනුවෙන් එක මිනිසකු මරණයට කැප වීම වැඩදයක බවට යුදෙව්වන්ට උපදෙස් දුන්නේ මෙම කායපස්ය.

15 සීමොන් පේතෘස් හා තවත් ගෝලයෙක් යේසුස්වහන්සේ පසු පසින් ගියහ. උත්තම පූජකයා හඳුනන එම ගෝලයා යේසුස්වහන්සේ සමඟ උත්තම පූජක මැදුරු මළුවට ඇතුළු වුවද,

16 පේතෘස් පිටත දොරකඩට වී සිටියේය. එබැවින් උත්තම පූජකයා හඳුනන එම අනෙක් ගෝලයා යළි පැමිණ,

17 දොරටුපාලි හා කථා කොට පේතෘස් ඇතුළට ගෙනාවේය. දොරටු පාලි තරුණිය පේතෘස් අමතා, "සැබෑවටම ඔබත් අර මිනිහාගේ ගෝලයෙක් නො වේදැ"යි ඇසුවාය. පේතෘස්, "නැතැ"යි කීවේය.

18 ශීතල නිසා දසයෝ හා මුර භටයෝ ගිනි මැලයක් දල්වා ගිනි තපිමින් සිටියහ. පේතෘස්ද ඔවුන් අතර සිට ඇඟ උණුසුම් කර ගනිමින් සිටියේය.

## උත්තම පූජකයා ඉදිරිපිට

19 ඒ අතර උත්තම පූජකයා, යේසුස්වහන්සේගේ ගෝලයන් හා ඉගැන්වීම් ගැන එතුමන්ගෙන් ප්‍රශ්න කරන්නට වන් කල,

20 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මා කථා කළේ ප්‍රසිද්ධියේ එළිපිටමයි. මා හැමවිටම දේශනා කළේ සියලු යුදෙව්වන් රැස්වන ධර්මශාලාවලදී හෝ දේව මාලිගාවේදීයි. හැංගි හොරා මා කිසිවක් කථා කළේ නැත.

21 මගෙන් අහන්නේ කුමටද? මට සවන් දුන් අයගෙන් අහන්න. මා කීවේ මොනවාදැයි ඔවුහු හොඳකාරවම දනිති"යි කී සේක.

22 එතුමන් එසේ කී කල, එතුමන්ට අතුල් පහරක් ගැසූ ළඟ සිටි මුර භටයෙක්, "උත්තම පූජකයාට කථා කරන්නේ මෙහෙමදැ"යි ඇසීය.

23 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මගේ කථාව වැරදි නම් මට චෝදනා කරන්න. එනමුත් නිවැරදි නම් පහර දීම යුතුදැ"යි ඇසූ සේක.

24 එවිට අන්නස්, එතුමන් බැඳ සිටි ලෙසින්ම උත්තම පූජක කායපස් වෙත යැවීය.

25 සීමොන් පේතෘස් ගිනි තපිමින් සිටියදී, එතැන සිටි අය ඔහු අමතා, "හැබෑටම ඔබත් ඔහුගේ ගෝලයෙක් නො වේදැ"යි ඇසූහ. "නෑ, මා ගෝලයෙක් නො වේයැ"යි කියමින් ඔහු ඔවුන්ගේ කීම ප්‍රතික්ෂේප කළේය.

26 පේතෘස් කන කැපූ තැනැත්තාගේ නෑයකු වූ උත්තම පූජකයාගේ දසයෙක් පේතෘස්ට අභියෝග කරමින්, "නුඹ ඔහු සමඟ ඔලිව උයනේ සිටිනු මා දුටුවා නේදැ"යි ඇසීය.

27 පේතෘස් එවරද එය ප්‍රතික්ෂේප කළේය. එකෙණෙහිම කුකුළා හැඬලීය.

## රෝම ආණ්ඩුකාරයා ඉදිරිපිට

28 ඔවුහු යේසුස්වහන්සේ කායපස් වෙතින් රෝම ආණ්ඩුකාර මැදුර වෙත ගෙන ගියහ. ඒ හිමිදිරි උදයයි. ආණ්ඩුකාර මැදුරට ඇතුළු වුවහොත් යුදෙව් චාරිත්‍ර අනුව තමන් අපවිත්‍ර වන හෙයින් එසේ වුවහොත් තම ඕනෑකම ලෙස පාස්කු භෝජනය වැළඳීමට නොලැබෙතැයි සැලකූ යුදෙව්වෝ මැදුරට ඇතුළු නො වූහ.

29 එබැවින් ආණ්ඩුකාර පිලාත් ශාලාවෙන් පිටතට අවුත්, "මොහුට විරුද්ධව ඔබ ඉදිරිපත් කරන චෝදනා මොනවාදැ"යි ඔවුන්ගෙන් ඇසීය.

30 "මොහු අපරාධකාරයෙක් නො වේ නම්, ඔබතුමා ළඟට අප මොහු ගෙනෙන්නේ නැතැ"යි ඔවුහු පිළිතුරු දුන්හ.

31 එවිට පිලාත් ඔවුන්ට කථා කරමින්, "මොහු ගෙන ගොස් ඔබේ නීතියට අනුව ඔබම විනිශ්චය කරන්නැ"යි කී කල, යුදෙව්වෝ කරුණු දක්වමින්, "කිසිවකු මරණයට පමුණුවන්නට අපට බලයක් නැතැ"යි කීවෝය.

32 මෙසේ වුයේ තම මරණය සිදුවන ආකාරය ගැන යේසුස්වහන්සේ කී අනාවැකිය සැබෑ වනු පිණිසය.

33 එබැවින් පිලාත් යළි උසාවි ශාලාවට ඇතුල්ව, යේසුස්වහන්සේ කැඳවා, "යුෂ්මතා යුදෙව්වන්ගේ රජදැ"යි ඇසීය.

34 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "ඒක ඔබේම අදහසක්ද? නැතිනම් අන් කෙනෙක් මා ගැන ඔබට කී දෙයක්දැ"යි ඇසූ සේක.

35 "කිමද? මා යුදෙව්වෙක්දැ"යි ඊට පිළිතුරු දුන් පිලාත්, "යුෂ්මතා මා වෙත ගෙනාවේ ඔබේම මිනිස්සුයි: ඔබේම නායක පූජකයොයි. මොකක්ද යුෂ්මතා කළ වැරැද්ද"යි විමැසීය.

36 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මගේ රාජ්‍යය මෙලොවට අයිති එකක් නො වෙයි. මා මොලොවෙහි රජකු වුවා නම්, මගේ පරිවාර ජනයා මා අත්අඩංගුවට ගන්නට ඉඩ නො දී යුදෙව්වන් හා සටන් වදිනු ඇති. එනමුත් මාගේ රාජ්‍යය දැන් මෙලොවින් වුවක් නො වේයැ"යි කී සේක.

37 "ඕ! එහෙනම් ඔබ රජ කෙනෙක්!" යැයි පිලාත් කීවේය. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මා රජ කෙනෙකැයි කියන්නේ ඔබයි. මා ඉපැදුනේත්, මෙලොවට ආවේත් සත්‍ය හෙළිදරව් කරන්නටයි. සත්‍යයෙන් වූ හැම කෙනෙක්ම මට සවන් දෙති"යි පැවැසූ සේක.

38 "සත්‍යය? මොකක්ද ඒ?"යි පිලාත් විමසීය. ඒ සමඟම ඔහු යළිත් යුදෙව්වන් වෙත පිටතට ගොස් ඔවුන් අමතා, "මොහු අත කිසි වරදක් මට නම් නො පෙනේ.

39 එනමුත් ඔබේ සිරිත් විරිත් අනුව පාස්කුව නිමිත්තෙන් මා ඔබට එක් සිරකරුවකු නිදහස් කර දිය යුතු යි. හොඳයි, කොහොමද අදහස? මා ඔබට යුදෙව් රජ්ජුරුවන් නිදහස් කර දෙන්නදැ"යි ඇසීය.

40 "මේ මිනහා අපට එපා! අපට බරබ්බස් දුන මැනැවැ"යි ඔවුහු ගෝෂා කරන්නට වන්හ. ඒ බරබ්බස් ප්‍රසිද්ධ මංකොල්ලකරුවෙක් විය.

# 19

## කඹ ඇදිල්ලක්

1 එවිට පිලාත් යේසුස් වහන්සේට කසයෙන් තැලෙව්වේය.

2 හේවායෝ කටු ඔටුන්නක් ගොතා, එතුමන් හිස පළඳ, රාජවර්ණය වූ දම් පැහැති ලෝගුවක් සමච්චලය පිණිස හඳවා,

3 “යුදෙව් මහ රජ දිනේවා!”යි කියමින් නැවත නැවතත් එතුමන් වෙත පැමිණ එතුමන්ට අතුල් පහර දුන්හ.

4 නැවතත් පිටතට පැමිණි පිලාත් යුදෙව්වන් අමතා, “මෙන්න මා දැන් ඒ මනුෂ්‍යයා පිටතට ගෙනෙමි. එසේ ගෙනෙන්නේ මොහු අත කිසි වරදක් මට නො පෙනෙන බව ඔබ දැන ගන්නා පිණිසයැ”යි කීවේය.

5 එවිට කටු ඔටුන්න හා දම් පැහැති ලෝගුව සහිතව පිටතට ආ යේසුස්වහන්සේ පෙන්වූ පිලාත්, “මෙන්න ඒ මනුෂ්‍යයා”යි කීවේය.

6 නායක පූජකයෝ හා ඔවුන්ගේ මුර භටයෝ යේසුස්වහන්සේ දුටු ඇසිල්ලේම, “කුරුසියේ ඇණ ගසනු! කුරුසියේ ඇණ ගසනු!”යි මොර ගසන්නට වන්හ. එවි පිලාත් ඔවුන් අමතා, “නුඹලාම ගෙන ගොස් ඇණ ගසාපල්ලා, එසේ වුවත් මොහු අත කිසි වරදක් මට නම් හමු වුණේ නැතැ”යි කීවේය.

7 ඔහුට බල කරමින් කථා කළ යුදෙව්වෝ, “අපටත් නීතියක් තිබේ. ඒ නීතියේ හැටියට මොහු මරා දමන්නට ඕනැමයි. ඒ, දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි ඔය මිනිහා කියා ගත් බැවිනැ”යි කීවෝය.

8 ඒ වචන ඇසූ කල වඩාත් භයට පත් පිලාත්,

9 සභා ගැබට යළිත් පිවිස යේසුස්වහන්සේ අමතා, “යුෂ්මතා පැමිණියේ කොහෙන්දැ”යි ඇසීය. එහෙත් යේසුස්වහන්සේ කිසි උත්තරයක් නො දුන් සේක.

10 පිලාත් නැවත කථා කරමින්, “මට පිළිතුරු දෙන්නේ නැද්ද? යුෂ්මතා නිදහස් කරන්නටත්, කුරුසපත් කරන්නටත් මට බලය තිබෙන බව දන්නේ නැද්දැ”යි ඇසීය.

11 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, “ඉහළින්, එනම් දෙවියන්වහන්සේ ඇනුමැතිය දුන්නොත් මිස මට එරෙහිව ඔබට කිසි බලයක් නැත. එබැවින් ඔබ අතට මා පාවාදුන් තැනැත්තාගේ පාපය වඩාත් බරපතලයැ”යි කී සේක.

12 ඒ කීම නිසා යේසුස්වහන්සේ නිදහස් කරන්නට පිලාත් වෙර දැරීය. යුදෙව්වෝ දැඩි ලෙස ඊට විරෝධය පාමින්, “ඔබ මේ මිනිහා නිදහස් කළොත් ඔබ කරන්නේ සීසර් අධිරාජයාට ද්‍රෝහිකමක්. තමන් රජ කෙනෙකැයි කියා ගන්නා හැම කෙනෙක්ම අධිරාජයාගේ හතුරෙක්යැ’යි කියමින් ඝෝෂා කරන්නට වන්හ.

13 එබස් ඇසූ පිලාත්, යේසුස්වහන්සේ පිටතට පමුණුවා විනිශ්චය ආසනයේ හිඳ ගත්තේය. විනිශ්චය ආසනය වූයේ හේබ්‍රෙව් බසින් ගබ්බතා නමින් හැඳින්වෙන ශෛල වේදිකාව නම් ස්ථානයේය.

## විනිශ්චය හා කුරුසය

14 ඒ, සූදානම් වීමේ දවස වූ පාස්කුවට පෙර දින මද්දහනයි. පිලාත් යුදෙව්වන් අමතා, "මෙන්න ඔබේ රජ්ජුරුවෝ"යි කීවේය.

15 "ඔහු මරා දමනු! මරා දමනු! කුරුසියේ ඇණ ගසනු!"යි ඔවුහු මොර ගැසූහ. "මොනවා? ඔබේ රජ කුරුසියේ ඇණ ගසන්න!"යි පිලාත් ඇසීය. "සීසර් හැර වෙනත් රජෙක් අපට නැතැ"යි නායක පූජකයෝ පිළිතුරු දුන්හ.

16 අවසානයේදී පිලාත් යේසුස්වහන්සේ කුරුසියේ අණ ගසනු ලබනු පිණිස එතුමන් ඔවුන් අතට බාර දුන්නේය. ඔවුහු එතුමන් බාර ගෙන පිටතට ගෙන ගියහ.

17 එතුමාණෝ තමන්ගේම කුරුසිය කර තබා ගෙන (හේබ්‍රෙව් බසින් ගොල්ගොතා නමින් හැඳින්වෙන) කපාල පිටිය නම් ස්ථානය වෙත ගමන් ගත් සේක.

18 ඔවුහු එහිදී එතුමන් කුරුසියේ ඇණ ගැසූහ. යේසුස්වහන්සේ මැදිව සිටින සේ තවත් දෙදෙනෙක් එතුමන් දෙපසින් ඇණ ගැසුම් ලදහ.

19 "යුදෙව්වන්ගේ රජ වූ නාසරත්හි යේසුස්" යනුවෙන් ලියූ නාම පුවරුවක් පිලාත් විසින් එතුමන්ගේ කුරුසිය මත්තෙහි තබවන ලදි.

20 යේසුස්වහන්සේ කුරුස පත් කළ ස්ථානය නගරාසන්නයෙහි වූ බැවින්, හේබ්‍රෙව්, ලතින් හා ග්‍රීක් යන තෙබසින්ම ලියැවුණු එම නාමපුවරුව යුදෙව්වෝ විශාල සංඛ්‍යාවක්ම කියවූවෝය.

21 එබැවින් යුදෙව් නායක පූජකයෝ ඊට විරෝධය පාමින් පිලාත් හමු වී, "යුදෙව්වන්ගේ රජය, යනුවෙන් නො ලියා, යුදෙව් රජ මමය කියා මේ මිනිසා කියා ගත්තේය. යනුවෙන් ලියන්නැ"යි ඉල්ලා සිටියහ.

22 පිලාත් ඊට පිළිතුරු දෙමින්, "මා ලියූ දේ ලියූවාමයැ"යි කීවේය.

## ඓතිහාසික මොහොතක්

23 යේසුස්වහන්සේ කුරුසියේ ඇණ ගැසූ පසු හමුද භටයෝ, එතුමන්ගේ පිට ඇඳුම් ඩැහැගෙන එක් කෙනකුට කොටස බැගින් සතර කොටසකට බෙද ගත්හ. ඔවුහු එතුමන්ගේ කබායද ගත්හ. එම කබාය ඉහළ සිට පහළ දක්වා මුළුමනින්ම වියන ලද මූට්ටු රහිත එකකි.

24 ඔවුහු එකිනෙකා අමතමින්, "අපි මෙය ඉරන්නේ නැතිව වාසනාව කාටදැයි බලන්න දදු දමමු"යි කීහ. මෙසේ වූයේ, "ඔවුහු මගේ වස්ත්‍ර තමන් අතරේ බෙද ගෙන, මගේ කබාය සඳහා දදු දැමූහ"යි ලියැවුණු ශුද්ධ ලියවිල්ල සනාථ වනු පිණිසය. හමුද භටයින් කළේද එයමය.

25 යේසුස්වහන්සේගේ මෑණියන්, ඇගේ සෝවුරිය, ක්ලෝපාස්ගේ බිරිය වූ මරියා හා මග්දලා හි මරියා යන අය යේසුස්වහන්ගේ කුරුසිය පාමුල සිටියහ.

26 තමන් අසල මෑණියන්ද තමන් බෙහෙවින්ම ඇළුම් කළ ගෝලයාද, සිටිනු දුටු යේසුස්වහන්සේ මෑණියන් අමතා, "මැතිණියනි, මේ ඔබේ පුත්‍රයායැ"යි පවසා,

27 සිය ගෝලයා දෙසට හැරී, "මෙන්න ඔබේ මෑණියෝ"යි කී සේක. ඒ මොහොතේ පටන් ඔහු තම නිවසට ඇය පිළිගත්තේය.

28 ඉන් අනතුරුව, දැන් සියල්ල සම්පූර්ණව ඇති බැව් දත් යේසුස්වහන්සේ ශුද්ධ ලියවිල්ල සනාථ වනු පිණිස, "මට හරි පිපාසයැ"යි පැවසූ සේක.

29 ඇඹුල් මිදිසැර බඳුනක් එහි තිබිණි. එබැවින් ඔවුහු මුදු හත්තක් එහි බහා පොඟවා, හිසොප් දණ්ඩක එය අමුණා, එතුමන් මුවට ළං කළහ.

30 යේසුස්වහන්සේ එය දිව ගෑ පසු, "එය සම්පූර්ණ විණි"යි පවසමින් හිස පහත හෙළා ජීවිතය පූජා කළ සේක.

## අවසන් බුහුමන්

31 ඒ, සූදනම් වීමේ දවසය. අති විශේෂ සබත එළඹෙන්නට තිබුණේ ඊළඟ දිනදීය. (කුරුස පත්වූවන්ගේ) සිරුරු සබත් දිනයේදී කුරුසවල තිබීම යුදෙව්වන්ට නුවුමනා විණි. එබැවින් එදිනම මිය යන පිණිස ඔවුන්ගේ පා කෙණ්ඩා බිඳ මළ සිරුර ඉවත් කරවන ලෙස ඔවුහු පිලාත්ගෙන් ඉල්ලා සිටියහ.

32 එබැවින් එහි පැමිණි හේවායෝ යේසුස්වහන්සේ සමඟ ඇන ගසන ලද පළමුවැන්නාගේද අනතුරුව අනෙකාගේද පා කෙණ්ඩා බින්දේය.

33 එහෙත් ඔවුහු යේසුස්වහන්සේ අසලට ආ කල, එතුමාණන් ඒ වන විටත් මිය ගොස් සිටි බැවින් එතුමන්ගේ කෙණ්ඩා නො බින්දේය.

34 එසේ වුවත් එක් හේවායෙක් හෙල්ලයකින් එතුමන්ගේ ඇලයට ඇන්නේය. එසැණින්ම ලේත්, වතුරත් එතැනින් ගලා ආවේය.

35 ඒ ගැන සාක්ෂි දරන්නේ එය ස්වකීය ඇස්වලින් දුටු තැනැත්තාය. ඒ සාක්ෂිය සත්‍යය. තමන් පවසන්නේ සත්‍යය බව ඔහු දන්නා බැවින් ඔබත් විශ්වාස කරන පිණිස සැබෑ වූ ඒ සාක්ෂිය මෙසේ ලියැවේ.

36 මේ දේවල් සිදු වූයේ, 'එතුමාණන්ගේ එක ඇටයකුදු බිඳිනු නො ලැබේ.' යන ශුද්ධ ලියවිල්ල හා

37 "ඔවුන් තමන් විසින්ම ඇන, සිදුරු කරන ලද තැනැත්තා දෙස බලනු ඇත යන තවත් ශුද්ධ ලියවිලි පාඨයක් සානථ වනු පිණිසය.

38 ඉන්පසු යුදෙව්වන් කෙරෙහි වූ බිය නිසා රහසේ යේසුස්වහන්සේගේ ගෝලයකුව සිටි අරමාතියෙහි යෝසෙප් නමැත්තා පිලාත් වෙත ගොස්, යේසුස්වහන්සේට අවසන් බුහුමන් දක්වන්නට අවසර ලබා ගෙන විත් දේහය රැගෙන ගියේය.

39 ඉහත එක් රැයෙක යේසුස්වහන්සේ බැහැ දුටු නිකදේමුස් නමැත්තාද ඔහු සමඟ ආයේය. නිකදේමුස් පැමිණියේ සුවඳ ද්‍රව්‍ය හා අගිල් කිලෝ ග්‍රෑම් 30 ක් පමණ රැගෙනය.

40 ඔවුහු දෙදෙන යුදු සිරිත ලෙස සුවඳ ද්‍රව්‍ය සමඟ සිහින් හණ රෙදිවලින් යේසුස්වහන්සේගේ දේහය ඔතා භූමදානය සඳහා සූදනම් කළහ.

41 යේසුස්වහන්සේ කුරුසපත් කළ ස්ථානය අසල උයනක් තිබිණි. ඒ උයනෙහි එතෙක් කිසිවකු තැන්පත් නොකරන ලද අලුත් සොහොන් ලෙනක් තිබිණි.

42 එය යුදෙව්වන්ගේ සූදනම් වීමේ දවස බැවින් භූමදනය ඉක්මන් කළ යුතු විණි. එසේම, සොහොන් ගෙයද අත නුදුරින්ම වූ බැවින් ඔවුහු යේසුස්වහන්සේ එහි තැන්පත් කළහ.

# 20

## හිස් වූ සොහොන

1 සතියේ පළමු දින හිමිදිරියේ මද අඳුරේම සොහොන වෙත පැමිණි මග්දලා හි මරියා සොහොන් ලෙනෙහි දොර ඇවුරුණු ගල ඉවතට පෙරළා තිබෙනු දැක,

2 සීමොන් පේතෘස් හා යේසුස්වහන්සේ ප්‍රේම කළ අනෙක් ගෝලයා වෙත වහා දිව ගොස්, "අහෝ! ඔවුන් ස්වාමින්වහන්සේ සොහොනෙන් අරන් ගොසින්, ඔවුන් එතුමන් කොහේ තැබුවාද වත් අප දන්නේ නැතැ"යි කීවාය.

3 ඒ ඇසූ පේතෘස් හා අනෙක් ගෝලයා සොහොන වෙත දුවන්නට වන්හ.

4 එසේ දෙදෙනාම එක්ව දිවූ නමුත් පේතෘස් පසු කරමින් වඩා වේගයෙන් දිවූ අනෙක් ගෝලයා සොහොන වෙත මුලින්ම පැමිණ,

5 ලෙස තුළට එබී බලා, එහි වූ මිනී ඔතන සිහින් වෙළුම් දුටු නමුත් ලෙන තුලට පා නො තැබීය.

6 අනතුරුව ඔහුට පිටුපසින් පැමිණි පේතෘස් කෙළින්ම ලෙන තුළට ඇතුල්ව, එහි වූ හණ වෙළුම් පටිද

7 යේසුස්වහන්සේගේ හිස දවටා තිබූ රෙදි කඩද දිටීය. එම රෙදි කඩ හණ වෙළුම් පටිවලින් වෙන්ව වෙනම නවා අන් තැනක තබා තිබිණි.

8 එකල, සොහොන වෙත පළමුව ආ ගෝලයාද ලෙන තුළට ඇතුල්ව, දැක විශ්වාස කළේය.

9 එතුමන් මරණින් යළි නැගී සිටිය යුතු බවට ඇති ශුද්ධ ලියවිලි ඒ වන තුරුත් ඔවුන් වටහා ගෙන සිටියේ නැත.

## මරියාගේ විශ්මය

10 අනතුරුව ගෝලයෝ සිය නිවෙස්වලට ගියහ.

11 එහෙත් මරියා සොහොන් ලෙන් දොරකඩට වී හඬමින් සිටියාය. මරියා මෙසේ හඬමින්ම සොහොන් ලෙන තුළට එබී බැලූ කල,

12 යේසුස්වහන්සේගේ දේහයේ හිස සහ පාද තිබූ දෙපොලෙහි සුදු වතින් සැරැසුණු දේව දූතයින් දෙදෙනකු හිඳ සිටිනු දුටුවාය.

13 "ළඳුනි, කුමක් නිසා ඔබ හඬනවාදැ"යි ඔවුහු ඇගෙන් විචාළහ. මරියා පිළිතුරු දෙමින්, "ඔවුන් මගේ ස්වාමින්වහන්සේ කොහිදේ ගෙන ගොහින්, ඔවුන් එතුමන් කොහේ තැබුවාද කියා මා දන්නේ නැතැ"යි කීවාය.

14 මෙසේ කියා ආපසු හැරුණු කල, යේසුස්වහන්සේ එතැන සිටිනු ඕ දුටු නමුත්, ඒ යේසුස්වහන්සේ බව නො දත්තිය.

15 යේසුස්වහන්සේ ඇය අමතා, "ඔබ හඬන්නේ කුමක් නිසාද? ඔබ සොයන්නේ කවරකුදැ"යි ඇසූ සේක. ඒ උයන්පල්ලා යැයි සිතූ ඕ එතුමන් අමතා, "මහත්මයා, අනේ එතුමන් ගෙන ගියේ ඔබ නම්, කරුණාකර එතුමන් තැබුවේ කොතැනකදැයි මට කියන්න. මා එතුමන් ගෙන යන්නම්"යයි කීවාය.

16 "මරියා!"යි යේසුස්වහන්සේ ඇය ඇමතූ සේක. වහා ආපසු හැරුණු මරියා, "රබ්බෝනි!"යි කෑ ගැසුවාය. (රබ්බෝනි යන්න හේබ්‍රෙව් බසින් ගුරුතුමනි යන්නයි)

17 යේසුස්වහන්සේ ඇයට කථා කොට, "මා තවමත් පියාණන්වහන්සේ වෙත නො නැංග නිසා මට අත නො තබන්න. එනමුත් මගේ සොහොයුරන් වෙත ගොස්, මම, මගේ පියාණන් හා ඔබේ පියාණන්ද මගේ දෙවියන්වහන්සේ හා ඔබේ දෙවියන්වහන්සේද වෙත නැඟෙන්නේමියි ඔවුන්ට දන්වන්නැ"යි පැවැසූ සේක.

18 ගෝලයන් වෙත ගිය මග්දලාහි මරියා, "මම ස්වාමින්වහන්සේ දිටිමි"යි පවසා එතුමන් ඇයට කී දේ ඔවුන්ට දැන්වූවාය.

## ගෝලයින්ගේ ප්‍රීතිය

19 සතියේ පළමු දින වූ එදිනම සවස ගෝලයෝ, යුදෙව්වන්ට බියෙන් කාමරයකට වී දොරගුළු ලා ගෙන සිටියහ. යේසුස්වහන්සේ හදිසියේම ඔවුන් මැද සිට, "ඔබට ශාන්ති වේවා!"යි ශුභ පැතූ සේක.

20 එසේ පැවැසූ එතුමාණෝ තුවාල ලත් සිය අත් හා ඇලය ඔවුන්ට පෙන්වූ සේක. තමන්ගේ ස්වාමින්වහන්සේ දුටු ගෝලයෝ ප්‍රීතියෙන් ඉපිල ගියෝය.

21 "ඔබට ශාන්ති වේවා!"යි නැවතත් පැවැසූ යේසුස්වහන්සේ, "පියාණන්වහන්සේ මා එවූ ලෙසම මමත් ඔබ යවන්නෙමි"යි පැවසූ සේක.

22 එසේ පවසා ඉන් අනතුරුව ඔවුන් පිට හුස්ම හෙලූ එතුමාණෝ, "ශුද්ධාත්මයාණන් පිළිගන්නැ"යි පවසා,

23 "ඔබ යම් කෙනකුට පාප කමාව ප්‍රකාශ කරන්නේ නම් ඒ පාප කමා කරනු ලබන්නේය. ඔබ යම් කෙනකුට පාප කමාව ප්‍රකශ කරන්නේ නම් ඒ පාප කමා කරනු නො ලබන්නේයැ"යි ද පැවැසූ සේක.

24 යේසුස්වහන්සේ මෙසේ සිය ගෝලයින් වෙත ආ කල දොළොස් දෙනාගෙන් කෙනකු වූ නිවුන්නා නම් ලත් තෝමස් ඔවුන් සමඟ නො විය.

25 එබැවින් සෙසු ගෝලයෝ, "අපි ස්වාමින්වහන්සේ දුටුවෙමු"යි පැවසූ කල, ඔහු සිය අදහස් දක්වමින්, "එතුමන්ගේ අත්වල ඇණ කැළැල් දැක, ඒ සිදුරුවල මගේ ඇඟිල්ල දමා, එතුමන්ගේ ඇලයෙහි මගේ අත දැමූවොත් මිස මා නම් විශ්වාස කරන්නේ නැතැ"යි පැවසීය.

26 මින් අට දිනකට පසු ගෝලයෝ නැවතත් නිවෙස තුළට වී සිටියහ. මෙවර තෝමස්ද ඔවුන්'තර විය. දොරගුළු ලා තිබූ නමුත් යේසුස්වහන්සේ විත්, ඔවුන් මැද, සිට, "ඔබට ශාන්ති වේවා!"යි පැවසූ සේක.

27 ඉන්පසු තෝමස් ඇමතූ එතුමාණෝ, "ඔබේ ඇඟිල්ල මෙහි බහා මගේ අත් දිහා බලන්න. ඔබේ අත දිගු කර මගේ ඇලයෙහි තබන්න. සැක නො කොට විශ්වාස කරන්නැ"යි කී සේක.

28 එවිට තෝමස්, "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනි!"යි එතුමන් ඇමතුවේය.

29 යේසුස්වහන්සේ ඔහු අමතමින්, "ඔබ විශ්වාස කළේ මා දුටු නිසයි. එනමුත් නො දැක විශ්වාස කරන්නෝ ආශිර්වාද ලද්දේයැ"යි පැවසූ සේක.

### මෙම සුබ අස්නෙහි අරමුණ

30 මෙහි සඳහන් නොකරන ලද තවත් අපමණ අනුහස් ලකුණු යේසුස්වහන්සේ සිය ගෝලයින් ඉදිරියෙහි පෑ සේක.

31 එනමුත් මෙහි සඳහන් දෑ ලියන ලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේම බව ඔබ සැම විශ්වාස කරන පිණිසත්, එසේ අදහා ගැනීම මඟින් අමාමහ ජීවනය අත්පත් කර ගන්නා පිණිසත්ය.

21

## අවසන් හමුවීම

1 ඉන්පසු යේසුස්වහන්සේ තිබේරියස් මුහුද අද්දරදී සිය ගෝලයිනට දර්ශන වූ සේක. එය සිදු වූයේ මෙසේය.

2 සීමොන් පේතෘස්ද නිවුන්නා නම් ලත් තෝමස්ද ගලීලයේ කානාහි නතානියෙල්ද සෙබදීගේ පුත්‍රයන් වූ යාකොබ් හා යොහන්ද තවත් ගෝලයන් දෙදෙනෙක්ද එක්ව සිටියදී,

3 සීමොන් පේතෘස් ඔවුන් අමතා, “මම මසුන් මරන්නට මුදු යන්නෙමි”යි කීවේය. “අපිත් ඔබ සමඟ එන්නෙමු”යි ඔවුහුද කීවෝය. එබැවින් ඔවුහු පිටත්ව ගොස්, ඔරුවක නැඟී දියඹට ගිය නමුදු ඒ රැයේ එක මසකුවත් අල්ලා ගන්නට අපොහොසත් වූහ.

4 අළුයම් උදයෙහි යේසුස්වහන්සේ වෙරළෙහි සිටි නමුදු, ගෝලයෝ එතුමන් හැඳින නො ගත්හ.

5 යේසුස්වහන්සේ ඔවුන් අමතා, “දරුවනි, ඔබට මසුන් හසු වුණේ නැද්දැ”යි ඇසූ සේක. “නැතැ”යි ඔවුහු පිළිතුරු දුන්හ.

6 “හොඳයි, ඔරුවේ දකුණු පැත්තෙන් දැල් දමන්න. එවිට හසුවේවි”යි එතුමෝ ඔවුන්ට උපදෙස් දුන් සේක. ඔවුහු එසේ දැල් හෙලූ කල, දැල ඇදගන්නට බැරි තරමින් අධිකව මසුන් තොගයක්ම හසු විණි.

7 එවිට යේසුස්වහන්සේ බෙහෙවින් ඇලුම් කළ ගෝලයා පේතෘස්ට කථා කොට, “ඒ ස්වාමින්වහන්සේයැ”යි කීවේය. ඒ ස්වාමින්වහන්සේය යන වචනය ඇසූ කෙණෙහිම, ගලවා දමා තිබූ කබාය වහා හැඳගත් සීමොන් පේතෘස් දියට පැන්නේය.

8 එහෙත් ඔවුන් සිටියේ වෙරළට මීටර් 100 ක් පමණ නුදුරින් බැවින් අනෙක් ගෝලයෝ මසුන්ගෙන් යුත් දැලද ඇදගෙන ඔරුවෙන්ම ආහ.

9 මෙසේ ගොඩට ආ කල රොටිද දැවෙමින් තිබූ අඟුරු මත මසුන්ද තිබෙනු ඔවුහු දුටහ.

10 යේසුස්වහන්සේ ඔවුන් අමතා, “ඔබ දැන් ඇල්ලූ මාළු ටිකකුත් ගෙනෙන්නැ”යි කී සේක.

11 සීමොන් පේතෘස් ඔරුවට පැන නැඟී දැල ගොඩට ඇද්දේය. ලොකු මසුන් 153 දෙනකුම හසුව සිටියද දැල ඉරී තිබුණේ නැත.

12 “එන්න, ඇවිත් කන්නැ”යි යේසුස්වහන්සේ ඔවුන්ට ඇරයුම් කළ සේක. “ඔබ කවුරුදැ”යි එතුමන්ගෙන් අසන්නට තරම් එක් ගෝලයකුටවත් ධෛර්යය නො තිබිණි. ඒ ස්වාමින්වහන්සේ බව ඔවුන් හොඳින්ම දැන සිටියහ.

13 යේසුස්වහන්සේ පැමිණ රොටි ගෙන ඔවුනට බෙදා දුන් සේක. එසේම මාළු ද බෙදා දුන් සේක.

14 යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැඟිටි පසු සිය ගෝලයනට දර්ශන වූ තුන් වන අවස්ථාව මෙය විය.

## යේසුස්වහන්සේ හා පේතෘස්

15 ඔවුන් ආහාර ගත් පසු සීමොන් පේතෘස් ඇමැතූ යේසුස්වහන්සේ, "සීමොන් යොහන්ගේ පුත්‍රය, මේ අයට වඩා ඔබ මට ප්‍රේම කරනවාදැ"යි ඇසූ සේක. ඔහු පිළිතුරු දෙමින්, "එහෙමයි ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේකැ"යි කීවේය. "මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ"යි යේසුස්වහන්සේ ඔහුට පැවසූ සේක.

16 යේසුස්වහන්සේ දෙවන වරටත් ඔහු අමතා, "සීමොන්, යොහන්ගේ පුත්‍රය, ඔබ මට ප්‍රේම කරනවාදැ"යි ඇසූ සේක. ඔහුද පිළිතුරු දෙමින්, "එහෙමයි ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේකැ"යි පැවැසිය. "මාගේ බැටළුවන් රැකබලා ගන්නැ"යි යේසුස්වහන්සේ ඔහුට පැවැසූ සේක.

17 එතුමාණෝ තුන්වන වරටත් ඔහු අමතා, "සීමොන් යොහන්ගේ පුත්‍රය, ඔබ මට සැබැවින්ම ප්‍රේම කරනවාදැ"යි ඇසූ සේක. යේසුස්වහන්සේ තුන්වන වරටත් 'ඔබ මට ප්‍රේම කරනවාදැ"යි ඇසූ බැවින් පේතෘස්ගේ සිත රිදිණි. ඔහු එතුමන් අමතා, "ස්වාමිනි ඔබතුමා හැම දෙයක්ම දන්නා සේක. මා ඔබට ප්‍රේම කරන බව ඔබතුමා හොඳින්ම දන්නා සේකැ"යි කීවේය. යේසුස්වහන්සේ ඔහුට කථා කොට, "මාගේ බැටළුවන් පෝෂණය කරන්න.

18 සත්තකින්ම මම ඔබට කියන්නම්, තරුණ වයසේදී ඔබේම කැමැත්ත ලෙස හැඳ පැළැඳ, ඔබ කැමති තැන්හි ඇවිද්ද නමුත් මහළු විය පැමිණි කල ඔබ ඔබේ අත් දිගු කරනු ඇත. එවිට වෙනත් කෙනෙක් ඔබ හඳවා, ඔබ අකමැති තැනකට ඔබ ගෙනයනු ඇතැ"යි කී සේක.

19 යේසුස්වහන්සේ මෙසේ කීවේ, පේතෘස් කෙබඳු ආකාරයේ මරණයකින් දෙවියන්වහන්සේට ගෞරවය ගෙන දෙන්නේද යන්න ඔහුට වටහා දෙමිනි. යළි ඔහු ඇමතූ යේසුස්වහන්සේ "මා අනුගමනය කරන්නැයි"යි කී සේක.

## හිතාදර ගෝලයා

20 පේතෘස් ආපසු හැරී බැලූ කල, යේසුස්වහන්සේ බෙහෙවින් ඇලුම් කළ ගෝලයාද (රාත්‍රී භෝජන සංග්‍රහයේදී යේසුස්වහන්සේ වෙත නැඹුරුව, "ස්වාමිනි ඔබ තුමන් පාවා දෙනු ලබන්නේ කවරකු විසින්දැ"යි ඇසුවේ මොහුය.) ඔවුන් පසු පසින් එනු දැක.

21 "ස්වාමිනි, මොහු ගැන ඔබ කියන්නේ කුමක්දැ"යි ඇසීය.

22 යේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මා ආපසු එනතුරු ඔහු නැවතී හිඳීම මගේ කැමැත්ත නම් ඒ ගැන ඔබට කිමද? ඔබ මා අනුගමනය කරන්නැ"යි කී සේක.

23 ඒ කීම නිසා ඒ ගෝලයා නොමැරෙන්නේය යන රාවයක් සහෝදරයන් අතර පතළව ගියේය. එසේ වුවද යේසුස්වහන්සේ, මා ආපසු එනතුරු ඔහු නැවතී හිඳීම මගේ කැමැත් නම් ඒ ගැන ඔබට කිමද?'යි කීවා මිස ඔහු නො මැරෙන්නේ යැ"යි නො කී සේක.

24 මෙම කරුණු ලියා සාක්ෂි දරන ගෝලයා ඔහුය ඔහුගේ සාක්ෂිය සත්‍යය බව අපි දනිමු.

25 යේසුස්වහන්සේ මෙලෙසම කළ දේ අපමණය. ඒවා එකින් එක ලියන ලද්දේ නම් එසේ ලියනු ලබන පොත් දරන්නට මුළු ලෝකයම වුවත් තරම් නො වේ යයි මට සිතේ.